

# පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය

එම්.කේ. නදීකා දමයන්ති
එස්.ඩබ්.ජී.කේ. බුලංකුලම





633.18:658.8
(SL)
HEC

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.

2009/06
2010/04

# පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය

**එම්.කේ. නදීකා දමයන්ති**

**එස්.ඩබ්.පී.කේ. බුලංකුලම**

සිංහල පර්යේෂණ අධ්‍යයන මාලා අංක : 41

2006 පෙබරවාරි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.



22213

පුස්තකාලය
LIBRARY

22213

ප්‍රථම මුද්‍රණය : 2006

© හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
සියළු හිමිකම් ඇවිරිණි.

**ISBN : 955-612-068-8**

කවර නිර්මාණය : රාජිකා ශ්‍යාමලී රණසිංහ, හෙ.කො.ගො.ප.පු ආයතනය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ මුළු වගා බිම් ප්‍රමාණයෙන් යල, මහ දෙකන්නය ඇතුළත්ව, 42%ක පමණ සිදු කෙරෙන වී වගාව මෙරට කෘෂිකාර්මාන්තයෙහි මූලික ස්ථානයක් හිමි කරගෙන ඇත්තා සේම වී අලෙවිය පිළිබඳ ගැටළුව ද මෙරට කෘෂි අංශයේ ප්‍රමුඛ ගැටළුවක් බවට පත්ව ඇත. ආර්ථික, සමාජයීය මෙන්ම දේශපාලන අංශවලට ද බලපෑමක් කිරීමේ හැකියාවෙන් යුක්ත මෙම ගැටළුව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මෙන්ම දේශපාලන විධායකයේ ද අවධානයට ලක්ව ඇති බව කෘෂිකාර්මික අංශයට සම්බන්ධ මෑත කාලීන රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණයේ දිශානතිය දෙස බැලීමේදී පැහැදිලි වන්නකි.

ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15%ට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවින්, වී එකතුකිරීමේ නිරත අතරමැදි වෙළෙඳුන් සහ වී මෝල් හිමියන් ඇතුළු වී අලෙවියට සම්බන්ධ පාර්ශවයන් සම්බන්ධ කරගනිමින් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය අනුග්‍රහය මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2003/2004 වර්ෂයේ සිදු කෙරුණු පර්යේෂණයෙන් හෙළි කරගත් තොරතුරු මෙම වාර්තාවෙන් එළි දැක්වේ.

මෙම වාර්තාව තුළ වී අලෙවියට සම්බන්ධ ප්‍රධාන පාර්ශවයන් වන ගොවීන්, වී එකතු කිරීමේ නිරත අතරමැදි වෙළෙඳුන් සහ වී මෝල් හිමියන්ගේ සමාජ, ආර්ථික පසුබිම, වෙළෙඳපොළ සඳහා වන වී අතිරික්තය, වී/ සහල් අලෙවි මාර්ග සහ ප්‍රමාණයන්, වී මිල කෙරෙහි බලපානු ලබන සාධක, වී අලෙවියට සම්බන්ධ එක් එක් පාර්ශවයන් වී අලෙවියේදී මුහුණ දෙනු ලබන ගැටළු සහ දුෂ්කරතා, එම ගැටළු මග හරවා ගැනීම සඳහා ඒ ඒ පාර්ශවයන් විසින් ඉදිරිපත් කළ යෝජනා ආදිය අන්තර්ගත වී ඇත. වීවල ගුණාත්මක තත්ත්වය, නිෂ්පාදන ප්‍රමාණය සහ වී අලෙවිය සිදු කරන කාල සීමාව, වගාවන් සඳහා ලබා ගන්නා ණය ප්‍රමාණය සහ මූලාශ්‍රය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල කෙරෙහි බලපානු ලබන ප්‍රධාන සාධක වශයෙන් මෙම පර්යේෂණය තුළින් හඳුනාගෙන ඇත. මෙම පර්යේෂණ වාර්තාව තුළින් හෙළිකරන තොරතුරු ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධ අධ්‍යයන කටයුතුවල නිරතවූවන්ගේ මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කටයුතු සඳහා ද පිටිවහලක් වනු ඇත.

අවසාන වශයෙන්, කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇති වී අලෙවි ගැටළුව පිළිබඳ අධ්‍යයනය කළ එම්.කේ.නදීකා දමයන්ති මෙනෙවිය සහ එස්.ඩබ්.පී.කේ.බුලංකුලම මහත්මිය ඇතුළු අධ්‍යයන කණ්ඩායම ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වී.කේ.නානායක්කාර
අධ්‍යක්ෂ
2006.02.28

# ස්තුතිය

මෙම අධ්‍යයනය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය සැපයූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ විධායක අධ්‍යක්ෂ මහාචාර්ය එච්.පී.එම්.ගුණසේන මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මෙවන් පර්යේෂණ කටයුත්තක් සඳහා අප පෙළඹවූ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය එම්.ඕ.ඒ. ද සොයිසා මහතාට, පර්යේෂණ වාර්තාව පළකිරීමට උනන්දු කළ සහ ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දුන් වර්තමාන අධ්‍යක්ෂ වී.කේ. නානායක්කාර මහතාට සහ අධ්‍යයන පරිපාලන කටයුතුවලදී සහාය දැක්වූ නියෝජ්‍ය අධ්‍යක්ෂක (පර්යේෂණ) ආචාර්ය ඩබ්.පී. ජයසේන මහතාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පිරිණැමේ. එමෙන්ම පර්යේෂණ යෝජනාව සකස් කිරීමේ සිට ක්ෂේත්‍ර සමීක්ෂණය දක්වා මාර්ගෝපදේශකත්වය සැපයීමෙන් නොනැවතී ආචාර්ය උපාධිය සඳහා ආයතනයෙන් නිවාඩු ලබා සිටින මොහොතක වුව තම කාලය කැප කරමින් වාර්තා පිටපත කියවා උපදෙස් ලබා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධිපර්යේෂක එල්.පී.රූපසේන මහතාට අපගේ විශේෂ ස්තුතිය පිරිණැමේ. එමෙන්ම තම කාලය මිඩංගු කරමින් පර්යේෂණ වාර්තා පිටපත කියවා උපදෙස් ලබාදුන් අධිපර්යේෂක ආචාර්ය පී.එම්. හේනේගෙදර මහතාට සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මියටත් විවිධ අයුරින් සහාය දැක්වූ වාරි හා ජල කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය ඩබ්.එම්.පී.බී. ගිරාගම මහතාටත් අපගේ ස්තුතිය පිරිණැමේ.

තම වටිනා කාලය කැප කරමින් අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාදුන් සියලුම දෙනාටත්, ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීමේ කටයුතු සිදුකළ පර්යේෂණ සහකාරවරුන් වූ තිස්ස දිසානායක, සංජීව කොඩිතුවක්කු, දීප්ත කුමාර, මංජුල සුදර්ශන සහ නිමාලි කෞශල්‍යා මහත්ම මහත්මීන්ටත්, එම කටයුතුවලදී සහාය දැක්වූ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතාටත් අපගේ ස්තුතිය පිරිණැමේ.

දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකළ සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකයේ එම්.ඩී.එල්.සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වාර්තා පිටපත පරිගණක ගතකිරීමේ කටයුතුවලදී සහාය වූ පී.එම්. විජිතා පද්මිණි මහත්මියටත්, වාර්තාවේ අවසන් පිටපත සකස් කිරීමෙන් සහ පිටකවරය නිර්මාණය කිරීමෙන් සහාය වූ රාජිකා ශ්‍යාමලී මෙනෙවියටත්, වාර්තා පිටපත කියවා භාෂා නිරවද්‍යතාව පිළිබඳ උපදෙස් ලබා දුන් පර්යේෂණ නිලධාරිණී සුසිලා ලුර්දු මහත්මියට සහ ප්‍රකාශන නිලධාරිණී සුභාෂිණී රාජපක්ෂ මහත්මියටත්, වාර්තාව මුද්‍රණය කිරීමේ කටයුතු සිදුකළ ප්‍රකාශන අංශයේ වැඩ බලන අංශ ප්‍රධාන එස්. රාමේශ්වරන් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නන් අයුරින් සහාය දැක්වූ සියලු දෙනාටත් අපගේ ස්තුතිය පිරිණැමේ.

එම්.කේ. නදීකා දමයන්ති
එස්.ඩබ්.පී.කේ. බුලන්කුලම

## සංක්ෂේපය


යල, මහ දෙකන්නය ඇතුළත්ව ශ්‍රී ලංකාවේ මුළු වගා බිම්වලින් 42%ක් පමණ ආවරණය කරන වී වගාවේ දෙවැනි ප්‍රධානම දිස්ත්‍රික්කය වන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයයි. ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15%කට ආසන්න ප්‍රමාණයක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ නිෂ්පාදනය කෙරෙන අතර විශේෂයෙන්ම අස්වනු නෙළන කාලය ආශ්‍රිතව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ ගැටළු මතුවේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙළෙඳපොළ සඳහා වන වී අතිරික්තය ඇස්තමේන්තු කිරීම, වී අලෙවි ක්‍රියාදාමය තුළ වී ගොවීන්, වී මිලට ගැනීමේ නිරත අතරමැදි වෙළෙඳුන් සහ වී මෝල් හිමියන් මුහුණපානු ලබන ගැටළු හඳුනාගැනීම, ගොවීන්ගේ වී අලෙවි කිරීමේ රටාව හඳුනා ගැනීම සහ වී මිලට ගන්නා ව්‍යාපාරිකයන් අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු විය. 2002/2003 මහ කන්නයත් 2003 යල කන්නයත් ආශ්‍රිතව අධ්‍යයනය සිදු කෙරිණි. ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම් වූ මෙම. අධ්‍යයනයේ ප්‍රාථමික දත්ත රැස්කිරීමේදී ප්‍රශ්නාවලි භාවිතා කෙරිණි. එයට අමතරව සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මාර්ගයෙන් ලබාගත් තොරතුරු ද ද්විතියික මූලාශ්‍ර මගින් ලබාගත් තොරතුරු ද භාවිතා කෙරිණි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයම නියෝජනය වන පරිදි මැදිරිගිරිය (බේබියාවැව සහ දියසෙන්පුර ග්‍රාම නිලධාරී වසම්), මනම්පිටිය (අසේලපුර සහ වීරාන ග්‍රාම නිලධාරී වසම්), හිඟුරක්ගොඩ (අක්කර හැත්තෑව සහ හිඟුරක බණ්ඩාරගම ග්‍රාම නිලධාරී වසම්), සේවාගම (ලක්ෂ උයන සහ සිංහරාජපුර ග්‍රාම නිලධාරී වසම්),සහ ඇලහැර-බකමූණ (ඉකිරිවැව සහ අතරගල්ලෑව ග්‍රාම නිලධාරී වසම්) ගොවිජන සේවා බලප්‍රදේශ තුළ අධ්‍යයනය සිදු කෙරිණි. මෙම අධ්‍යයනයේදී කුඹුරු ඉඩම් නාමලේඛනය ආශ්‍රිතව (අක්කර 5,3,21/2,2,1) අහඹු ලෙස තෝරා ගත් ගොවීන් 500ක්, වී මිලට ගැනීමේ නිරත අතරමැදි වෙළෙඳුන් 38ක් සහ වී මෝල් හිමියන් 38ක් සමීක්ෂණයට ලක්කෙරිණි. අධ්‍යයනයේ තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන ක්‍රමවේදය ප්‍රශ්නාවලි මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම වූ අතර එයට අමතරව සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මගින් ලබාගත් තොරතුරු ද අධ්‍යයනය සඳහා භාවිතා කරන ලදී.

ගොවීන් රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට ද වී අලෙවි කිරීම සිදු කරන නමුත් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ප්‍රවාහනය සහ නාට්ටාමි කුලී සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම (24.6%), අලෙවි කරගැනීමේ ප්‍රමාදයන් (48.0%), ඇසුරුම් මලු නැවත නොලැබීම (43.8%), මුදල් ලැබීමේ ප්‍රමාදය (66.2%), නිලධාරීන් විසින් සිදුකරන විවිධ අක්‍රමිකතාවන්ට මුහුණ දීමට සිදුවීම (24.4%) ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම (86%), ආදී ගැටළුවලට ගොවීන්ගෙන් 95%කට මුහුණදීමට සිදු වේ. පෞද්ගලික අංශයට වී අලෙවියේදී අඩු මිලක් ලැබීම (76.8%), කිරුම් මිනුම් වංචනික ආකාරයට සිදු කිරීම (17.6%) ආදී ගැටළුවලට ගොවීන්ගෙන් 85% ක් මුහුණදෙනු ලබයි. වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම (92.1%,92.1%), ව්‍යාපාරය සඳහා යෙදවීමට අවශ්‍ය මුදල් නොමැතිවීම (55.3%, 42.1%), ගබඩා පහසුකම් හිඟය (15.8%,13.2%) ආදී ගැටළුවලට මුහුණදෙනු ලබයි.

ගොවීන්ගෙන් 98%ක් වී ඇසුරුම් කිරීම සඳහා හිස් පොහොර මලු යොදා ගන්නා නමුත් රු.15ත් 20 ත් අතර මිලකට ලබාගන්නා එම ඇසුරුම් මලු උපරිම වශයෙන් කන්න දෙකකට වඩා භාවිතා කිරීමට නොහැකිවීම ගොවීන් මුහුණදෙන ප්‍රධාන ගැටළුවකි. එමෙන්ම කුලියට වී ප්‍රවාහනය කිරීමේදී කි.මී. එකක දුරක් වී මල්ලක් ප්‍රවාහනය කිරීම සඳහා රු.10ත් 12ත් අතර මුදලක් වැය කිරීමට සිදුවීම ද ප්‍රධාන ගැටළුවකි. ගොවීන්ගේ වී මිල පහළ යාම සඳහා බලපා ඇති සාධක අතර අස්වනු නෙළූ විගස වී අලෙවිය (ගොවීන්ගෙන් 66%ක්) නගරයෙන් වන දුරස්ථභාවය සහ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, ප්‍රවාහනය සම්බන්ධ ගැටළු, වී අලෙවි කරන ස්ථානයේ ස්වරූපය (කමත, ගොවි නිවස, වෙළඳ මධ්‍යස්ථානය, වී මෝල) ණය ලබාගෙන තිබීම, ගුණාත්මක තත්ත්වය යන සාධක දැඩිව බලපෑම් කරනු ලබයි. මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශය (එගොඩ පත්තුව) සහ මැදිරිගිරිය ගොවි ජන සේවා බල ප්‍රදේශයේ බේබියාවැව ප්‍රදේශවල වී ගුණාත්මක තත්ත්වයෙන් අඩු මට්ටමක පැවතීම (කළු පුල්ලි සහිත දිලීර රෝගයට බඳුන් වීම, වීවල වර්ණය අවපැහැ වීම, අසම්පූර්ණ වී ඇට නිෂ්පාදනය, ගල් වැලි මුසුවීම) නිසා එම ප්‍රදේශවල වී සඳහා සාපේක්ෂව හිමිවන්නේ පහළ මිලකි.

ගොවීහු පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී පෞද්ගලික හිතවත්කම්, වගාවන් සඳහා අවශ්‍ය ණය ලබාගෙන තිබීම ආදී සාධක සැලකිල්ලට ගනු ලබන අතර කමතේදී වී අලෙවි කිරීමෙන් වී කිලෝ ග්‍රෑමයක් සඳහා ලැබෙන මුදල් ප්‍රමාණය අඩු වුව ද ප්‍රවාහන හා ඇසුරුම් වියදම් දැරීමට සිදු නොවීමත් රාජ්‍ය අංශයට වී අලෙවියේදී මෙන් ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා නොකිරීමත් මත කමතේදී සාපේක්ෂව අඩු මිලකට හෝ වී අලෙවි කිරීමට පෙළැඹෙති.

**පටුන** iii
පෙරවදන iv
ස්තුතිය v
සංක්ෂේපය vi
පටුන vii
සංඛ්‍යා සටහන් vii
ප්‍රස්තාර/ රූ සටහන් viii
සිතියම් viii

**01. හැඳින්වීම** 01-06
1.1 අධ්‍යයනයේ වැදගත්කම 1
1.2 පූර්ව පර්යේෂණ විමර්ශන 2
1.3 අධ්‍යයන ගැටළුව සහ අරමුණු 3
1.4 පර්යේෂණ ක්‍රමවේදය 3
1.5 අධ්‍යයනයේ සීමා 5
1.6 වාර්තාවේ සැකැස්ම 5

**02. අධ්‍යයන ප්‍රදේශය සහ අධ්‍යයනයට ලක්වූවන්ගේ සමාජ ආර්ථික පසුබිම** 07-12
2.1 හැඳින්වීම 7
2.2 අධ්‍යයනය සිදුකළ ප්‍රදේශයේ භූගෝලීය ස්වභාවය 7
2.3 නියැදියේ සමාජ ආර්ථික පසුබිම 8
2.3.1 අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගේ සමාජයීය පසුබිම 8
2.3.2 අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගේ ආර්ථික පසුබිම 10
2.4 වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ සමාජ ආර්ථික පසුබිම 11

**03. අලෙවිකරණය** 13-35
3.1 හැඳින්වීම 13
3.2 අලෙවි පද්ධතියේ සංයුතිය 13
3.2.1 අලෙවි මාර්ග 13
3.2.2 වෙළෙඳපොළ හැසිරීම 16
3.2.3 අලෙවි පාර්ශවයන් 17
3.3 අලෙවි පද්ධතියේ ක්‍රියාකාරීත්වය 21
3.3.1 හුවමාරු කාර්යය 21
3.3.2 භෞතිකමය බෙදාහැරීමේ කාර්යයන් 29
3.3.3 පහසුකම් සැපයීමේ කාර්යය 34

**04. අලෙවි ගැටළු සහ මිල විශ්ලේෂණය** 36-61
4.1 හැඳින්වීම 36
4.2 වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සහ දුෂ්කරතා 36
4.2.1 ඇසුරුම්කරණය සම්බන්ධ ගැටළු 36
4.2.2 ප්‍රවාහනය සම්බන්ධ ගැටළු 37
4.3 රාජ්‍ය/ පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු 39
4.3.1 රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු 39
4.3.2 පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු 43
4.3.3 වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සඳහා ගොවීන් ඉදිරිපත් කළ යෝජනා 46
4.4 වී මිලදී ගැනීමේදී සහ අලෙවියේදී අතරමැදියන්/ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු සහ ඔවුන් විසින් යෝජිත විසඳුම් 49
4.4.1 වී මිලට ගැනීමේදී අතරමැදියන් සහ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු 49
4.4.2 වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයන්/ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ විසඳුම් 51
4.4.3 වී/ සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයන් සහ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු 52

4.4.4 වී/ සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයන්/ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා 54
4.5 මිල ප්‍රවණතා 54
4.6 කාලීන මිල වෙනස්වීම් 54
4.7 මිල පැතිරීම 56
4.8 මිල උච්චාවචනය 57
4.9 ගොවීන්ගේ වී මිල ගණන් වෙනස්වීමේ ස්වභාවය 58

05. සාරාංශ නිගමන සහ යෝජනා 62-66
5.1 සාරාංශ සහ නිගමන 62
5.2 නිර්දේශ 65

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 67
ඇමුණුම්
01. ප්‍රධාන වී මෝල් සහ වී මෝල් හිමියන්ගේ නාම ලේඛනය 68
02. අධ්‍යයනයට ලක්කළ වී මෝල් හිමියන්ගේ නම් සහ ලිපිනයන් 69

සංඛ්‍යා සටහන්

1.1 2003/2004 මහ කන්නයේ වී වගා බිම් ප්‍රමාණය සහ අස්වැන්න 1
2.1 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව්/අමුණු සංඛ්‍යාව සහ ඒ යටතේ වගා කරන ගොවි පවුල් සංඛ්‍යාව 7
2.2 වයස් කාණ්ඩ අනුව ගොවීන්ගේ ප්‍රතිශතය 8
2.3 පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 9
2.4 ප්‍රදේශයේ පදිංචියට පැමිණි වර්ෂය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 9
2.5 වී වගාවේ නිරතව සිටි කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 10
2.6 අධ්‍යාපන මට්ටම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 10
2.7 ඉඩම් අයිතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය 11
2.8 වයස් කාණ්ඩ අනුව වී මිලට ගැනීමේ නිරත අතරමැදියන්ගේ සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය 12
2.9 අධ්‍යාපන මට්ටම අනුව වී මිලට ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය 12
2.10 ව්‍යාපාරයේ නිරතව සිටි කාලය අනුව වී මිලට ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය 12
3.1 ගොවීන් වී අලෙවි කිරීම සඳහා විවිධ අලෙවි පාර්ශවයන් තෝරා ගැනීම 20
3.2 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙළෙඳපොළ සඳහා වන වී අතිරික්තය 21
3.3 අස්වනු නෙළූ විගස වී අලෙවි කිරීමට හේතු 22
3.4 වී මිල ගණන් තීරණය කිරීමේ ස්වභාවය 23
3.5 වී කිලෝ ග්‍රෑමයක් සඳහා පැවති මිල ගණන් යල/මහ (2002/2003) 23
3.6 වී සඳහා මුදල් ගෙවන ආකාරය 24
3.7 වෙළෙඳුන්ට වී අලෙවි කරන පාර්ශවයන් 24
3.8 වෙළෙඳුන් විසින් වී මිල ගණන් වෙනස් කිරීම 25
3.9 වී මිල ගණන් තීරණය කිරීමේ ස්වභාවය 26
3.10 වී මෝල් හිමියන්ට සහල් අලෙවියෙන් පසුව මුදල් ලැබෙන ආකාරය 29
3.11 අනාගතයේ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කිරීම 30
3.12 වී ගබඩා නොකිරීම සඳහා බලපාන හේතු 31
3.13 තැම්බූ සහල් කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය 32
3.14 වී මෝල් හිමියන්ගේ ණය ලබාගැනීමේ ස්වරූපය 33
3.15 ගොවීන් තුළ වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ඇති දැනුම 34
3.16 ගොවීන් ලබාගත් ණය ප්‍රමාණය 35
4.1 ඇසුරුම්කරණය සම්බන්ධව ගොවීන් මුහුණදෙන ගැටළු 36
4.2 ප්‍රවාහන මාධ්‍ය භාවිතයේදී මුහුණදෙන ගැටළු 38

4.3 රාජ්‍ය/ පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගැටළුවලට මුහුණපෑම 39
4.4 රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු 40
4.5 රාජ්‍ය අංශයට වී අලෙවියේදී මුදල් ලැබීමේ ප්‍රමාදය සම්බන්ධ ගැටළු 41
4.6 පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු 43
4.7 වී සඳහා පෞද්ගලික අංශයෙන් අඩු මිලක් ලැබීම සම්බන්ධ සාධක 44
4.8 පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගුණාත්මක තත්ත්වය සම්බන්ධ ගැටළු 46
4.9 වී අලෙවියේදී මුහුණදෙන ගැටළු සඳහා ගොවීන් ඉදිරිපත් කළ යෝජනා 47
4.10 වී මිලට ගැනීමේ නිරත අතරමැදියන්/ වී මෝල් හිමියන් වී මිලට ගැනීමේදී මුහුණදෙන ගැටළු 49
4.11 වී/ සහල් අලෙවියේදී අතරමැදියන්/ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු 53
4.12 1993-2010 වී මිල ප්‍රවණතා 55
4.13 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කාලීන වී මිල ගණන් වෙනස් වීම 56
4.14 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල උච්චාවචනය 57
4.15 පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සහ මිල 58
4.16 වී අලෙවි ප්‍රමාණය මත මිල වෙනස්වීම 59
4.17 වී නිෂ්පාදන ප්‍රමාණය මත මිල වෙනස්වීම . 60
4.18 ප්‍රවාහන පිරිවැය මත වී මිල වෙනස්වීම 60
4.19 ගොවීන් ලබාගත් ණය ප්‍රමාණය මත මිල වෙනස්වීම 61

ප්‍රස්තාර සහ රූ සටහන්

ප්‍රස්තාර

4.1 වී නිෂ්පාදන මිල (මහ) 55
4.2 වී නිෂ්පාදන මිල (යල) 56

රූ සටහන්

3.1 පොළොන්නරුව නගරය ආශ්‍රිත වී අලෙවි මාර්ග 14
3.2 පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් දුරස්ථ ප්‍රදේශවල වී අලෙවි මාර්ග 15
3.3 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි මාර්ග 16
3.4 සහල් අලෙවි මාර්ග 28
3.5 මහා පරිමාණ වී මෝල් හිමියන්ගේ සිට විවිධ ප්‍රදේශවලට සහල් බෙදාහැරීම 28

**සිතියම්**

01. අධ්‍යයන ප්‍රදේශ සිතියම 06

## පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

### 1.1 අධ්‍යයනයේ වැදගත්කම

තනි භෝගයක් වශයෙන් දිවයිනේ වැඩිම වගා වපසරියකින් යුත් වී වගාව මෙරට කෘෂිකර්මාන්තයෙහි මූලික ස්ථානයක් හිමිකර ගෙන තිබේ. යල, මහ දෙකන්නයම ඇතුළත්ව රටෙහි මුළු වගා බිම්වලින් 42%ක් පමණ වී වගාව යටතේ පවතී. සමස්තයක් වශයෙන් ගත් කළ වී වගාව කුඩා පරිමාණ වන අතර එය ප්‍රධාන වශයෙන්ම දේශීය පරිභෝජනය අරමුණ කරගෙන ඇත. අනෙකුත් සියලුම භෝගවලට වඩා වී වගාව රටේ සියලුම ප්‍රදේශවල ව්‍යාප්තව පවතී. 2003 වර්ෂයේදී වී වගාව කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදිතයට 20.4%ක දායකත්වයක් සැපයූ අතර එය රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.2%ක් පමණ වේ.

ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක පැවති වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමෙන් සහ ඒවා ආශ්‍රිතව නැවත ජනාවාස ඇති කරවීමෙන් ද, මහවැලිය වැනි නව වාරි මාර්ග යෝජනා ක්‍රම බිහි කිරීමෙන් ද පසුගිය අඩසිය වසකට ආසන්න කාලය තුළ වාරිමාර්ග පහසුකම් යටතේ වූ වගා බිම් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කරන ලදී. මේ අනුව 1952 දී හෙක්ටයාර 479,000 ක් වූ දිවයිනේ වී වගා කළ මුළු බිම් ප්‍රමාණය 2002 දී හෙක්ටයාර 852,529 ක් දක්වා වර්ධනය වී ඇත. වාර්තාගත වැඩිම වී වගා කරනලද බිම් ප්‍රමාණය වූ හෙක්ටයාර 990,000 වර්ෂ 1984 දී වාර්තා විය (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2002). 1.1 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන අන්දමට වී නිෂ්පාදනය සිදු කෙරෙන ප්‍රධාන දිස්ත්‍රික්කයන් හි වැඩිම බිම් ප්‍රමාණයක වී වගාව මහා වාරි මාර්ග ක්‍රම යටතේ සිදු කෙරෙන අතර වැඩිම අස්වැන්නක් සැපයෙන්නේ ද මහා වාරි මාර්ග යටතේ වන වගා වපසරියෙනි.

1.1 සංඛ්‍යා සටහන : වාරි ක්‍රම අනුව 2003/04 මහ කන්නයේ වී වගා බිම් ප්‍රමාණය සහ අස්වැන්න

| දිස්ත්‍රික්කය/ස්ථානය | වගාබිම් (හෙක්ටයාර) | | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටයාරයට/බුසල්) | | මුළු නිපැයුම (බුසල් දහස්) |
|---|---|---|---|---|---|
| | මහාවාරි | සුළුවාරි | මහාවාරි | සුළුවාරි | |
| රත්නපුර | 4701 | 16949 | 95.18 | 55.94 | 1543 |
| කුරුණෑගල | 20609 | 42758 | 83.47 | 61.78 | 3595 |
| පුත්තලම | 9036 | 10222 | 85.10 | 57.61 | 1077 |
| මහනුවර | 9957 | 12997 | 92.96 | 64.59 | 1746 |
| මාතලේ | 12686 | 15025 | 92.30 | 77.20 | 2438 |
| බදුල්ල | 25346 | 19303 | 91.13 | 85.65 | 3702 |
| මොණරාගල | 11894 | 13441 | 94.81. | 82.36 | 2797 |
| කිලිනොච්චි | 24185 | 1222 | 75.36 | 63.00 | 2397 |
| මුලතිවු | 11009 | 4241 | 82.40 | 71.20 | 1237 |
| මන්නාරම | 18846 | 3159 | 80.32 | 74.00 | 1135 |
| අනුරාධපුර | 55639 | 37427 | 93.86 | 71.96 | 4878 |
| පොළොන්නරුව | 121540 | 3977 | 97.68 | 89.81 | 10915 |
| ත්‍රිකුණාමලය | 39136 | 9649 | 84.01 | 77.39 | 4327 |
| මඩකලපුව | 43359 | 4927 | 61.70 | 72.66 | 5414 |
| අම්පාර | 120917 | 5172 | 92.23 | 74.86 | 11935 |
| හම්බන්තොට | 31146 | 7863 | 96.58 | 71.32 | 3225 |
| උඩවලව | 21119 | - | 97.83 | - | 2005 |
| මහවැලි එච් | 62036 | - | 94.94 | - | 5229 |

මූලාශ්‍ර : වී පිළිබඳ සංඛ්‍යා ලේඛන 2003/2004 මහ . ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2004)

සංඛ්‍යා සටහන් අංක 1.1ට අනුව ශ්‍රී ලංකාවේ මහා වාරිමාර්ග ක්‍රම යටතේ වී වගා කරන වැඩිම බිම් ප්‍රමාණයක් ව්‍යාප්තව ඇත්තේ පිළිවෙලින්, අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි වන අතර වී වගා බිම් ප්‍රමාණය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කය දෙවැනි වන්නේ අම්පාර දිස්ත්‍රික්කයට පමණි.

2002 වර්ෂයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී වගා කළ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 101,087 කි. එය ශ්‍රී ලංකාවේ සමස්ත වී වගා කළ බිම් ප්‍රමාණයෙන් 11% කි. ඉන් 97% ක්ම එනම්, හෙක්ටයාර 91,878 ක් වගා කොට ඇත්තේ මහා වාරි මාර්ග ක්‍රම යටතේය. මෙයට අමතරව ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයට පොළොන්නරුව දිස්ත්‍රික්කය ඉහළ දායකත්වයක් සපයනු ලබයි.

2002 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 13% ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් සපයා ඇති අතර 2001 වර්ෂයේදී 15% ද, 2000 වර්ෂයේදී 14% ක දායකත්වයක් ද සපයා ඇත. මේ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15% කට ආසන්න ප්‍රමාණයකට අනිවාර්යයෙන්ම දායකත්වය සපයන අතර සමස්තයක් ලෙස අස්වනු නෙළන සමයේදී වී අලෙවිය සම්බන්ධ ගැටළුවලට බෙහෙවින් මුහුණ දෙනු ලබන දිස්ත්‍රික්කයක් වශයෙන්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

පසුගිය රජයන් විසින් වරින් වර ක්‍රියාත්මක කරනු ලැබූ අලෙවි සවිය, දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා වී මිලට ගැනීම සඳහා රාජ්‍ය අංශයෙන් මුදල් ලබාදීම වැනි විවිධ වැඩසටහන් යටතේ වුව මෙම ගැටළු තවදුරටත් නොවිසඳී පවතී. එයද පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ අධ්‍යයනය වැදගත් වීමට හේතුවකි.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 95%ගේ පමණ ජීවනෝපාය මාර්ගය වන වී ගොවිතැනෙහි, නිෂ්පාදන අලෙවිය සම්බන්ධව පවතින ගැටළු ඔවුන්ගේ ජන ජීවිතයේ යහපැවැත්ම සඳහා තදින්ම බලපෑම් ඇති කරනු ලබයි. මෙම හේතු සාධක සැලකිල්ලට ගැනීමේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ අධ්‍යයනය කිරීම කාලීන වශයෙන් වැදගත් වේ.

### 1.2 පූර්ව පර්යේෂණ විමර්ශන

ශ්‍රී ලංකාවේ වී අලෙවිකරණය සම්බන්ධව පූර්වයෙහි සිදුකරන ලද අධ්‍යයන කිහිපයකි. "ශ්‍රී ලංකාවේ වී සහ සහල් අලෙවිකරණයේ විවිධ අංගයන්" යන හිසින් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 1975 දී අධ්‍යයනයක් සිදුකරන ලදී. පොළොන්නරුව දිස්ත්‍රික්කය මෙම අධ්‍යයනය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක අතුරින් එක් දිස්ත්‍රික්කයකි. වී අලෙවිකරණ මණ්ඩලය මගින් උපරිම වී එකතුවක් සපයා ගැනීම සහ ගුණාත්මක තත්ත්වයේ සහල් අලෙවිකරණය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා සිදු කළ මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගැනීම අවිධිමත් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් සිදුකර ඇත. 1970 දශකයේ මුල් භාගයේදී අලෙවි මාර්ග බල පැවැත්වූ ආකාරය මෙම වාර්තාව මගින් විස්තර කර ඇති අතර පුද්ගලික අංශයේ අලෙවි මාර්ගයන් අවිධිමත් (illegal) මාර්ග වශයෙන් විස්තර කර ඇත. මන්ද යත්, මෙම අවධියේ වී අලෙවිකරණයේ ප්‍රධානම ආයතනය වශයෙන් ක්‍රියාත්මක වූයේ වී අලෙවි මණ්ඩලය වූ හෙයිනි.

"සමුපකාර හරහා වී නිෂ්පාදන ක්‍රමයන්ට ආයෝජනය කිරීමේ ශක්‍යතාව" යන මැයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් 1984 දී අධ්‍යයනයක් සිදුකර ඇත. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ මෙම අධ්‍යයන වාර්තාවේ අඩංගු වූ සහල් සැකසීමේ කර්මාන්තය පිළිබඳ තොරතුරු මෙම අධ්‍යයනයේදී වැදගත් විය. නිෂ්පාදන කර්මාන්තයක් ලෙසින් වී සඳහා ආයෝජනය කිරීමේ ශක්‍යතාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම, මෙම අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රයට අයත් විය.

"වී අලෙවිකරණ ක්‍රමයන් වෙනස්වීම කෙරෙහි රජයේ අලෙවිකරණ ප්‍රතිපත්තියේ බලපෑම" යන මැයෙන් සී. බෝගහවත්ත විසින් 1985 දී සිදු කරන ලද අධ්‍යයනය ද පොළොන්නරුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව සිදුකර ඇත. මෙහි

අරමුණ වූයේ 1978 දී වී අලෙවි මණ්ඩලය මගින් වී මිලට ගැනීමේ ඒකාධිකාරිය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගම් මට්ටමේ වී අලෙවිකරණ ක්‍රමයන්ගේ සිදුවූ වෙනස ඇගයුමට ලක් කිරීමයි. ප්‍රධාන සොයා ගැනීම් වූයේ, වෙළඳපොළ අතිරික්තය වර්ධනයවීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීමත් සමග වී/ සහල් අලෙවිකරණයේදී පෞද්ගලික අංශයේ මැදිහත්වීම ඉහළ මට්ටමක පවතින බවත් ය.

"ශ්‍රී ලංකාවේ වී/සහල් අලෙවිකරණයේ විවිධ අංගයන්" යන හිසින් 1987දී ඩබ්.පී. සෝමරත්න විසින් පශ්චාත් උපාධි නිබන්ධනයක් ලෙසින් සිදුකරන ලද අධ්‍යයන වාර්තාව ද්විතියික දත්ත මත පදනම් වී ඇත. මෙම වාර්තාවෙන් වී සහ සහල් සඳහා වන ක්‍රියාවන්, ආන්තික තත්ත්වයන් සහ වෙළඳපොළ මාර්ග සාර්ව මට්ටමින් විග්‍රහ කර ඇත. වාර්තාවෙන් විස්තර වන අන්දමට සමස්ත සහල් නිෂ්පාදනයෙන් 60%ක අලෙවිය කොළඹ තොග වෙළඳපොළ හරහා ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම වී මෝල් හිමියන් සහ නාගරික තොග වෙළෙන්දන්/සිල්ලර වෙළෙන්දන් අතර ඇතිවන සම්බන්ධතා නිසා මේ වනවිට එම තත්ත්වය වෙනස් වී ඇත.

ජීවිකා වෙහෙරගේවා සහ තවත් අය විසින් 2002 වර්ෂයේදී සිදුකරන ලද "ශ්‍රී ලංකාවේ වී වගාවේ අනාගතය, සාපේක්ෂ වාසි පරිමාණය සහ ග්‍රාමීය ආර්ථිකය" නම් ශ්‍රී ලංකා ආර්ථික සඟරාවේ තෙවෙනි වෙළුමේ දෙවන කලාපයෙහි පළවූ ලිපිය මගින් ගොවිපළ ප්‍රමාණය අනුව සාපේක්ෂ වාසි ගණනය කර ඇත. එමගින් පෙන්වාදෙන අන්දමට විශාල පරිමාණයේ ගොවිපළවල සාපේක්ෂ වාසි වර්ධනය වෙමින් පැවතිණි. මෙමගින් වැඩිදුරටත් පවසන්නේ වී වගාව ලාභදායක කර්මාන්තයක් වුවත් කුඩා පරිමාණ තත්ත්වය යටතේ එතුළින් ප්‍රමාණවත් පවුලේ ආදායමක් උත්පාදනය නොකරන බවයි.

## 1.3 අධ්‍යයන ගැටළුව සහ අරමුණ

**අධ්‍යයන ගැටළුව**

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයෙන් 15% පමණ දායකත්වයක් සිදු කරනු ලබන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එහිදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණයෙහි ස්වභාවය විශ්ලේෂණය කිරීම මෙන්ම අලෙවිකරණ ගැටළු සඳහා විසඳුම් යෝජනා කිරීම අරමුණු වන අතර අනෙකුත් අරමුණු වන්නේ,

1. වී වෙළඳපොළ අතිරික්තය හඳුනා ගැනීම
2. ගොවීන්ගේ වී අලෙවි කිරීමේ රටාව හඳුනාගැනීම
3. වී ගොවීන්, වී මෝල් හිමියන් සහ වී මිලදී ගැනීමේ නිරත වෙළඳුන් වී අලෙවි ක්‍රියාදාමය තුළදී මුහුණපාන ගැටළු සහ ඔවුන් අතර පවතින සම්බන්ධතාව හඳුනාගැනීම
4. වී මිල ගණන් පහළ යාමේ ගැටළුව විසඳීම සඳහා නිර්දේශ යෝජනා කිරීම වේ.

## 1.4 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත මත පදනම් වී ඇති අතර ද්විතියික දත්ත ද භාවිතා කර ඇත. පර්යේෂණ නිලධාරීන් තිදෙනෙක් සහ පර්යේෂණ සහායකවරුන් පස්දෙනෙක් ද මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර කටයුතුවලට සහභාගි වූහ. ප්‍රාථමික දත්ත රැස්කිරීම, මූලික වශයෙන් ප්‍රශ්නාවලි මාර්ගයෙන් සිදු කෙරුණ අතර, එයට අමතරව වී ගොවීන්, වෙළෙඳුන් සහ වී මෝල් හිමියන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ වැනි ක්‍රම භාවිතා කරමින් ද තොරතුරු එක්රැස් කරනු ලැබීය. කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය අංශයේ නිලධාරීන් වන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහායකවරුන්, ගොවිජන සේවා මධ්‍යස්ථානවල ප්‍රාදේශීය නිලධාරීන්, දිස්ත්‍රික්ක කෘෂිකර්ම කොමසාරිස් ආදී නිලධාරීන් සමග පැවැත්වූ සාකච්ඡා මාර්ගයෙන් ද තොරතුරු සම්පාදනය කෙරුණි. මෙයට අමතරව වී අලෙවි ක්‍රියාදාමය තුළ වැඩි තැරැව්කරුවන් පිරිසක් සිටින කඳුරුවෙල ප්‍රදේශයේ තැරැව්කරුවන් සමග පැවැත්වූ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවලින් මෙන්ම නිරීක්ෂණවලින් ද අදාළ තොරතුරු ලබා ගැණුනි. ප්‍රශ්නාවලි භාවිතයෙන් ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සමීක්ෂණ තුනක් ඔස්සේ සිදු කෙරුණි. එනම්,

i ගොවීන් ආශ්‍රිතව සිදුකළ සමීක්ෂණය

ii අතරමැදි වෙළෙඳුන් ආශ්‍රිතව සිදුකළ සමීක්ෂණය

iii වී මෝල් හිමියන් ආශ්‍රිතව සිදුකළ සමීක්ෂණය

ගොවීන්ගේ සමීක්ෂණය සඳහා තොරතුරු රැස් කිරීමට "බහු පියවර නියැදි ක්‍රමය" (Multi – stage random sampling technique) යොදා ගැණුනු අතර එය පියවර තුනකින් සමන්විතය.

**පළමු පියවර**

**ගොවිජන සේවා බල ප්‍රදේශ පහක් තෝරා ගැනීම**

පොළොන්නරුව දිස්ත්‍රික්කයම නියෝජනය වන අන්දමට එක් ගොවියෙකු සඳහා හිමි කුඹුරු අක්කර ප්‍රමාණය, මාර්ග පහසුකම් සහ ජල පහසුකම් සැලකිල්ලට ගනිමින් ගොවිජන සේවා බලප්‍රදේශ 5 ක් තෝරා ගැණිනි. ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ උතුරු කොටස නියෝජනය වන ආකාරයෙන් මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයත්, නැගෙනහිර කොටස නියෝජනය වන ආකාරයෙන් මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයත්, දකුණු කොටස නියෝජනය වන ආකාරයෙන් ඇලහැර - බකමූණ ගොවිජන සේවා බල ප්‍රදේශයත්, බටහිර කොටස නියෝජනය වන ආකාරයෙන් හිගුරක්ගොඩ ගොවිජන සේවා බලප්‍රදේශයත්, මධ්‍යම කොටස නියෝජනය වන ආකාරයෙන් සේවාගම ගොවිජන සේවා බල ප්‍රදේශයත් තෝරා ගැණිනි ( සිතියම් අංක 01).

**දෙවන පියවර**

**ග්‍රාම නිලධාරී කොට්ඨාස දහයක් තෝරා ගැනීම**

ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එක් ගොවිජන සේවා බල ප්‍රදේශයකින් ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙක බැගින් ගොවිජන සේවා බල ප්‍රදේශ පහෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාස දහයක් තෝරා ගැණිනි. ඒ අනුව සේවාගම ගොවිජන සේවා බල ප්‍රදේශයෙන් ලක්ෂ උයන සහ සිංහරාපුරත්, මැදිරිගිරිය ගොවිජන බල ප්‍රදේශයෙන් බෙබිලියාවැව සහ දියසෙන්පුරත්, හිගුරක්ගොඩ ගොවිජන සේවා බලප්‍රදේශයෙන් අක්කර හැත්තෑව සහ හිගුරක බණ්ඩාරගමත්, මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයෙන් අසේලපුර සහ වීරානත්, ඇලහැර-බකමූණ ගොවිජන සේවා බල ප්‍රදේශයෙන් ඉකිරිවැව සහ අතරගල්ලෑවත් තෝරා ගන්නා ලදී.

**තෙවන පියවර**

**එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකින් ගොවීන් 50 බැගින් තෝරා ගැනීම**

එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකට ගොවීන් 50 බැගින් ග්‍රාම නිලධාරී කොට්ඨාස දහය තුළින් ගොවීන් 500 ක් අධ්‍යයනයට භාජනය කෙරුණි. ගොවීන් තෝරා ගනු ලැබුවේ, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) මගින් ලබාගත් ඒ ඒ ග්‍රාම නිලධාරී කොට්ඨාසයන්ට අදාළ කුඹුරු නාම ලේඛනයන් මගින් අක්කර 5,3, 2 1/2 , 2 සහ 1 යනාදී ලෙස කුඹුරුවල විශාලත්වය සැලකිල්ලට ගනිමින් අහඹු වශයෙනි.

වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන් සඳහා වූ සමීක්ෂණයේදී පූර්ව නියැදි රාමුවක් සැලසුම් කිරීම අපහසු විය. එබැවින් ගොවීන් සමීක්ෂණයට භාජනය කළ ප්‍රදේශවලම වී මෝල් හිමියන් සහ වෙළෙඳුන් සමීක්ෂණයට ලක් කෙරුණි. එයට අමතරව වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් වැඩිම පිරිසක් ඒකරාශී වී සිටින කදුරුවෙල නගරයේත්, වැඩිම වී මෝල් ප්‍රමාණයක් පිහිටා තිබෙන බැදිවැව, ජයන්තිපුර, මින්නේරිය සහ හිගුරක්ගොඩ යන ප්‍රදේශවලත් විශේෂයෙන්ම සමීක්ෂණය සිදු කෙරුණි. එහිදී වී මෝල් හිමියන් සහ වෙළෙඳුන් 38 බැගින් සමීක්ෂණයට භාජනය කරන ලදී.

අධ්‍යයනයට අවශ්‍ය වූ ද්විතියික දත්ත ලබා ගැනීමේදී ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ මූලාශ්‍රයන්, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මූලාශ්‍රයන්, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ මූලාශ්‍රයන්, මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලාශ්‍රයන් ද උපයෝගී කර ගන්නා ලදී.

#### අධ්‍යයන කාල සීමාව

මෙම අධ්‍යයනය සඳහා 2002/2003 මහ කන්නය සහ 2003 යල කන්නයේ ආශ්‍රිත තොරතුරු ලබා ගන්නා ලදී. අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු 2004 වර්ෂයේ පළමු කාර්තුව තුළ සිදු කෙරිණි.

#### දත්ත විශ්ලේෂණය සහ ඉදිරිපත් කිරීම

මිල ප්‍රවණතා ඉදිරිපත් කිරීමේදී කාල ශ්‍රේණි විශ්ලේෂණය මගින් 2010 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල පිළිබඳව පුරෝකථනය කර ඇත. එමෙන්ම, දත්ත ඉදිරිපත් කිරීමේදී වගු සටහන්, ප්‍රස්තාර උපයෝගී කර ගන්නා ලදී.

### 1.5 අධ්‍යයනයේ සීමා


මෙම අධ්‍යයනයට සම්බන්ධ පර්යේෂණ යෝජනාව 2003 වසරේ මුල් කාර්තුව තුළ ඉදිරිපත් කරන ලද මුත් ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිවූයේ, 2003 වසරේ අවසන් කාර්තුව තුළ වීම මෙම අධ්‍යයනය සම්බන්ධ වූ සීමාවක් විය.

මෙම පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ යල, මහ කන්න දෙකෙහිම තොරතුරු එම කන්න ආසන්නයේම ලබා ගනිමින් වැඩි කාලයක් වැය කරමින් සිදු කිරීමට වුවත්, මූල්‍ය ප්‍රතිපාදන ලැබීමේ කාලයත්, වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත කාලයත් අතර එවැනි තත්ත්වයකට ඉඩ නොතිබීම ද බාධාවක් විය. එමෙන්ම පර්යේෂණය සඳහා විවිධ හේතූන් නිසා පර්යේෂණ සහායකවරුන් බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාදවීමත්, අනපේක්ෂිතව එළඹි 2004 පාර්ලිමේන්තු මැතිවරණය මෙන්ම සිංහල, හින්දු අලුත් අවුරුදු උත්සවයත් ක්ෂේත්‍ර කටයුතු නිසි කාලයට අවසන් කිරීමට බාධාවන් විය.

### 1.6 වාර්තාවේ සැකැස්ම

මෙම වාර්තාව පරිච්ඡේද පහකින් සමන්විත වන අතර පළමු පරිච්ඡේදයේදී අධ්‍යයනයේ වැදගත්කම, අධ්‍යයන ගැටළුව සහ අරමුණු, අධ්‍යයන ක්‍රමවේදය සහ සීමාවන් පිළිබඳව විග්‍රහ කරනු ලබයි. දෙවන පරිච්ඡේදයෙන් අධ්‍යයනයට ලක්වූ ප්‍රදේශයේ භූගෝලීය පසුබිම මෙන්ම නියැදියේ සමාජ, ආර්ථික තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. තෙවැනි පරිච්ඡේදයේදී අලෙවි මාර්ග, වෙළඳපළ සහභාගිත්වය ආදිය ඇතුළත් වූ වී අලෙවි ක්‍රියාවලිය සම්බන්ධව සාකච්ඡා කරනු ලබයි. සිව්වන පරිච්ඡේදයේදී වෙළඳපළ ගැටළු සහ වී මිල සම්බන්ධව විග්‍රහ කෙරේ. පස්වන පරිච්ඡේදයෙන් මෙම අධ්‍යයනයේ සාරාංශ නිගමන සහ යෝජනා ඉදිරිපත් කිරීම සිදුවේ.

සිතියම 01 : අධ්‍යයන ප්‍රදේශ සිතියම



# අධ්‍යයන ප්‍රදේශය සහ අධ්‍යයනයට ලක්වූවන්ගේ සමාජ, ආර්ථික පසුබිම

## 2.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය තුළින් අධ්‍යයනයට ලක්වූ ප්‍රදේශයේ භූගෝලීය ස්වභාවය සහ අධ්‍යයනයට ලක්වූ නියැදියේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳව සාකච්ඡා කෙරේ.

## 2.2 අධ්‍යයනය සිදුකළ ප්‍රදේශයේ භූගෝලීය ස්වභාවය

උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකෙන් එකක් වන පොළොන්නරුව දිස්ත්‍රික්කය උතුරින් ත්‍රිකුණාමලය සහ අනුරාධපුර දිස්ත්‍රික්කයෙනුත්, බටහිරින් මාතලේ දිස්ත්‍රික්කයෙනුත්, නැගෙනහිරින් මඩකලපුව දිස්ත්‍රික්කයෙනුත්, දකුණින් අම්පාර දිස්ත්‍රික්කයෙනුත් මායිම් වේ (අංක 1 සිතියම). ගොඩබිම වර්ග කිලෝමීටර 3077ක් සහ අභ්‍යන්තර ජලාශ වර්ග කිලෝ මීටර 216ක් වශයෙන් වර්ග කිලෝ මීටර 3293ක භූමි භාගයක් පුරා විසිරී ඇති එය ප්‍රධාන වශයෙන්ම තැනිතලා ස්වභාවයක් ගනී. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බොහොමයක් ප්‍රදේශ මුහුදු මට්ටමේ සිට මීටර 15-152ක් අතර උසකින් පිහිටා ඇත. එමෙන්ම දිස්ත්‍රික්කයේ බටහිර සහ නිරිතදිග ප්‍රදේශ මීටර 152ට වඩා උස්වේ. මාදුරුඔය, මහවැලි ගඟ, කන්තලේ ආරු, යාන්ඔය යන ගංගා ද්‍රෝණි මෙම දිස්ත්‍රික්කයට අයත් වේ. මහවැලි ව්‍යාපාරය යටතේ දිස්ත්‍රික්කයෙන් 70%ක් ආවරණය වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කය පරිපාලනමය වශයෙන් මැදිරිගිරිය, ලංකාපුර, වැලිකන්ද, දිඹුලාගල, තමන්කඩුව, ඇලහැර, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අටකට බෙදා ඇත. දිස්ත්‍රික්කය තුළ වගා කටයුතු සඳහා යොදාගෙන ඇති වැව් 79 ද, අමුණු (Anicuts) 131 ද වේ. අත්හැර දමන ලද වැව් සංඛ්‍යාව 36ක් වන අතර අමුණු සංඛ්‍යාව 17 කි. ගොවිජන සේවා බලප්‍රදේශ අනුව එම විස්තර 2.1 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

2.1 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් / අමුණු සංඛ්‍යාව සහ ඒ යටතේ වගා කරන ගොවි පවුල් සංඛ්‍යාව(ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගොවිජන සේවා බලප්‍රදේශය | සක්‍රීය වැව් සහ අමුණු | | | | | අක්‍රීය වැව්/අමුණු | |
|---|---|---|---|---|---|---|---|
| | වැව් | අමුණු | ගොවි පවුල් | | | වැව් | අමුණු |
| | | | වැව් යටතේ | අමුණු යටතේ | එකතුව | | |
| පොළොන්නරුව නව නගරය | 4 | 19 | 248 | 598 | 846 | 4 | 1 |
| සේවාගම | - | 10 | - | 400 | 400 | - | 3 |
| හිඟුරක්ගොඩ | 29 | 14 | 992 | 400 | 1392 | 14 | - |
| ගිරිතලේ | 3 | 6 | 133 | 194 | 327 | 1 | 1 |
| බකමූණ | 6 | 4 | 176 | 130 | 306 | - | - |
| පුලස්තිගම | 3 | 17 | 177 | 931 | 1108 | 1 | - |
| මැදිරිගිරිය | 34 | 54 | 1383 | 2108 | 3491 | 16 | 12 |
| ගල් අමුණ | - | 7 | - | 450 | 450 | - | - |
| **එකතුව** | 79 | 131 | 3109 | 5211 | 8320 | 36 | 17 |

මූලාශ්‍ර : Data book for village irrigation services schemes of Sri Lanka Polonnaruwa district (2000), Dept. of Agrarian services

## 2.3 නියැදියේ සමාජ ආර්ථික පසුබිම

### 2.3.1 අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගේ සමාජ පසුබිම

අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙ නියැදිය ස්ත්‍රී /පුරුෂ භාවය අනුව විමසීමේදී 16.4%ක් ස්ත්‍රීන් වූ අතර, 83.6%ක් පුරුෂයන් විය. ගොවිජන සේවා බලප්‍රදේශ අනුව විමසීමේදී හිඟුරක්ගොඩ 13.7% ද, මනම්පිටිය 18.2% ද, මැදිරිගිරිය 17.0% ද, සේවාගම 18.1% ද, ඇලහැර - බකමූණ 15.0 % ද, කාන්තාවෝ වූහ.

අධ්‍යයනයට ඇතුළත් වූ ගොවීන්ගේ නියැදිය වයස් කාණ්ඩ අනුව විග්‍රහ කරනවිට වයස අවුරුදු 20 සිට අවුරුදු 50 හෝ එයට වැඩි වයස් මට්ටම් දක්වා ව්‍යාප්තව පැවතිණි. මෙම නියැදියෙන් 50%ට ආසන්න ප්‍රමාණයක් අවුරුදු 50 හෝ එයට වැඩි වයස් කාණ්ඩයට අයත් වූහ. 2.2 සංඛ්‍යා සටහන අනුව වයස අවුරුදු 20 සිට 30 ට අඩු කාණ්ඩයට ඇතුළත් වූ ප්‍රතිශතය 5%ක තරම් අඩු අගයක් ගනී. මෙම වගු සටහන අනුව නිෂ්පාදකයින් ලෙස වී වගාවේ නියැළී සිටින්නන්ගෙන් තරුණ පිරිස ඉතාමත් අඩු ප්‍රමාණයකි.

2.2 සංඛ්‍යා සටහන : වයස් කාණ්ඩ අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය (ගොවිජන සේවා බල ප්‍රදේශවලට අදාළව)

| ගොවිජන සේවා බලප්‍රදේශය | වයස් කාණ්ඩය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | 20 =<- <30 | 30 =<-<40 | 40 =<- <50 | 50 =< | |
| හිඟුරක්ගොඩ | 4.9 | 18.6 | 34.3 | 42.2 | 100.0 |
| මනම්පිටිය | 6.1 | 10.1 | 41.4 | 42.4 | 100.0 |
| මැදිරිගිරිය | 11.0 | 12.0 | 14.0 | 63.0 | 100.0 |
| සේවාගම | 1.0 | 19.0 | 26.7 | 53.3 | 100.0 |
| ඇලහැර-බකමූණ | 3.0 | 15.0 | 31.0 | 51.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | 5.1 | 15.0 | 29.4 | 50.4 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

මෙම සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන ආකාරයට තරුණ වයස් කාණ්ඩවල අඩු පිරිසක් වී ගොවිතැනෙහි නියැළීමත් ක්‍රමයෙන් එය වර්ධනය වී අවුරුදු 50 ක් හෝ එයට වැඩි වයස් මට්ටමේදී වී වගාවේ නියැළී සිටි පිරිස අධිකව වඩා වැඩිවීමටත් බලපානු ලබන හේතු සම්බන්ධව අධ්‍යයනයේදී අවධානය යොමු නොවිණි. එසේ වුවත් තරුණ අවධියේදී වී වගාව හැර වෙනත් රැකියා මාර්ග කෙරෙහි අවධානය යොමු කර සිටීමත්, ක්‍රමයෙන් ආකල්පමය වෙනස්කම් ඇතිවීම හා වෙනත් රැකියාවන්ට ප්‍රවේශවීමේ අවස්ථා හිඟවීමත් වී වගාව කෙරෙහි පසුකාලීනව යොමුවීමට බලපානු ලබන බව ගොවීන් සමග කරනු ලැබූ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවලදී හෙළි විය. 2.1 සංඛ්‍යා සටහන අනුව අවුරුදු 20 සිට 30 අඩු වයස් මට්ටම්වල නියෝජනය වන කාණ්ඩය තුළ වැඩි සංඛ්‍යාවක් නියෝජනය වන්නේ මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයෙනි. එයට එක් හේතුවක් වන්නේ අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ මැදිරිගිරිය ප්‍රදේශයේ බෙබිලාවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසය මැදිරිගිරිය නගරයෙන් බොහෝ දුරස්ථව පිහිටා ඇති, පොදු පහසුකම් ලැබීම ඉතාම අවම මට්ටමක පවතින දුෂ්කර ගම්මානයක් වීමෙන් අධ්‍යාපන අවස්ථා අඩුවීමත්, වෙනත් රැකියා සඳහා ප්‍රවේශවීමට තිබෙන අවස්ථා අවමවීමත්ය. මෙම වගු සටහන අනුව අවුරුදු 20 සිට 30 අඩු කාණ්ඩය තුළ අවම නියෝජනයක් (01%) සිදුවන්නේ, සේවාගම ගොවිජන සේවා බල ප්‍රදේශයෙනි.

අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගේ පවුලේ සාමාජික සංඛ්‍යාව පිළිබඳව විමසීමේදී නියැදියෙන් 37.2%ක් සාමාජිකයන් 3-4 අතර පවුල් විය. 32.4% ක් සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ අතර 22.9%ක් සාමාජිකයන් 5ට වැඩි විය. සාමාජිකයන් 1-2ක් අතර පවුල් ප්‍රමාණය මුළු නියැදියෙන් 7.5%ක් විය. 2.3 සංඛ්‍යා සටහන අනුව නියැදියෙන් 55.3%ක් සාමාජිකයන් 5ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනු ලබයි.

2.3 සංඛ්‍යා සටහන : පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය.

| ගොවිජන සේවා බලප්‍රදේශය | පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව නියදිය % | | | | එකතුව % |
|---|---|---|---|---|---|
| | 1 - 2 | 3 - 4 | 5 | 5 < | |
| හිඟුරක්ගොඩ | 2.0 | 37.3 | 35.3 | 25.5 | 100.0 |
| මනම්පිටිය | 11.1 | 31.3 | 34.3 | 23.2 | 100.0 |
| මැදිරිගිරිය | 6.0 | 44.0 | 28.0 | 22.0 | 100.0 |
| සේවාගම | 8.6 | 37.1 | 31.4 | 22.9 | 100.0 |
| ඇලහැර-බකමූණ | 10.0 | 36.0 | 33.0 | 21.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | **7.5** | **37.2** | **32.4** | **22.9** | **100.0** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 12.1%ක් අවුරුදු 53 - 44ක් අතර කාලයක් ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර, 16.0%ක් අවුරුදු 43 - 34 අතර කාලයක් ප්‍රදේයේ පදිංචිකරුවෝ වෙති. අවුරුදු 33 - 24 අතර කාලයක සිටි ප්‍රදේශයේ පදිංචිකරුවන් 13.2 %ක් වූ අතර, අවුරුදු 23 හෝ එයට අඩු කාලයක් ප්‍රදේශයේ පදිංචි ප්‍රතිශතය 35.4 %ක් විය (සංඛ්‍යා සටහන් අංක 2.3). මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන් 100%ම අවුරුදු 24ක් හෝ එයට අඩු කාලයක් ප්‍රදේශය තුළ පදිංචිකරුවෝ වූහ. එයට හේතු වූයේ, මනම්පිටිය ප්‍රදේශයේ අධ්‍යයනයට ලක්කළ වීරාන සහ අසේලපුර ග්‍රාම නිලධාරී වසම්හි ඉඩම් 1980න් පසුව මහවැලි ව්‍යාපාරය යටතේ බෙදා දෙනලද ඒවා වීමයි.

2.4 සංඛ්‍යා සටහන : ප්‍රදේශයේ පදිංචියට පැමිණි වර්ෂය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| ගොවිජන සේවා බලප්‍රදේශය | පදිංචියට පැමිණි වර්ෂය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1950 හෝ එයට පෙර | 1950-1960 | 1960 - 1970 | 1970 - 1980 | 1980න් පසු | |
| හිඟුරක්ගොඩ | 36.3 | 32.4 | 9.8 | 7.8 | 13.7 | 100.0 |
| මනම්පිටිය | - | - | - | - | 100.0 | 100.0 |
| මැදිරිගිරිය | 2.0 | 10.0 | 40.0 | 34.0 | 14.0 | 100.0 |
| සේවාගම | 18.1 | 58.1 | 5.7 | 7.6 | 10.5 | 100.0 |
| ඇලහැර-බකමූණ | 3.0 | 14.0 | 25.0 | 17.0 | 41.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | **12.1** | **23.3** | **16.0** | **13.2** | **35.4** | **100.0** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අධ්‍යයනයට ලක්කළ ගොවීන් වී වගාවේ නිරතව සිටි කාලය පිළිබඳව සලකා බැලීමේදී ගොවීන්ගෙන් 92.7% ක් අවුරුදු දහයේ සිට තිහක් හෝ එයට වැඩි කාලයක් වී ගොවිතැනෙහි නිරතව අත්දැකීම් සහිත පුද්ගලයෝ වූහ. අවුරුදු දහයකට අඩුවෙන් වී වගාව සම්බන්ධ අත්දැකීම් ඇති පිරිස නියැදියෙන් 7.3 %ක් විය (2.5 සංඛ්‍යා සටහන). මෙම නියැදියේ අවුරුදු 30 ක හෝ එයට වැඩි වී වගාව පිළිබඳ අත්දැකීම් ඇති කාණ්ඩයේ පිළිබිඹු වන විශේෂ ලක්ෂණය වූයේ, ගොවිජන සේවා බලප්‍රදේශ හතරකම. එම කාණ්ඩයේ නියෝජනය 40 % ආසන්න හෝ ඉක්මවන විට මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ පමණක් එය 6.1 %ක් වීමයි. මහවැලි ව්‍යාපාරය යටතේ බෙදා දී ඇති මෙම ඉඩම්වලින් ඇතැම් ඒවායේ මුල් අයිතිකරුවන් වෙනුවට ඔවුන්ගේ දරුවන් පදිංචි වී සිටීම, ඔවුන්ට අලුතෙන් ඉඩම් ලැබීම ආදිය මෙයට හේතු වී ඇත.

2.5 සංඛ්‍යා සටහන : වී වගාවේ නිරතව සිටි කාලය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| ගොවිජන සේවා බලප්‍රදේශය | වී වගාවේ නිරතව සිටි කාලය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | 0<-<10 | 10=<-<20 | 20=<-<30 | 30=<- | |
| හිඟුරක්ගොඩ | 9.8 | 22.5 | 24.5 | 43.1 | 100.0 |
| මනම්පිටිය | 12.1 | 72.7 | 9.1 | 6.1 | 100.0 |
| මැදිරිගිරිය | 7.0 | 14.0 | 27.0 | 52.0 | 100.0 |
| සේවාගම | 4.8 | 29.5 | 22.9 | 42.9 | 100.0 |
| ඇලහැර-බකමූණ | 3.0 | 30.0 | 25.0 | 42.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | **7.3** | **33.6** | **21.7** | **37.4** | **100.0** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අධ්‍යයනයට ලක්වූ නියැදියේ ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව විග්‍රහ කිරීමේදී 67 %කට ආසන්න ප්‍රමාණයක් 1-10 වසර දක්වා අධ්‍යාපනය ලැබූ අය වන අතර, ඉන් ඉහළට අධ්‍යාපනය ලැබූවන්ගේ ප්‍රමාණය අනුක්‍රමයෙන් අඩුවී ගොස් උපාධිධාරීන්ගේ මට්ටමට එනවිට 0.4 % දක්වා අඩුවී ඇත (2.6 සංඛ්‍යා සටහන).

2.6 සංඛ්‍යා සටහන : අධ්‍යාපන මට්ටම අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| ගොවිජන සේවා බලප්‍රදේශය | අධ්‍යාපන මට්ටම | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | පාසල් නොගිය | 1-5 ශ්‍රේණි දක්වා | 6-10 ශ්‍රේණි දක්වා | සා/පෙ සමත් | උ/පෙ සමත් | උපාධිධාරී | |
| හිඟුරක්ගොඩ | 1.0 | 20.6 | 23.5 | 39.2 | 14.7 | 1.0 | 100.0 |
| මනම්පිටිය | 1.0 | 53.5 | 27.3 | 16.2 | 2.0 | 0.0 | 100.0 |
| මැදිරිගිරිය | 5.0 | 49.0 | 33.0 | 9.0 | 4.0 | 0.0 | 100.0 |
| සේවාගම | 2.9 | 29.5 | 25.7 | 31.4 | 9.5 | 1.0 | 100.0 |
| බකමූණ/ඇලහැර | 8.0 | 28.0 | 47.0 | 13.0 | 4.0 | 0.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | **3.6** | **36.0** | **31.2** | **21.9** | **6.9** | **0.4** | **100.0** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

### 2.3.2 අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගේ ආර්ථික පසුබිම

අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 83.1 %ක් තමන්ගේම ඉඩම්වල වගා කටයුතු සිදුකළ අතර, වී පොරොන්දුවට කුඹුරු වගා කරන ප්‍රතිශතය 11.8 %ක් විය. කුඹුරු උගසට ගත් ප්‍රමාණය 2.2 % ද, බද්දට ගත් ප්‍රමාණය 1.5 % ද, අඳ අයිතිය සහිත 1.1 % ද විය (2.7 සංඛ්‍යා සටහන). අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ සේවාගම ගොවිජන සේවා බලප්‍රදේශයේ ලක්ෂ උයන ග්‍රාම නිලධාරී වසමේ කුඹුරු ඉඩම් හිමියන් විශාල පිරිසක් වී වගාවෙන් ප්‍රමාණවත් ලාභයක් නොලැබෙන නිසා ඇතැම් කන්නවල වගා කිරීමෙන් වැළකී සිටින බවත්, නිවසේ පරිභෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණය පමණක් වගා කරන බවත් අනාවරණය විය. මෙයට අමතරව හිඟුරක්ගොඩ, සේවාගම සහ මැදිරිගිරිය ප්‍රදේශවල කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වී පොරොන්දු මත වගා කිරීම සඳහා ලබාදී ඇත.

2.7 සංඛ්‍යා සටහන : ඉඩම් අයිතිය අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය

| ගොවිජන සේවා බලප්‍රදේශය | ඉඩම් අයිතිය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | තනි අයිතිය | හවුල් අයිතිය | අඳ | බදු | උකස් | වී පොරොන්දුව | |
| හිඟුරක්ගොඩ | 79.3 | 0.8 | 0.0 | 1.7 | 2.5 | 15.8 | 100.0 |
| මනම්පිටිය | 82.0 | 0.8 | 2.9 | 4.1 | 2.4 | 7.8 | 100.0 |
| මැදිරිගිරිය | 85.0 | 0.0 | 0.0 | 1.2 | 0.0 | 13.8 | 100.0 |
| සේවාගම | 81.1 | 0.0 | 1.9 | 0.0 | 3.0 | 14.0 | 100.0 |
| ඇලහැර-බකමූණ | 88.6 | 0.0 | 0.9 | 0.4 | 3.1 | 7.0 | 100.0 |
| **සමස්ත නියැදියේ එකතුව** | **83.1** | **0.3** | **1.1** | **1.5** | **2.2** | **11.8** | **100.0** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් 95.7 %ක් තම ප්‍රධාන රැකියාව වශයෙන් වී වගාවේ නිරතවුවන් වන අතර 3.8% රජයේ සේවාවන්හි නියුක්ත වූවෝ වූහ. පෞද්ගලික අංශයේ රැකියා තම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 0.2 %ක් තරම් අඩු ප්‍රමාණයකි. පුහුණු ශ්‍රමිකයින් සංඛ්‍යාව 0.4%කි

නියැදිය, ගොවිජන සේවා බලප්‍රදේශ අනුව විමසනවිට ඇලහැර-බකමූණ ප්‍රදේශයේ 100%ම ප්‍රධාන රැකියාව වී ගොවිතැන වන අතර, මැදිරිගිරියේ එය 98% කි. නගරයට ආසන්නව පිහිටි හිඟුරක්ගොඩ ප්‍රදේශයේ 89%,මනම්පිටිය 94.9%, සහ සේවාගම 96.2% තරම් ඉහළ ප්‍රතිශතයක ප්‍රධාන රැකියාව වී ගොවිතැන වේ. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ රජයේ සේවයේ නියුතු ප්‍රතිශතය 10.8 % වුවත් මනම්පිටිය 3.0%, මැදිරිගිරිය 1.0% සහ සේවාගම 3.8% අඩු ප්‍රතිශතයක් රජයේ සේවයේ නියුතු වූවෝ වෙති.

මෙයට අමතරව මෙම නියැදියෙන් 40.3 % තම ද්විතියික රැකියාව වශයෙන් විවිධ අන්දමේ රැකියාවන්හි නිරත වන බව හෙළි විය. වී ගොවිතැන, රජයේ සහ පුද්ගලික අංශයේ අනියම් සහ තාවකාලික පදනමේ රැකියා, ස්වයං රැකියා, කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන අංශයේ කුලී කම්කරු, සිල්ලර ව්‍යාපාර, වෙනත් වාණිජ භෝග වගාවන්, පෙදරේරු, වඩුකාර්මික, පැස්සුම්කරු වැනි පුහුණු ශ්‍රමික රැකියා ඒ අතර විය. මෙම නියැදියේ 59.7 %ක් තම ද්විතියික රැකියාව පිළිබඳ සඳහන් කර නොමැත.

## 2.4 වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ සමාජ ආර්ථික පසුබිම

වී මිලට ගැනීමේ නිරත අතරමැදියන්ගේ නියැදිය මෙන්ම වී මෝල් හිමියන්ගේ නියැදිය 100 %ක් පුරුෂයින් විසින් නියෝජනය කරනු ලබයි. ඇතැම් වී මෝල්වල ක්‍රියාකාරී දායකත්වය කාන්තාවන් සතුවුවත්, අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබාදීමේදී ඔවුන් එය පැවසීමට අකමැතිවූ අතර ස්වාමිපුරුෂයන්ගේ හිමිකාරීත්වය සහ ක්‍රියාකාරීත්වය යටතේ වී මෝල් පවත්වා ගෙන යනු ලබන බව කාන්තාවන් පවසන ලදී. එමෙන්ම නිරීක්ෂණවලදී පෙනී ගියේ, එවැනි කාන්තාවන් වී මෝල් ආශ්‍රිතව සේවක පරිපාලනයට සම්බන්ධ වන අතරම පුරුෂ පක්ෂය වෙළඳපළ හා සම්බන්ධ කටයුතුවල ක්‍රියාකාරී වන බවයි.

වයස් කාණ්ඩ අනුව අතරමැදි ව්‍යාපාරිකයන් සලකා බැලීමේදී වැඩිම ප්‍රතිශතය වූ 34.2 % අවුරුදු 30 සිට 40 ට අඩු වයස් කාණ්ඩය තුළ නියෝජනය විය. අවුරුදු 30 සිට 50 ට අඩු මට්ටමේ වූ වයස් කාණ්ඩය තුළ මුළු නියැදියෙන් 63.1 %ක් නියෝජනය විය. මෙම ව්‍යාපාරයේ නිරත පිරිසේ අවු 30 ට අඩු කාණ්ඩය තුළ සහ අවුරුදු 60 හෝ හැටට වැඩි කාණ්ඩය තුළ නියෝජනය වන පිරිස අවම මට්ටමක පවතී. වී මෝල් හිමියන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් නියෝජනය වන්නේ අවුරුදු 40-50 කාණ්ඩය තුළ එය 47.4 % කි (2.8 සංඛ්‍යා සටහන).

2.8 සංඛ්‍යා සටහන : වයස් කාණ්ඩ අනුව වී මිලට ගැනීමෙහි නිරත අතරමැදියන්ගේ සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය

| වයස් කාණ්ඩය | ප්‍රතිශතය | |
|---|---|---|
| | අතරමැදියන් | වී මෝල් හිමියන් |
| 0 <- < 20 | 2.6 | 0.0 |
| 20 = < - <30 | 7.9 | 15.8 |
| 30 = < - <40 | 34.2 | 15.8 |
| 40 = < - <50 | 28.9 | 47.4 |
| 50 = < - <60 | 21.1 | 21.0 |
| 60 = < | 5.3 | 0.0 |
| එකතුව | 100.0 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අතරමැදි වෙළඳුන්ගේ සහ වී මෝල් හිමියන්ගේ අධ්‍යාපන මට්ටම අනුව විමසීමේදී මෙම කොටස් දෙකෙහිම වැඩි කොටසක් අ.පො.ස. (සා/පෙ) සමත් බව පෙන්නුම් කරනු ලබයි. පාසල් අධ්‍යාපනය නොලද පුද්ගලයින් මෙම කාණ්ඩ දෙකටම අයත් නොවන අතර වී මෝල් හිමියන්ගෙන් 81.6% අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ සමත්වී ඇත. අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 60.5% අ.පො.ස. (සා.පෙ) හෝ උසස් පෙළ සාමාර්ථය ලබා ඇත (2.9 සංඛ්‍යා සටහන).

2.9 සංඛ්‍යා සටහන : අධ්‍යාපන මට්ටම අනුව වී මිලට ගැනීම් නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය.

| අධ්‍යාපන මට්ටම | ප්‍රතිශතය | |
|---|---|---|
| | අතරමැදියන් | වී මෝල් හිමියන් |
| 1-5 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලැබූ | 5.3 | 0.0 |
| 6-10 ශ්‍රේණි දක්වා අධ්‍යාපනය ලැබූ | 34.2 | 15.8 |
| අපො.ස. (සා.පෙ) සමත් | 44.7 | 47.4 |
| අ.පො.ස. (උ.පෙ) සමත් | 15.8 | 34.2 |
| උපාධිධාරී | 0.0 | 2.6 |
| එකතුව | 100.0 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන් තම ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටි කාලය පිළිබඳව විමසීමේදී පෙනී යන්නේ ඔවුන් අතර ඉතා දිගු කාලයක් එම ව්‍යාපාරයේ නිරතව සිටින පිරිස අඩු බවයි. අවුරුදු 40-50 අතර කාලයක් වී මිලට ගැනීමේ නිරත අතරමැදියන් ලෙස කටයුතු කළ පිරිස එම නියැදියෙන් 2.6 %ක් වීමෙන් ඒ බව තහවුරු වේ. මෙය තවදුරටත් තහවුරු කරනු ලබන සාධකයක් වන්නේ, වී මිලට ගැනීමෙහි නිරතව සිටින කාලය අනුක්‍රමයෙන් වැඩිවීමත් සමග එහි නිරත පුද්ගලයින් ප්‍රමාණය අනුක්‍රමයෙන් අඩුවීමයි (2.10 සංඛ්‍යා සටහන). වී මෝල් හිමියන් සම්බන්ධයෙන් ද එම තත්ත්වය ඒ ආකාරයටම බලපා ඇති බව 2.10 සංඛ්‍යා සටහන අනුව පැහැදිලි වේ.

2.10 සංඛ්‍යා සටහන : ව්‍යාපාරයේ නිරතව සිටි කාලය අනුව වී මිලට ගැනීමේ නිරත අතරමැදියන් සහ වී මෝල් හිමියන්ගේ ව්‍යාප්තිය

| ව්‍යාපාරයේ නිරතව සිටි කාලය | ප්‍රතිශතය | |
|---|---|---|
| | අතරමැදියන් | වී මෝල් හිමියන් |
| 0 <- < 10 | 57.9 | 50.6 |
| 10 = < - <20 | 26.3 | 36.8 |
| 20 = < - <30 | 13.2 | 13.2 |
| 30 = < - <40 | 0.0 | 0.0 |
| 40 = < - <50 | 2.6 | 0.0 |
| එකතුව | 100.0 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

තුන්වන පරිච්ඡේදය

# අලෙවිකරණය

## 3.1 හැඳින්වීම

නිෂ්පාදනයේ සිට පාරිභෝජනය දක්වා වූ සියලුම කාර්යයන් අලෙවිකරණය තුළ අඩංගු වේ. එම ක්‍රියාවලිය තුළ නිෂ්පාදකයන් මෙන්ම, එකතුකරන්නන්, සැකසුම්කරුවන්, අපනයනකරුවන්, ප්‍රවාහකයන්, තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළෙඳුන් ද සිටින අතර ඒ එක් එක් පාර්ශවයන් තුළ මිලදී ගැනීම්, විකිණීම්, සැකසීම්, ඇසුරුම් කිරීම්, ප්‍රවාහනය කිරීම්, ගබඩා කිරීම් වැනි වූ කාර්යයන් ද සිදුවේ. මෙම සමස්ත ක්‍රියාවලිය අලෙවිකරණය ලෙස හැඳින්වේ. අලෙවිකරණ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ. එනම්,

1. අලෙවි පද්ධතියේ සංයුතිය (System organization)
2. අලෙවි පද්ධතියේ ක්‍රියාකාරීත්වය (Marketing system operation)
3. අලෙවි පද්ධතියේ ඇගයීම (Marketing system performance)

## 3.2 අලෙවි පද්ධතියේ සංයුතිය

අලෙවි පද්ධතියේ සංයුතිය තුළදී විවිධ අලෙවිකරණ කාර්යයන්ගේ නියැළී සිටින පාර්ශවයන්ගේ ගුණාංග සළකා බලනු ලැබේ. එයට අමතරව අලෙවි භාණ්ඩයේ අලෙවිකරණ රටාව සහ ඒ සඳහා වන තරගකාරීත්වයේ ස්වභාවය ද සලකා බලනු ලැබේ. වී සම්බන්ධයෙන් වන වෙළඳපළ ක්‍රම සංවිධානය පිළිබඳව සලකා බැලීමේදී ප්‍රදේශ අනුව අලෙවි ස්වරූපයේ වෙනසක් පවතිනවාක් මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශය යන මූලික සංවිධාන ක්‍රම දෙක තුළදී ද අලෙවිකරණයේ වෙනස්කම් පවතී.

එනම්, පෞද්ගලික අංශය තුළ ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ වී එකතු කරන්නා, පිටස්තර වී එකතු කරන්නා (Mobil trader) සහ වී මෝල්හිමියන් කටයුතු කරන අතර, රාජ්‍ය අංශය තුළ සමුපාකාරය, ගොවිජන සේවා මධ්‍යස්ථානය, සමුපකාර වී මෝල් සහ ස.තො.ස. වී මෝල් කටයුතු කරනු ලැබේ. රාජ්‍ය අංශය විසින් රජයේ සහතික මිලක් යටතේ වී මිලදී ගනු ලබන අතර පෞද්ගලික අංශය මගින් බොහෝවිට එයට සාපේක්ෂව අඩු මිලකට වී මිලදී ගනු ලබයි. එම මිල පෞද්ගලික අංශයේ ප්‍රබල වී මෝල්හිමියන් විසින් තීරණය කරනු ලබයි. එසේ වුවද මේ ආකාරයට තීරණය කරන මිලට සාපේක්ෂව වැඩි මිලකට වී මිලදී ගනු ලබන අවස්ථා ඇති අතර එය ප්‍රදේශය, ගුණාත්මකභාවය ආදිය මත පදනම් වේ. නමුත් රාජ්‍ය අංශය මෙවැනි සාධක සැලකිල්ලට ගෙන සහතික මිලට වඩා අඩුවෙන් වී මිලදී නොගන්නා අතර ඉහළ ප්‍රමිතිය, වී මිලදී ගැනීමට අවශ්‍ය වන මූලික සාධකය වේ.

### 3.2.1 අලෙවි මාර්ග

නිෂ්පාදනයක් අවසාන පාරිභෝගිකයා දක්වා ගමන් කරන්නේ කෙසේද? සහ ඒ සඳහා අලෙවිකරණ ක්‍රියාවලිය තුළ කටයුතු කරන එකතුකරන්නන්, ප්‍රවාහකයන්, සැකසුම්කරුවන්, අපනයනකරුවන් වැනි එක් එක් පාර්ශවයන්ගේ සහභාගීවීම කෙසේද? යන්න මෙහිදී සලකා බලේ. වී අලෙවිකරණ ක්‍රියාවලියේදී විවිධ අලෙවි පාර්ශවයන්ගේ හැසිරීම සහ ඔවුන්ගේ තරගකාරී ස්වභාවය මත වී අලෙවිකරණය සිදු වේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී සඳහා වන සංවිධාන අලෙවිකරණ ක්‍රමය ප්‍රදේශය අනුව විවිධත්වයක් ගනු ලබයි.. එනම්, අධ්‍යයනය සඳහා බඳුන් කළ ප්‍රදේශ අතුරින් ප්‍රවාහන, මහා මාර්ග, විදුලිය, දුරකථන ආදීවූ යටිතල පහසුකම් අවම සහ නගරයෙන් දුරස්ථ, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ මාතලේ වැනි දිස්ත්‍රික්කයන්ගේ මායිම්වලට සමීප වූ ප්‍රදේශවල (වීරාන, අසේලපුර, අතරගල්ලෑව, සිංහරාජපුර, බෙබිලාවැව) වෙළඳපළ ක්‍රම සංවිධානය සහ පොළොන්නරුව නගරයට සමීප ප්‍රදේශවල (ලක්ෂ උයන, හිගුරකබණ්ඩාරගම) වෙළඳපළ ක්‍රම සංවිධානය අතර විවිධත්වයක් පවතී. 3.1 රූප සටහනින් පොළොන්නරුව නගරයට ආසන්න ප්‍රදේශවල වී අලෙවි මාර්ග පෙන්නුම් කරනු ලබයි. මෙම රූප සටහන අනුව පොළොන්නරුව නගරය ආශ්‍රිත ප්‍රදේශවල අලෙවි මාර්ග ඉතා දීර්ඝ හෝ සංකීර්ණ නොවන බව පෙනේ. මන්ද




22213

භෞතික වශයෙන් ප්‍රවාහන, මහා මාර්ග, විදුලිය වැනි යටිතල පහසුකම් ඉහළ මට්ටමක පවතින හෙයින් අවසාන අලෙවි පුරුක සහ ගොවියා අතර විශාල පරතරයක් නොමැති හෙයිනි.

3.1 රූප සටහන

පොළොන්නරුව නගරය ආශ්‍රිතව
වී අලෙවි මාර්ග





මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2004

නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල ගොවීන් තම වී නිෂ්පාදන සෘජුවම ගමේ වී වෙළෙන්දෙකුට අලෙවි කිරීමට කටයුතු කරනු ලබයි. එබැවින් ගොවියාගේ සිට අවසාන අලෙවිකරණ අවස්ථාව දක්වාවූ අලෙවිකරණ ක්‍රියාදාමය තුළ භෞතිකමය වශයෙන් විශාල දුරස්ථභාවයක් (Physical distance) පෙන්නුම් කරන හෙයින්, ගොවියාට තම වී නිෂ්පාදන අවසාන අලෙවිකරණ අවස්ථාවට ළඟා කරවීම අපහසු වේ. ඒ තුළ විවිධ අලෙවි පාර්ශවයන් (Market partcipants) (එකතු කරන්නන්, ප්‍රවාහකයන්, සිල්ලර වෙළඳුන්, තොග වෙළඳුන්, සැකසුම්කරුවන්) අවසාන අලෙවිකරණ අවස්ථාව දක්වා කටයුතු මෙහෙයවීම කටයුතු කරනු ලබයි. එය අලෙවි මාර්ග ලෙස හැඳින්වේ. පොළොන්නරුව නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල වී අලෙවිකරණ නාලිකාව 3.2 රූප සටහනින් විස්තර කරනු ලබයි.

3.2 රූප සටහන


## පොළොන්නරුව නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල වී අලෙවි මාර්ග




මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය (2004)

3.3 රූප සටහන

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි මාර්ග




මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය (2004)

### 3.2.2. වෙළඳපළ හැසිරීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල ගණන් ප්‍රදේශය අනුව, තෙතමනය, අපද්‍රව්‍ය ප්‍රමාණය, මිශ්‍රිත බොල් ප්‍රමාණය සහ වෙනත් හේතූන් මත වෙනස්වීමට ලක්ව තිබේ. එහිදී වී මිල ගණන් වෙනස් වන්නේ වී කිලෝග්‍රෑමයක් සඳහා ශත 20 සිට රු.3.00 අතර මිල පරාසයක් තුළය. ප්‍රදේශ වශයෙන් සලකාබැලීමේ දී එගොඩපත්තුව ප්‍රදේශය (මනම්පිටිය ගොවිජන සේවා බලප්‍රදේශය) තුළ සකස් කරනු ලබන වීවල ගුණාත්මකභාවය ඉතා අඩුය. එනම් ගොවීන්ගෙන් 95 %ක් තරම් ප්‍රමාණයක් පඩංගු භාවිතා නොකරන අතර ඔවුන් වැලි කමතේ හෝ මහා මාර්ගය යොදා ගෙන අස්වනු සකස් කර ගනී. එබැවින් අස්වැන්නට එකතුවන ගල්/වැලි ප්‍රතිශතය ඉහළ මට්ටමක වන අතර, ඒවා ඉවත් කිරීම් ද සිදු නොකරයි. ගොවීන්ගෙන් 69 %ක් පමණ අඩු ගුණාත්මක භාවයක් සහිත වී තොග පෞද්ගලික අංශයට ඉදිරිපත් කරයි. එහිදී පෞද්ගලික අංශය තුළින් යම් ප්‍රමාණයකින් ගල්/වැලි සලකාබලා ඊට සාපේක්ෂව මිල අඩුකර මිලදී ගනී. එනම්, වී කිලෝග්‍රෑමයකින් මෙවැනි අවස්ථාවකදී (30%) සුලභ වශයෙන් ශත 60ක් හෝ ඊට වැඩි මිල අඩු කිරීමක් කරන අතර වෙළඳුන්ගෙන් 26% ක් පමණ ශත50-60 අතර ප්‍රමාණයකින් මිල අඩු කරනු ලබයි. මෙම තත්ත්වය ප්‍රදේශවල පවතින යටිතල පහසුකම්වල ප්‍රමාණය (මහා මාර්ග) නගරයේ සිට ඇති දුර ප්‍රමාණය ආදී සාධක මත ද වෙනස් වේ. එනම්, මඩකලපුව, ත්‍රිකුණාමලය, මාතලේ, අම්පාර වැනි දිස්ත්‍රික්කයන්ට මායිම්ව පිහිටි අසේලපුර, සිංහරාජපුර, අතරගල්ලෑව, බේබියාවැව ආදී තවත් බොහෝ ප්‍රදේශවල මිල ගණන් පොළොන්නරු නගරයට සමීපව

පිහිටි ලක්ෂ උයන, හිඟුරක බණ්ඩාරගම ආදී ප්‍රදේශවලට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. එනම්, 2002/2003 මහ සහ 2003 යල දෙකන්නයේ දී මනම්පිටිය ප්‍රදේශයේ වී කිලෝග්‍රෑමයක මිල ගණන් සමස්තයක් ලෙස රු. 10-12 ත් අතර මට්ටමක පැවති අතර හිඟුරක්ගොඩ, සේවාගම වැනි ප්‍රදේශවල මිල ගණන් සමස්තයක් ලෙස රු. 12-14 ත් අතර මට්ටමක විය. එවැනි මිල මට්ටමක් පැවතියේ පෞද්ගලික අංශය තුළ රජයේ සහතික මිල, වී කිලෝග්‍රෑමයක් සඳහා රු.13.50 ක්ව පැවතිය විටදීය. ඒ අනුව නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල වී කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල මට්ටමක හා නගරයට ආසන්න ප්‍රදේශවල මිල මට්ටම අතර රු.2/- ක වෙනසක් පවතී. ඒ සඳහා හේතුවී ඇත්තේ, ප්‍රවාහනය සඳහා වන ඉහළ පිරිවැයයි. එසේම වී වල අඩංගු තෙත ප්‍රමාණය මත මිල ගණන් අඩු කිරීම ද මෙයට බලපා ඇත. වෙළඳුන්ගෙන් 63 %ක් තෙත ප්‍රමාණය මත මිල අඩු කරයි. එනම් වී කිලෝග්‍රෑමයක මිලෙන් ශත 60ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අඩුකර වී මිල නියම කරනු ලබයි. තවත් අවස්ථාවලදී වෙළෙඳුන් විසින් වී නියමිත ප්‍රමිතියට වේලීම සඳහා අවශ්‍ය කරන පිරිවැය සැලකිල්ලට ගෙන, වී මිලදී ගනු ලබන අතර වෙළඳුන්ගෙන් 9% ක් පමණ දෙනා තෙත වී තොග සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලබයි. නමුත් මිශ්‍රිත බොල් ප්‍රමාණය මත වෙළෙඳුන් මිල ගණන් වෙනස්කර මිලදී නොගන්නා අතර එහිදී බොල් ඉවත්කර ඉදිරිපත් කරන ලෙසට උපදෙස්දීම (9%) හෝ නැතහොත් සමස්ත වී ප්‍රමාණයම ප්‍රතික්ෂේප කිරීම (91%) සිදු කෙරේ.

### 3.2.3 අලෙවි පාර්ශවයන්

අලෙවි පාර්ශවයන් ප්‍රධාන ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. එනම්, ඍජු අලෙවි පාර්ශවයන් සහ වක්‍ර අලෙවි පාර්ශවයන් වශයෙනි. මෙහිදී ගොවීන්, ගමේ වී එකතු කරන්නා, පිටස්තර වී එකතු කරන්නා මහා පරිමාණ වී මෝල්හිමියා, කුඩා පරිමාණ වී මෝල්හිමියා, සමුපකාරය, ගොවි සංවිධාන සහ ගොවිජන සේවා මධ්‍යස්ථානය ආදිය ඍජු අලෙවි පාර්ශවයන් ගණයට අයත් වන අතර මිලදී ගැනීම් හා අලෙවි කිරීම් ඇතුළත් ක්‍රියාවලිය සඳහා සහාය ලබාදෙන ප්‍රවාහකයන්, තැරැව්කරුවන් සහ කොමිස් වෙළෙන්ඳන් ආදිය වක්‍ර අලෙවි පාර්ශවයන් ගණයට අයත් වේ.

#### 3.2.3.1 ඍජු අලෙවි පාර්ශවයන්

වී අලෙවිකරණ ක්‍රියාදාමයේ මූලික පුරුක ලෙස ගොවීන් හඳුන්වාදිය හැකිය. ගොවීන් මූලික ලෙස ගමේ වී එකතු කරන්නාටම වී අලෙවි කිරීමට බොහෝවිට කටයුතු කරනු ලබයි. ගමක ප්‍රධාන වශයෙන් වී එකතු කරන්නන් දෙදෙනෙක් හෝ තිදෙනෙක් සිටින අතර, අලෙවිකරන අවස්ථාවේම මුදල් ගෙවීම, ගුණාත්මක බව දැඩිව පරීක්ෂා නොකිරීම,අලෙවි මධ්‍යස්ථානය ආසන්නයේ පිහිටා තිබීම යන කරුණු මත ගමේ වී එකතු කරන්නාට වී අලෙවි කිරීමට ගොවීන් පෙළඹේ (3.1 සංඛ්‍යා සටහන). මෙයට අමතරව ගමේ වී එකතු කරන්නන් කෘමිනාශක, පොහොර, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු සිල්ලර වෙළඳාම සිදුකරන අතරම වී මිලදී ගැනීම සිදුකරනු ලබයි. ඒ තුළින් ගොවියාට අවශ්‍ය මූල්‍යමය හා ද්‍රව්‍යමය ණය සපයාදීමට කටයුතු කරන අතර එමගින් කන්නය අවසානයේදී අස්වනු මිලදී ගැනීමට ද හැකිවේ. එනම්, ගොවීන් විසින් වී එකතු කරන්නන්ගෙන් විවිධ ණය සේවා පහසුකම් ලබා ගන්නා හෙයින් ඒ සඳහා හිලව් වශයෙන් ඔවුන් අස්වනු නෙළා අවසන්වනවාත් සමගම තම ණය හිමියන්ට වී අලෙවි කිරීමටද කටයුතු කරනු ලබයි.

ඊට අමතරව මිත්‍ර සම්බන්ධතා, විශ්වාසවන්තභාවය ප්‍රමාදයකින් තොරව අලෙවිකර ගැනීමේ පහසුව සහ වෙනත් විකල්ප අවස්ථා නොමැතිවීම, නාට්ටාමි කුලී දැරීමට සිදු නොවීම යන හේතු සාධක සඳහා ද ඉහළ ප්‍රතිශතයක දායකත්වයක් ලැබී තිබීම අනුව ගොවීන් වී අලෙවි කරනු ලබන්නේ ගමේ වී එකතු කරන්නාටය.

#### 3.2.3.2 වක්‍ර අලෙවි පාර්ශවයන්

පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ ක්‍රියාවලිය තුළ (විකුණුම් හා මිලදී ගැනීම් සම්බන්ධයෙන්) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කෙරෙන අලෙවි පාර්ශවය ලෙස තැරැව්කරුවන් හඳුන්වාදිය හැකිය. එනම්, මොවුන්ගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ගොවීන් හෝ වී මිලදී ගැනීමේ නිරත අතරමැදි වෙළෙන්ඳන් සහ වී මෝල්හිමියන් අතර වී විකිණීම හා වී මිලදී ගැනීම් සම්බන්ධයෙන් සමීප සම්බන්ධතාවයක් ගොඩ නැගීමයි. ඒ සඳහා තැරැව්කරුවන්ගේ මැදිහත්වීමක් නොවුයේ නම් මෙම ප්‍රධාන පාර්ශවයන් දෙක අතර සමීප සම්බන්ධතාවයක් නොමැත. පොළොන්නරුව

නගරයෙන් ඉතා දුරස්ථ ප්‍රදේශවල බොහෝදුරට අලෙවි කිරීම් හා මිලදී ගැනීමේ ගනුදෙනු සිදුවන්නේ තැරැව්කරුවන් හරහාය. තැරැව්කරුවන් විසින් වී අලෙවි කිරීමට අදාළ සියලු ගනුදෙනු සිදු කරනු ලබන ස්ථානය වන්නේ පොළොන්නරුව කදුරුවෙල නගරයයි. කදුරුවෙල නගරයේ තැරැව්කරුවන් 27 දෙනෙක් කටයුතු කරනු ලබන අතර ඔවුන් සමහරෙක් මෙය පාරම්පරිකව කරගෙන එන රැකියාවක් ලෙස සිදු කරනු ලබන අතර තවත් සමහරෙක් අමතර ආදායම් මාර්ගයක් ලෙස ද පවත්වාගෙන යනු ලබයි. මෙහිදී වී මෝල්හිමියාට තැරැව්කරුවන් හරහා මිලට ගනු ලබන එක් වී ලොරියක් (කිලෝග්රෑම් 6500) සඳහා රු.600/= ක මුදලක් ගෙවීමට සිදුවේ.එයට අමතරව වී හිමියන්ට එක් වී ලොරියක් සඳහා රුපියල් සියයක මුදලක් තැරැව්කරුවන් වෙත ගෙවීමට සිදුවේ. මේ අනුව එක් වී ලොරියකින් තැරැව්කරුවන් සාමාන්‍යයෙන් රුපියල් හත්සියයක මුදලක් උපයා ගනු ලබයි. කදුරුවෙල නගරයට වී ලොරි වැඩි වශයෙන් පැමිණෙන දිනවල සාමාන්‍යයෙන් මෙම තැරැව්කරුවෙකුගේ සාමාන්‍ය දෛනික ආදායම රුපියල් 7,000-15,000 අතර වේ. තැරැව්කරුවන් විසින් කදුරුවෙල නගරයේදී වී තොගයක් සඳහා මිල නියම කරනු ලබන්නේ වී මෝල්හිමියන් විසින් දෛනිකව තීරණය කර ඇති මිල ගණන්වලට වඩා රු.600/=ක මුදල් ප්‍රමාණයක් අඩුවෙනි. නමුත්, කදුරුවෙල නගරයට අඩු වී ලොරි ප්‍රමාණයක් පැමිණෙන දිනයන්ගේ තැරැව්කරුවන් අතර තරඟකාරීත්වයක් ගොඩනැගෙන අතර එහිදී ඔවුන් තම රු.600 හි ලාබ තීරුව අඩුකර වී ලොරි හිමියන්ට මිල භාරදෙනු ලබයි. මොවුන්ගේ සම්බන්ධතාවයෙන් බැහැරව ගොවීන්ට හෝ අතරමැදි වෙළෙඳුන්ට මෙම ප්‍රදේශය තුළදී වී මොල්හිමියන්ට වී අලෙවි කිරීමේ දුෂ්කරතාවක් පවතී. කෙසේ වුවද කදුරුවෙල ප්‍රදේශයේ වී මෝල් හිමියන් සමග සෘජු සම්බන්ධතා පවතින අතලොස්සක් වන ගොවීන්ට සහ අතරමැදි ව්‍යාපාරිකයන්ට මෙම තත්ත්වය බලපානු නොලැබේ.

අලෙවිකරණ ක්‍රියාවලිය තුළ ප්‍රවාහකයින්ගේ කාර්යභාරය වැදගත් වේ. එනම් ගොවිපළේ සිට වෙළඳපළ දක්වා වූ ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහකයින් අවශ්‍ය වේ. ගොවිපළ සිට ගොවි නිවස දක්වා වූ ප්‍රවාහන කටයුතු සඳහා ගොවීන් බහුල ලෙසම යොදා ගනු ලබන්නේ රෝද දෙකේ ට්‍රැක්ටරය හෝ රෝද හතරේ ට්‍රැක්ටරය යි. ගොවීන් සුළු පිරිසකට ප්‍රවාහන මාධ්‍යයන්හි අයිතිය ඇති අතර නැතහොත් කුලියට ලබා ගනු ලැබේ. කුඹුර සහ ගොවි නිවස ද, ගොවි නිවස සහ අලෙවි මධ්‍යස්ථානයද ඉතා සමීපයේ පිහිටා ඇති විට බයිසිකලය හෝ ශ්‍රමය උපයෝගී කරගෙන වී ප්‍රවාහනය කරනු ලැබේ. ගොවීන් වී අලෙවි කිරීමේදී වෙළඳ මධ්‍යස්ථානවලට ද අලෙවි කරන අතර එහිදී ඔවුන් තමන් සතු රෝද දෙකේ හෝ රෝද හතරේ ට්‍රැක්ටරය උපයෝගී කර ගනිමින් වී ප්‍රවාහනය කරනු ලැබේ. නැතහොත් වී මිලදී ගන්නන් සතු ලොරි, වී මිලදී ගැනීම සඳහා ගොවි නිවෙස් වෙත පැමිණේ.

වී අලෙවිකරණ ක්‍රියාදාමය තුළ ඉතා වැඩි ප්‍රමාණයක භූමිකාවක් නිරූපණය කරනු ලබන්නේ පිටස්තර වී එකතු කරන්නාය. එනම් ගොවීන්ගේ වී තොග අලෙවි කර ගැනීම සඳහා තුඩු දෙන විවිධ හේතු සාධක මත වැඩිම වටිනාකමක් ලැබෙන්නේ පිටස්තර වී එකතු කරන්නාටය. පිටස්තර වී එකතු කරන්නනෙක් ලෙස මූලිකව හඳුන්වන්නේ, සලකා බලනු ලබන ගමින් බැහැරව වී මිලදී ගැනීමේ කටයුතුවල නිරත වී සිටින ව්‍යාපාරිකයෙකුය. මොහු ව්‍යාපාරික වශයෙන් යම් ස්ථාවරත්වයක් ගොඩනගාගත් පුද්ගලයෙකි. මෙවැනි ව්‍යාපාරිකයෝ එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තුළ අවම වශයෙන් දෙදෙනෙකුවත් සිටිති. මොවුන් ගොවීන් සඳහා අවශ්‍ය සියළුම ආකාරයේ ණය සේවා පහසුකම් සහ අනෙකුත් ආකාරයේ විවිධ පහසුකම් සපයනු ලබයි. එනම්, ප්‍රදේශයේ ව්‍යාපාරික වශයෙන් ප්‍රබල ශක්තියක් ගොඩ නගා ගෙන ඇති බැවින් ගොවීන්ට දෛනික ජීවිතයේදී අවශ්‍යවන භාණ්ඩ හා සේවා සපයනු ලබනවා සේම ඒ සඳහා කිසිදු ගිවිස ගැනීමක් මුලදී ඇති කර ගැනීමද නොකරයි. 3.1 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන ආකාරයට අලෙවි පාර්ශවයක් ලෙසින් ගමේ වී එකතු කරන්නා තෝරා ගැනීමේදී ඉහළ මිලක් ලැබීම යන සාධකය බලපා ඇත්තේ ගොවීන්ගෙන් 1.0% - 1.6%ත් අතර ප්‍රතිශතයකට පමණි. මේ සඳහා හේතු වී ඇත්තේ වගා කාලය සහ අස්වනු නෙළීම අතරතුර කාලයේදී ගොවීන් විසින් මුදල්මය සහ ද්‍රව්‍යමය වශයෙන් ගමේ වී එකතු කරන්නාගෙන් ලබා ගන්නා ලද ණය මුදල් පියවීම සඳහා ඔවුන් වෙතම වී අලෙවි කිරීමට ගොවියාට සිදු වීමයි.

මේ ආකාරයට වී අලෙවි කිරීමේදී සමස්ත ගොවීන්ගෙන් 65% ක් අස්වනු නෙළූ විගසම ද, ගොවීන්ගෙන් 17%ක් අස්වනු නෙළා මාසයක් ඇතුළත ද අස්වනු නෙළා මාස 2 ක් ඇතුළත ගොවීන්ගෙන් 11%ක් ද, අස්වනු නෙළා මාස තුනක් ඇතුළත ගොවීන්ගෙන් 5%ක් ද, තම වී අලෙවි කරනු ලබයි. අස්වනු නෙළා මාස 3ට වැඩි කාල පරිච්ඡේදයක් තබා ගනිමින් වී අලෙවි කරනුයේ ගොවීන්ගෙන් 2%ක් පමණි. මේ අනුව සලකා බැලීමේදී ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයකට ලැබෙන්නේ සාපේක්ෂ ලෙස අඩු මිලකි. 3.1 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන ආකාරයට ඉහළ මිලක්

බලාපොරොත්තුවෙන් පිටස්තර වී එකතු කරන්නාට වී අලෙවි කිරීම සම්බන්ධයෙන් මහ කන්නයේදී 22%ක් ද, යල කන්නයේදී 20%ක් ද දායකත්වය ලැබී තිබුණු අතර සමූපකාරයට ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී අලෙවි කිරීම යන සාධකය සඳහා ලැබෙන්නේ මහ කන්නයේදී 74% සහ යල කන්නයේදී 50% දායකත්වයකි. එනම් පෞද්ගලික අංශය තුළ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් ගොවීන් වී අලෙවි කරන්නේ ප්‍රධාන වශයෙන්ම පිටස්තර වී එකතු කරන්නෙකුට වන අතර රාජ්‍ය අංශය තුළ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් සමූපකාරයට, ගොවි සංවිධාන සහ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට වී අලෙවිකර තිබුණි.තවද ප්‍රවාහන පහසුකම් සැපයීම මත වී අලෙවි කිරීම සඳහා 25% ක දායකත්වයක්ද, මිලදී ගනු ලබන අවස්ථාවේම මුදල් ගෙවීම සම්බන්ධව මහ කන්නයේදී 29% සහ යල කන්නයේදී 26% දායකත්වයක් පිටස්තර වී එකතු කරන්නන්ට ලැබී තිබුණි. එනම් මොහු අවශ්‍ය මිලදී ගැනීම් සිදුකිරීම සඳහා තම ව්‍යාපාරය සතු ලොරි/ට්‍රක් රථ ආදිය පහසුකම් යොදවයි. එනම් වී මිලදී ගැනීම සඳහා ජංගම සේවාවන් පවත්වාගෙන යනු ලබයි. මෙම පිටස්තර වී එකතු කරන්නෝ ව්‍යාපාරික වශයෙන් සිල්ලර වෙළඳාම සමග වී මිලදී ගැනීම හෝ වී මිලදී ගැනීම් කටයුතුවල පමණක්ම නියැලී සිටින්නහු ද වේ.

වී අලෙවිකරණ ක්‍රියාවලියේ අවසාන අලෙවි පාර්ශවය ලෙස මහා පරිමාණ වී මෝල් හිමියන් හඳුන්වා දියහැකිය. එනම්, රාජ්‍ය අංශයේ බොහොමයක් අතරමැදි අලෙවි පාර්ශවයන් මෙන්ම පෞද්ගලික අංශයේ වී අලෙවි පාර්ශවයන් ද අලෙවි කරනු ලබන්නේ අවසාන ලෙස මහා පරිමාණ වී මෝල්හිමියන්ටය (3..3 රූප සටහන). වී මෝල්හිමියන්ගෙන් 24% ක් පමණ වී වගා කිරීම ද්විතියික රැකියාව ලෙස පවත්වා ගෙන යනු ලබන අතර 87% ක් පමණ අවුරුදු 20 ක පමණ කාලයක් තුළ සහල් සැකසීමේ කටයුතුවල නිරතවූවන් වේ. සහල් සැකසීම (වී මෝල) පරම්පරාවෙන් පවත්වා ගෙන යනු ලබන ප්‍රමාණය 11%ක් පමණ වන අතර 60% ක ප්‍රමාණයක් අමතර ආදායම් මාර්ගයක් ලබාදෙන රැකියාවක් ලෙස සහල් සැකසීමේ කටයුතුවල නිරතව සිටිනු ලැබේ. නමුත් මෙම කර්මාන්තයට පිවිසීමේදී පවතින ප්‍රධාන බාධක ලෙස විශාල මූලික ප්‍රාග්ධනයක් අවශ්‍යවීම (20%), වෙළඳපළ පිළිබඳ අවිනිශ්චිතතාව (22%) මහා පරිමාණ වී මෝල් හිමියන් සමග තරග කිරීමේ අපහසුව (18%), යන කාරණා හඳුනාගත හැකි විය. මෙහි මහා පරිමාණ වී මෝල් හිමියන් මෙන්ම කුඩා පරිමාණ වී මෝල් හිමියන් ද වන හෙයින් ඔවුන්ට තරගකාරිත්වයකට මුහුණ පෑමට සිදුව තිබේ. එහිදී වී විකුණුම්කරුවන් සඳහා එකවර මුදල් ගෙවීම (47%), ණය අතමාරු ආදිය ලබාදීම (16%), සහ ප්‍රවාහන පහසුකම් සැපයීම (10%) ආදී උපක්‍රම භාවිතා කිරීමට සිදුවී තිබේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මෝල්හිමියන් විසින් ගොවීන්ගෙන් 37.5% ද, දිස්ත්‍රික්කය තුළ වී එකතු කරන්නන්ගෙන් 31% ද, දිස්ත්‍රික්කයෙන් බැහැර වී එකතු කරන්නන්ගෙන් 13% ද තැරැව්කරුවන්ගෙන් 18.5% ද වී මිලදී ගනු ලැබේ. වී මිලදී ගැනීම සඳහා වී මෝල් හිමියන්ගෙන් 43% ක ප්‍රතිශතයක් ණය පහසුකම් ලබා ගන්නා අතර ණය පහසුකම් ලබා නොගන්නා 57% ප්‍රමාණය, ව්‍යාපාරයේ ලාභ යොදා ගැනීම (21%) අතමාරු ලබා ගැනීම (21%) හා තමා සතු ඉතුරුම් (38%) අරමුදල් ලෙස යොදා ගැනීම සිදු කරනු ලබයි.

3.1 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් වී අලෙවි කිරීම සඳහා විවිධ අලෙවි පාර්ශවයන් තෝරා ගැනීම

| අලෙවි පාර්ශවයන් | ගමේ වී එකතු කරන්නා | | පිටස්තර වී එකතු කරන්නා | | වී මොල් හිමියා | | සමූපකාරය | | ගොවි සංවිධාන | | ගොවිජන සේවා මධ්‍යස්ථානය | | වෙනත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තෝරා ගැනීමට හේතු | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ |
| ඉහළ මිලක් ලබාගත හැකිවීම | 1.6 | 1.0 | 22.1 | 20.3 | 11.3 | 6.3 | 74.4 | 50.0 | 50.0 | 75.0 | 57.1 | 70.0 | 100.0 | 100.0 | 14.5 | 10.5 |
| ප්‍රවාහන පහසුකම් සැපයීම | 6.1 | 6.0 | 24.6 | 24.8 | 1.9 | 2.4 | 2.3 | 3.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 12.5 | 11.7 |
| ගුණාත්මක බව දැඩිව පරීක්ෂා නොකිරීම | 21.6 | 20.4 | 14.9 | 14.5 | 25.9 | 23.6 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 18.1 | 18.0 |
| ණය ලබා ගැනීමට හැකිවීම | 8.8 | 11.9 | 1.8 | 2.9 | 3.1 | 4.7 | 6.9 | 6.3 | 50.0 | 25.0 | 28.6 | 20.0 | 0.0 | 0.0 | 5.6 | 8.0 |
| නෑදෑ මිත්‍ර සබඳතා | 1.4 | 1.2 | 0.4 | 0.5 | 1.9 | 1.6 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 1.0 | 1.0 |
| කෘෂි යෙදවුම් සැපයීම | 3.7 | 5.2 | 1.9 | 3.2 | 2.5 | 3.9 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 2.7 | 4.1 |
| ආසන්නයේ පිහිටා තිබීම | 21.7 | 21.1 | 1.0 | 1.6 | 15.0 | 18.1 | 5.8 | 21.9 | 0.0 | 0.0 | 14.3 | 10.0 | 0.0 | 0.0 | 12.3 | 4.1 |
| විකල්පයක් නොමැතිවීම | 0.6 | 0.9 | 0.1 | 0.0 | 1.3 | 0.8 | 0.0 | 3.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.5 | 0.6 |
| විශ්වාසවන්ත බව | 2.0 | 1.9 | 1.3 | 1.8 | 3.8 | 0.8 | 2.3 | 3.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 1.9 | 2.3 |
| කම්කරු කුලී ගෙවීමට සිදු නොවීම | 3.0 | 4.5 | 3.0 | 4.7 | 3.1 | 3.1 | 3.5 | 3.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 3.0 | 4.3 |
| අලෙවියේදී ප්‍රමාද නොවීම | 0.2 | 0.3 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.1 | 0.2 |
| අලෙවි කළ විගස මුදල් ගෙවීම | 28.9 | 25.4 | 28.6 | 25.6 | 30.6 | 31.5 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 27.3 | 25.1 |
| හදිසි අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීම | 0.2 | 0.2 | 0.0 | 0.0 | 0.6 | 0.8 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.2 | 0.2 |
| ගිවිසුම් අනුව | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 1.2 | 3.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.1 | 0.1 |
| බීජ සඳහා අලෙවිය | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 1.2 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.1 | 0.0 |
| වාර්තා නොවීම | 0.0 | 0.0 | 0.1 | 0.0 | 0.0 | 0.0 | 2.3 | 6.3 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.2 | 0.3 |
| එකතුව | 1.00.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

මූලාශ්‍රය : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ සමීක්ෂණය - (2004)

## 3.3 අලෙවි පද්ධතියේ ක්‍රියාකාරීත්වය (Marketing system operation)

අලෙවි පද්ධතියේ ක්‍රියාකාරීත්වය ප්‍රධාන ලෙස කොටස් තුනකට බෙදිය හැක. එනම්,

1. හුවමාරු කාර්ය (Exchange function)
2. බෙදා හැරීමේ කාර්ය (Distribution function)
3. පහසුකම් සැපයීමේ කාර්ය (Facilitating function)

### 3.3.1 හුවමාරු කාර්යය
**ගොවීන් විසින් වී අලෙවි කිරීම**

හුවමාරු කාර්යය ප්‍රධාන ලෙස මිලදී ගැනීම් සහ විකිණීම් ක්‍රියාවලින්ගෙන් සමන්විත වේ. අධ්‍යයනයට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනයෙන් 83%ක් වෙළෙඳපොළ අතිරික්තය වේ. එය ගොවිජන සේවා බලප්‍රදේශ සහ කන්න අනුව 3.2 සංඛ්‍යා සටහනින් දැක්වේ. 3.2 සංඛ්‍යා සටහන අනුව අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව මනම්පිටිය ප්‍රදේශයේ අසුවනු නෙළූ විගස වී අලෙවිය ඉතා ඉහළ අගයක් ගන්නා අතර හිඟුරක්ගොඩ ප්‍රදේශයේ අස්වනු නෙළූ විගස වී අලෙවිය සාපේක්ෂව අඩු මට්ටමක පවතී.

**3.2 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෙළෙඳපොල සඳහා වන වී අතිරික්තය ( ගොවිජන සේවා බලප්‍රදේශ සහ කන්න අනුව )**

| ගොවිජන සේවා බල ප්‍රදේශය | මහ කන්නය ( මුළු නිෂ්පාදනයේ % ලෙස) | | | යල කන්නය (මුළු නිෂ්පාදනයේ % ලෙස) | | |
|---|---|---|---|---|---|---|
| | අස්වනු නෙළා මාස තුනක් තුළ විකුණූ ප්‍රමාණය | වී අලෙවිය සඳහා අස්වනු නෙළා මාස තුනකට වැඩි කාලයක් තබාගත් ප්‍රමාණය | සම්පූර්ණ වෙළෙඳපොළ අතිරික්තය | අස්වනු නෙළා මාස තුනක් තුළ විකුණූ ප්‍රමාණය | වී අලෙවිය සඳහා අස්වනු නෙළා මාස තුනකට වැඩි කාලයක් තබාගත් ප්‍රමාණය | සම්පූර්ණ වෙළෙඳපොළ අතිරික්තය |
| හිඟුරක්ගොඩ | 50.3 | 37.6 | **87.9** | 53.0 | 34.4 | **87.4** |
| මනම්පිටිය | 74.1 | 4.5 | **78.6** | 72.7 | 6.8 | **79.5** |
| මැදිරිගිරිය | 57.2 | 21.4 | **78.6** | 56.2 | 21.1 | **77.3** |
| සේවාගම | 57.5 | 26.7 | **84.2** | 54.7 | 29.7 | **84.4** |
| ඇළහැර/ බකමූණ | 59.1 | 22.8 | **81.9** | 58.0 | 19.3 | **77.3** |
| **එකතුව** | **57.9** | **25.3** | **83.2** | **57.5** | **25.0** | **82.5** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

මිලදී ගැනීම් සහ විකිණීම් ක්‍රියාවලියෙන් සමන්විත වී අලෙවිකරණ ක්‍රියාවලියේදී ගොවීන් විසින් කමත, ගොවි නිවස, වෙළඳ මධ්‍යස්ථානය සහ වී මෝල් යන ප්‍රධාන ස්ථානවලදී වී අලෙවිකර තිබුණි. මෙවැනි විවිධ ස්ථානවලදී වී අලෙවි කිරීම සඳහා ගොවීන් විසින් සලකා බලනු ලබන හේතු සාධක කිහිපයක් පැවති අතර ඒ අනුව ගොවීන් අපේක්ෂා කළේ කුමක්ද? යන්න හඳුනාගත හැකිය. වී අලෙවි කිරීම සඳහා ගොවීන් විසින් අලෙවි මධ්‍යස්ථානය තෝරා ගැනීමේදී සලකා බැලූ සියලු සාධක අතුරින් 45% ක දායකත්වයක් ලැබී තිබුණේ පහසුවෙන් වී අලෙවි කර ගැනීමට හැකිවීම යන කාරණයයි. 30% ක් වෙනත් විකල්පයක් නොමැතිකම මත වෙළඳ මධ්‍යස්ථානයට වී අලෙවිකරණ බවට තීරණය වී තිබුණි. වී අලෙවි කල විගස මුදල් ගෙවීම, අත්‍යවශ්‍යවූ විට වී තොග ඉදිරිපත් කළ හැකිවීම, කිරුම් මිණුම් පිළිබඳ විශ්වාසවන්තභාවය, ප්‍රවාහන වියදම් නොමැතිවීම ආදී කාරණා වෙළඳ මධ්‍යස්ථානවලට ගොවීන් වී අලෙවි කිරීමේදී නොසළකා තිබුණි. ණය ලබා ගැනීමට හැකිවීම, ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම සහ නෑදෑ මිත්‍ර සම්බන්ධතා යන

කාරණා සඳහා ලැබී තිබුණේ 8% ක පමණ දායකත්වයකි. ඒ අනුව වෙළඳ මධ්‍යස්ථානවලට වී අලෙවි කිරීමේදී ගොවීන් සලකා බලනු ලබන ප්‍රධානම සාධකය ලෙස ගම්‍ය වන්නේ "අලෙවි කරගැනීමේ පහසුවයි".

ගොවීන් විසින් "වී මෝල", වී අලෙවි ස්ථානයක් ලෙස තෝරා ගෙන තිබූ අතර එය තෝරා ගැනීම සඳහා බලපානු ලැබූ සාධක අතුරින් ප්‍රධාන දායකත්වයක් ලැබී තිබුණේ ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම (37 %) සහ වෙනත් විකල්පයක් නොමැතිවීම (37 %) යන කරුණු සඳහාවේ. හිතවත්කම් සහ ඥාති සබඳතා මත වී අලෙවිකිරීම සඳහා වී මෝල තෝරා ගනු ලබන පිරිස 9.3%කි.

කමත, වී අලෙවි කිරීමේ ස්ථානයක් ලෙස ගොවීන් විසින් ප්‍රධාන ලෙස තෝරා ගෙන තිබුණේ වියදම් අඩුවීම (36%) සහ ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම (39%) යන කාරණා මතය. ගබඩා පහසුකම් අඩුවීම (1.6%), ඇසුරුම් ලබා ගැනීමේ අපහසුතා (8.1%), මිත්‍ර සම්බන්ධතා (12.9%), ණය පියවීමට හැකිවීම (1.6%) ඇතුළු අනෙකුත් කාරණා "කමත" වී අලෙවි ස්ථානයක් ලෙස තෝරා ගැනීමේදී සැලකිල්ලට ගනු ලබන අනෙකුත් කරුණු වේ.

"ගොවි නිවස" වී අලෙවි කර ගැනීම සඳහා තෝරා ගත් ස්ථානයක් ලෙස සලකා බැලීමේදී ඒ සඳහා හේතු වූ සාධක අතර වියදම් අඩුවීම (31%), මිලදී ගන්නන් නිවසට පැමිණීම (35%) යන කාරණා ප්‍රධානවී තිබුණි. ඊට අමතරව සියලු කාරණා අතුරින් 17% ක දායකත්වයක් කේවල් කිරීමේ හැකියාව මත ගොවි නිවසේදී වී අලෙවි කර ගැනීමට හැකිවීම බලපා තිබුණි. ගොවි නිවසේදී වී අලෙවි කිරීම සඳහා විකල්පයක් නොමැතිකම, ප්‍රවාහන පිරිවැය නොමැතිවීම, ණය ලබාගෙන තිබීම, ඉහළ මිලක් ලබා ගත හැකිවීම යන කාරණා හේතු සාධකවී නොතිබුණි.

තවද මෙහිදී ගොවීන්ගෙන් වී අලෙවිකරණ කාලය පිළිබඳවද සලකා බැලීම වැදගත් වේ. එහිදී ගොවීන්ගෙන් 66% ක් පමණ වී අලෙවි කර තිබුණේ අස්වැන්න නෙළූ විගසය. එනම්, ගොවීන් කවර හේතුවක් මත කුමන අලෙවි ස්ථානයක් තෝරා ගනු ලැබුවද, අස්වනු නෙළූ විගස ගොවීන් විශාල ප්‍රමාණයක් වී අලෙවි කිරීම සිදුකර ඇති බැවින් ඔවුන්ට සාපේක්ෂව ලැබී තිබුණේ පහළ මිලකි. ගොවීන්ගෙන් 15% ට ආසන්න ප්‍රමාණයක් අස්වනු නෙළා මාස දෙකක් ඇතුළත වී අලෙවිකර තිබූ අතර ඔවුනට ලැබී තිබුනේද රජයේ සහතික මිලට (රු.13.50) සාපේක්ෂව අඩු මිලකි. අස්වනු නෙළා මාස තුනක කාලයක් ගබඩාකර තබාගෙන වී අලෙවිකර තිබුණේ ගොවීන්ගෙන් 2% ක් පමණ වන හෙයින් සමස්ත ගොවීන්ගෙන් 98%කටම වී අලෙවිකර ගැනීම තුළින් ලබාගත හැකිව ඇත්තේ සාපේක්ෂව අඩු මිලකි.

**3.3 සංඛ්‍යා සටහන : අස්වනු නෙළූ විගස වී අලෙවි කිරීමට හේතු**

| හේතු | ගොවිජන සේවා මධ්‍යස්ථානය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | හිඟුරක්ගොඩ | මනම්පිටිය | මැදිරිගිරිය | සේවාගම | බකමූණ | |
| ණය පියවීමට | 28.5 | 32.1 | 27.6 | 25.8 | 28.4 | 28.5 |
| හදිසි මුදල් අවශ්‍යතා | 53.9 | 42.4 | 46.3 | 48.4 | 53.5 | 48.6 |
| ගබඩා පහසුකම් නොමැතිවීම | 3.1 | 6.2 | 5.4 | 4.2 | 5.6 | 4.9 |
| ඉහළ මිලක් අපේක්ෂා කිරීම | 10.0 | 14.2 | 15.3 | 13.9 | 10.4 | 12.9 |
| ඇසුරුම් මලු නාස්තිය වැළැක්වීම | 3.1 | 4.7 | 5.4 | 4.6 | 1.7 | 4.0 |
| අඩු වී ප්‍රමාණයක් නිෂ්පාදනය | - | - | - | 0.8 | - | 0.2 |
| නාස්තිය වැළැක්වීම | 0.4 | - | - | 1.5 | 0.4 | 0.5 |
| බිත්තර වී සඳහා | 0.4 | - | - | 0.4 | - | 0.2 |
| වෙනත් | 0.4 | 0.4 | - | 0.4 | - | 0.2 |
| **එකතුව** | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

අලෙවිකරණ කාලය අනුව මෙසේ අස්වනු නෙළූ විගස ගොවීන් වී අලෙවි කිරීම සඳහා හේතු සාධක ගණනාවක් බලපා ඇති අතර ඒ අතුරින් ප්‍රබල සාධකය බවට පත්ව තිබුණේ, ණය පියවීමට සහ වෙනත් අවශ්‍යතා සඳහා වූ

හදිසි මුදල් අවශ්‍යතාව (48.6%)යන සාධකයයි. ඊට අමතරව ලබාගත් ණය පියවීම (28.5%) යන කාරණය ද අස්වනු නෙළූ විගස ගොවීන්ගේ වී අලෙවි කිරීම සඳහා හේතු සාධක වී තිබූ අතර ගබඩා පහසුකම් හිගකම, වැඩි මිලක් ලබා ගැනීමට අපේක්ෂා කිරීම සහ ඇසුරුම් මලු නාස්තිවීම යන කාරණා සැලකිය යුතු හේතු සාධක නොවීණි. නමුත් 11.6% ක දායකත්වයක් වෙළඳපළ අවිනිශ්චිතතාවය මත අස්වනු නෙළූ විගස වී අලෙවි කිරීමට කටයුතු කිරීම සඳහා දායකවී තිබුණි

ප්‍රවාහන පහසුකම් සැපයීම, අත්පිට මුදල් ගෙවීම ගුණාත්මක බව දැඩිව පරීක්ෂා නොකිරීම, ණය ලබා ගැනීමේ හැකියාව, නෑදෑ මිත්‍ර සම්බන්ධතා, කෘෂි යෙදවුම් ලබා ගැනීමට හැකිවීම, ආසන්නයේ පිහිටා තිබීම, විශ්වාසවන්ත භාවය, අලෙවි කර ගැනීමේ පහසුව යනාදී විවිධ හේතු මත පදනම්ව ගොවීන් වැඩි ප්‍රතිශතයක් වී අලෙවි කර තිබුණේ ගමේ වී එකතු කරන්නාට සහ පිටස්තර වී එකතු කරන්නන්ටය. එනම් පෞද්ගලික වෙළඳුන්ටය. පෞද්ගලික අංශයට වී අලෙවි කිරීම සඳහා ගොවීන්ගෙන් ඉහළ දායකත්වයක් ලැබී ඇති නමුත් රාජ්‍ය අංශයේ සමුපකාරය, ගොවිජන සේවා මධ්‍යස්ථානය ආදිය තුළින් ස්ථාවර මිලක් මත වී මිලදී ගත්ත ද, ඒ සඳහා ඉහළ දායකත්වයක් ලැබී නැත. ඒ බව 3.3 සංඛ්‍යා සටහනින් පැහැදිලි වේ. ඒ අනුව රාජ්‍ය අංශයට සාපේක්ෂව පෞද්ගලික අංශයට වී අලෙවි කිරීම සඳහා වැඩි දායකත්වයක් ලැබී ඇතිබව අනාවරණය වේ.

3.4 සංඛ්‍යා සටහන : වී මිල ගණන් තීරණය කිරීමේ ස්වභාවය

| ගොවිජන සේවා බල ප්‍රදේශය | වෙළෙන්දා විසින් % | ගොවියා විසින් % | ගොවියා සහ වෙළෙන්දා සාකච්ඡා කර % | වෙනත් % | වාර්තා නොවූ % | එකතුව % |
|---|---|---|---|---|---|---|
| හිගුරක්ගොඩ | 81.1 | 0.8 | 0.0 | 17.3 | 0.8 | 100.0 |
| මනම්පිටිය | 89.7 | 1.9 | 2.5 | 5.4 | 0.5 | 100.0 |
| මැදිගිරිය | 94.0 | 0.9 | 0.0 | 5.1 | 0.0 | 100.0 |
| සේවාගම | 87.8 | 0.0 | 2.4 | 9.4 | 0.4 | 100.0 |
| බකමූණ | 94.5 | 0.5 | 1.0 | 0.0 | 4.0 | 100.0 |
| **සමස්ත නියැදිය** | **89.0** | **0.8** | 1.2 | **8.6** | 0.4 | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

වී මිලදී ගැනීමේදී පෞද්ගලික අංශය තුළ ව්‍යාපාරිකයා විසින් මිල නියම කරනු ලබන අතර (89%) ගොවියා විසින් මිල නියම කිරීමේ අවස්ථාව ඉතාමත් අවම වේ (සංඛ්‍යා සටහන් 3.4). ගොවියා සහ වෙළෙන්දා විසින් සාකච්ඡා කර මිල තිරණය කිරීම 1.2% තරම් අවම මට්ටමක වන අතර රජයේ සහතික මිල, ප්‍රදේශයේ පවතින මිල ආදී අනෙකුත් සාධක මත මිල තීරණය වීම 8.6%කි.

3.5 සංඛ්‍යා සටහන : වී කිලෝ ග්‍රෑමයක් සඳහා පැවති මිල ගණන් - 2002/2003

| ගොවිජන සේවා බල ප්‍රදේශය | පැවති මිල (යල/මහ) කිලෝග්රෑම් 1/රු |
|---|---|
| හිගුරක්ගොඩ | 12-14 |
| සේවාගම | 12-14 |
| බකමූණ | 12-14 |
| මනම්පිටිය | 10-12 |
| මැදිරිගිරිය | 10-12 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

රජයේ සහතික මිල වී කිලෝග්රෑමයක් සඳහා රු. 13.50 ක්ව තිබියදී ගොවීන් අති බහුතරයකට ලැබී තිබුණේ ඊට සාපේක්ෂව අඩු මිලකි. ඒ අනුව 2002/2003 මහ සහ යල කන්නයේදී හිගුරක්ගොඩ, සේවාගම, බකමූණ යන ගොවිජන සේවා බලප්‍රදේශය තුළදී ගොවීන් වැඩි ප්‍රමාණයකට වී කිලෝග්රෑමයක් සඳහා රු.12-14 ක් අතර මිලක්

ව්‍යාපාරිකයා විසින් තීරණය කර (35% ට වැඩි) ලබාදී තිබූ අතර මනම්පිටිය සහ මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශවල ගොවීන්ට ලැබී තිබුණේ වී කිලෝග්‍රෑමයක් සඳහා රු.10-12 අතර මිලකි. මෙම ගොවිජන සේවා බලප්‍රදේශ දෙකෙන් මනම්පිටියෙහි වී මිල ගණන් අනෙක් ගොවිජන සේවා බලප්‍රදේශවලට සාපේක්ෂව පහළ යාමට මූලික හේතුව ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතීම යි. මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශ තුළ අධ්‍යයනයට ලක් කළ ගම්මාන නගරයෙන් ඉතා දුරස්ථව පිහිටීම සහ ප්‍රවාහන පද්ධතියේ දුර්වලතා මෙන්ම වීවල අඩු ගුණාත්මක තත්ත්වය ද මිල ගණන් පහළ යාම සඳහා බලපා තිබුණි.

ගොවීන් විසින් අලෙවිකරනු ලැබූ වී තොග සඳහා මුදල් ගෙවීමේදී වී මිලදී ගන්නන් විසින් බහුල ලෙස සියලුම මුදල් එකවර ගෙවීමට කටයුතු කර තිබුණි. සියලුම මුදල් පසුව ගෙවීම, කොටසක් ගෙවා ඉතිරිය පසුව ගෙවීම, ගොවියාට අවශ්‍ය වූ විට පවත්නා මිල ගෙවීම සහ වෙනත් ගෙවීම් ක්‍රම ආදිය භාවිත කර තිබුණේ ඉතා සුළු වශයෙනි.

**3.6 සංඛ්‍යා සටහන : වී සඳහා මුදල් ගෙවීමේ ආකාරය**

| ගොවිජන සේවා බලප්‍රදේශය | කන්නය | මුදල් ගෙවන ආකාරය (%) | | | | |
|---|---|---|---|---|---|---|
| | | සියලුම මුදල් එකවර ගෙවීම | සියලු මුදල් පසුව ගෙවීම | කොටසක් ගෙවා ඉතිරිය පසුව ගෙවීම | අවශ්‍ය විට පවත්නා මිල මත ගෙවීම | වෙනත් |
| හිඟුරක්ගොඩ | යල | 85.5 | 13.0 | 1.5 | 0.0 | 0.0 |
| | මහ | 87.0 | 1.6. | 0.0 | 0.0 | 0.8 |
| සේවාගම | යල | 89.0 | 5.7 | 0.8 | 0.0 | 0.0 |
| | මහ | 86.0 | 7.4 | 0.0 | 0.0 | 0.8 |
| මනම්පිටිය | යල | 81.0 | 3.0 | 7.0 | 1.0 | 5.0 |
| | මහ | 80.0 | 3.8 | 8.7 | 0.0 | 6.7 |
| මැදිරිගිරිය | යල | 92.0 | 5.7 | 2.8 | 0.0 | 0.0 |
| | මහ | 96.0 | 1.8 | 2.7 | 2.0 | 0.0 |
| බකමූණ | යල | 92.0 | 3.0 | 2.0 | 2.0 | 0.0 |
| | මහ | 91.0 | 2.0 | 2.0 | 2.0 | 1.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

**වෙළෙඳුන් විසින් වී මිලදී ගැනීම**

මෙම අධ්‍යයනයේදී, ගමේ වී එකතු කරන්නා සහ පිටස්තර වී එකතු කරන්නා යන දෙපාර්ශවයම වෙළෙඳුන් ලෙස සලකා බැලුණි. එහිදී වෙළෙඳුන් ප්‍රධාන ලෙස වී මිලදී ගෙන ඇත්තේ ගොවීන්ගෙන් සහ දිස්ත්‍රික්කය තුළ වී එකතු කරන්නන්ගෙනි.

**3.7 සංඛ්‍යා සටහන : වෙළෙඳුන්ට වී අලෙවිකරණ පාර්ශවයන්**

| පාර්ශවය | ප්‍රතිශතය |
|---|---|
| ගොවීන් | 69.1 |
| දිස්ත්‍රික්කය තුළ වී එකතුකරන්නන් | 20.0 |
| දිස්ත්‍රික්කයෙන් බැහැර වී එකතුකරන්නන් | 7.3 |
| තැරැව්කරුවන් | 1.8 |
| වෙනත් | 1.8 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

මිලදී ගත් ප්‍රදේශ සලකා බැලීමේදී වෙළෙඳුන් වැඩි ප්‍රමාණයක් වී මිලදී ගෙන ඇත්තේ ගම තුළින් (52.1%) වන අතර ගම අවට ප්‍රදේශයන්ගෙන් 34.1%ක් ද, ගමෙන් දුරස්ථ දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශවලින් 8.2%ක් ද, දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලින් 5.5%ක් ද ලෙස වී මිලදී ගෙන තිබුණි

වෙළෙඳුන්ගෙන් වැඩි ප්‍රතිශතයකට වී මිලදී ගැනීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයක් නොවූ අතර ඔවුන් වැඩිදෙනා අවුරුද්ද පුරාම වී මිලදී ගැනීමේ කටයුතුවල නියැළී තිබුණි. එනම්, වෙළෙඳුන්ගෙන් 70%ක් පමණ වසර පුරා වී මිලදී ගනු ලබන අතර අස්වනු නෙළන කාලය තුළදී පමණක් වී මිලදී ගැනීමට කටයුතු කර තිබුණේ 30% ක ප්‍රමාණයකි. මේ සඳහා වෙළෙඳුන් සතු ව්‍යාපාරික ස්ථානයේ ස්වරූප හා හිමි වත්කම් ප්‍රමාණය (ඉහළ මූල්‍ය හා මූර්ත වත්කම් සතුවීම) ආදිය හේතු සාධකවී තිබුණි. වෙළෙඳුන් විසින් මිලදී ගත් වීවලින් 69%ක ප්‍රමාණයක් වී මිලදී ගැනීම සිදුකර තිබුණේ ගොවීන්ගෙන් වූ අතර එය ස්ථාන වශයෙන් සලකා බැලීමේදී කමතේදී 59%ක් සහ ඔවුන් සතු වෙළඳ මධ්‍යස්ථානවල දී වී 27% කි. ගොවි නිවසේදී වී මිලට ගැනීම 14%ක් විය. මෙහිදී වෙළඳුන් වැඩි වශයෙන් කමතේදී වී මිලට ගනු ලැබුව ද එය සුළු ප්‍රමාණ මිලදී ගැනීම් වේ. එනම්, බුසල් අසූවට වඩා අඩු ප්‍රමාණයක් මිලදී ගැනීම් කමතේදී සිදු කරන අතර බුසල් අසූවට වඩා වැඩි මිලදී ගැනීම් කරනු ලබන්නේ වෙළඳ මධ්‍යස්ථානයේදීය (68%). බුසල් 20- 80 මධ්‍යම පරිමාණ වී මිලදී ගැනීම් බොහෝවිට සිදු කරනු ලැබ ඇත්තේ ගොවි නිවසේදීය (46%).

වෙළෙඳුන් විසින් විවිධ ස්ථානයන්හිදී මිලදී ගනු ලබන වී ප්‍රමාණයන් සඳහා විවිධ ආකාරයෙන් මුදල් ගෙවීම් කරනු ලබන අතර වෙළෙඳුන්ගෙන් 56%ක ප්‍රමාණයක් එනම් වැඩි ප්‍රමාණයක් මුදල් ගෙවනු ලබන්නේ සියලුම මුදල් එකවරය. වෙළෙඳුන්ගෙන් 19%ක් කොටසක් ගෙවා ඉතිරිය පසුව ගෙවීමට කටයුතු කරනු ලබයි. 10%ක් සියලු මුදල් පසුව ගෙවීම කරන අතර 15%ක් පවතින හිතවත්කම් මත අලෙවි කරන්නාට මුදල් අවශ්‍ය වූ විට පවතින වෙළඳපළ මිල මත මුදල් ගෙවනු ලබයි.

මිලදී ගනු ලබන සියලුම වී ප්‍රමාණයන් සඳහා මිල නියම කරනු ලබන්නේ වෙළෙඳුන් විසිනි (97%). ගොවීන්ට වී මිල ගණන් නියම කිරීමේ කිසිදු හැකියාවක් නොමැති අතර 2.6% ක පමණ ප්‍රතිශතයක් සාකච්ඡා කර මිල තීරණය කරනු ලබයි. එනම්, වී මිල නියම කිරීමේ ඒකාධිකාරී බලය වෙළෙන්දා විසින් හිමි කරගෙන ඇත. වෙළෙන්දා විසින් මෙසේ වී මිල නියම කරනු ලබන්නේ (95%), ප්‍රදේශයේ දෛනිකව පවතින මිල ගණන් සැලකිල්ලට ගැනීමෙනි.

**3.8 සංඛ්‍යා සටහන : වෙළෙඳුන් විසින් වී මිල ගණන් වෙනස් කිරීම**

| මිල වෙනස් කිරීම (රු.ශත/කිලෝග්‍රෑම් 1) | අස්වනු නෙළන කාලය තුළ පිරිවැය සැලකිල්ලට ගෙන මිල නියම කිරීම | | කුඹුරු වගා කටයුතු ආරම්භ කාලය තුළ පිරිවැය සැලකිල්ලට ගෙන මිල නියම කිරීම | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0<-< 0.25 | 10 | 26.3 | 6 | 15.8 |
| 0.25= <-< 0.50 | 13 | 34.2 | 13 | 14.2 |
| 0.50= <-< 0.75 | 8 | 21.1 | 5 | 13.2 |
| 0.75= <-< 1.00 | 2 | 5.3 | 4 | 10.5 |
| 1.00= <-<1.25 | 1 | 2.6 | 3 | 7.9 |
| වාර්තා නොවූ | 4 | 10.5 | 7 | 13.4 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

තවද වෙළෙඳුන් විසින් ප්‍රදේශ, තෙතමනය, වීවල අපද්‍රව්‍ය ප්‍රමාණය යන සාධක මත වී මිල ගණන් අඩු කරනු ලබන අතර මිල ගණන් අඩුවීම සඳහා ඒ අතුරින් බලපාන ප්‍රබල සාධක ලෙස වීවල තෙත ප්‍රමාණය (34%) හා අඩංගු අපද්‍රව්‍ය ප්‍රමාණය (31%) හඳුනාගත හැකිය. කුඹුරු වගා කටයුතු ආරම්භ කරන කාල පරිච්ඡේදය තුළදී මෙන්ම අස්වනු නෙළන කාල පරිච්ඡේදය තුළදී ද වෙළෙන්දන් විසින් වී මිල ගණන් වෙනස් කිරීමේදී වීවල ගුණාත්මකභාවය පහළ යාම මත ප්‍රධාන වශයෙන් වී කිලෝවක මිල ගණන් ශත 50ක් හෝ ඊට අඩු ප්‍රමාණයකින් අඩු කරනු ලැබේ. ප්‍රදේශය සැලකිල්ලට ගෙන වෙළෙඳුන්ගෙන් 16% ක ප්‍රමාණයක් මිල ගණන් වෙනස් කරනු ලබන අතර විශේෂයෙන්ම මෙහිදී

එගොඩපත්තුව ප්‍රදේශය සැලකිල්ලට ගනු ලැබේ. එනම්, වෙළෙඳුන් විසින් එගොඩපත්තුව ප්‍රදේශයේ වීවල ගුණාත්මකභාවය අඩු බව සඳහන් කරන අතර මැදිරිගිරිය, හිඟුරක්ගොඩ ප්‍රදේශවල වී ඉහළ ගුණාත්මක තත්ත්වයකින් යුක්ත බව පිළිගැනේ. වෙළඳුන්ගෙන් 58%ක් දෙනා වීවල ගුණාත්මකභාවය සැලකිල්ලට ගෙන අලෙවිය සඳහා ඉදිරිපත් කළ වී තොග ප්‍රතික්ෂේප කර ඇත.

මෙහිදී අනාවරණය වන තවත් කාරණයක් වන්නේ, ගොවීන් විසින් මහා පරිමාණ වශයෙන් යම් වී ප්‍රමාණයක් අලෙවිය සඳහා ඉදිරිපත් කරනවිට, එහි ගුණාත්මක බව සුරැකීමට ගොවීන්ගේ වැඩි දායකත්වයක් ලැබෙන බවයි. එනම්, මහා පරිමාණ වී අලෙවියේදී ගොවීන් ඉහළ ගුණාත්මක බව සැලකිල්ලට ගන්නා බවයි. නමුත් වී බුසල් 30-40 සුළු ප්‍රමාණයන් අලෙවියේදී ගොවීන් ඒවායේ ගුණාත්මක බව සැලකිල්ලට නොගන්නා තරම්ය. එනම් ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව වී අලෙවි කිරීමට කටයුතු කරන්නේ නම් ඒ 2.6% තරම් සුළු ප්‍රමාණයකි. එබැවින් එවැනි සියලු අවස්ථාවලදී වෙළඳුන් විසින් ඉහළ ගුණාත්මක භාවයකින් යුතු (ගල්,වැලි,බොල් රහිත) වී තොග අලෙවිය සඳහා ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙන අතර ගොවීන්ගෙන් එම උපදෙස් සඳහා සාර්ථක ප්‍රතිචාරයක් දක්වන්නේ 50%ක් තරම් ප්‍රමාණයකි.

වී අලෙවි කිරීමේ ක්‍රියාවලිය මූලික ලෙස අලෙවි පාර්ශවයන් තුනකින් සමන්විත බවට සැලකිය හැකි අතර එය පහත සඳහන් වේ.

ගොවියා ⟶ වෙළෙන්දා ⟶ වී මෝල්හිමියා

මේ අනුව වෙළෙන්දා යනු, මෙහිදී එක් ආකාරයකින් අතරමැදියෙකු වන හෙයින් ඔහු විසින් ඒකරාශී කරනු ලැබූ සියලු වී තොග අවසාන වශයෙන් වී මෝල්හිමියෙකුට අලෙවි කිරීම සිදු කරයි. එබැවින් මෙම අධ්‍යයනයේදී වෙළෙන්දන්ගේ වී මිලදී ගැනීමේ ස්වභාවය සලකා බැලූ අයුරින් ඔහුගේ වී අලෙවි කිරීමේ ස්වභාවය ද සලකාබැලීම සිදු කළ යුතු වේ.

**වෙළෙඳුන් විසින් වී අලෙවි කිරීම**

වෙළෙඳුන් තම වී තොග අලෙවි කරනුයේ, වී මෝල්හිමියන්ට සහ පිටස්තර වී එකතු කරන්නන්ටය. ඔවුන් තම වී තොග ප්‍රධාන වශයෙන්ම අලෙවි කිරීම කරනුයේ, තමන්ගේ වෙළඳ මධ්‍යස්ථානයේදී (64.1%) වන අතර වී මෝල් වෙත ගෙන ගොස් අලෙවි කිරීම (30.2%) සහ වෙනත් වී එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත ගෙන ගොස් අලෙවි කිරීම (5.7%) ද සිදුවේ.

වෙළෙඳුන් සතු වී තොග අලෙවි කිරීමේදී ද මිල තීරණය කරනු ලබන්නේ, එම වී තොග මිලදී ගන්නන් විසින්ය. මේ අනුව පැහැදිලි වන්නේ සෑමවිටම වී මිල ගණන් තීරණය කරනු ලබන්නේ, මිලදී ගන්නා (Purchaser) මිස විකුණුම්කරු (Seller) නොවන බවයි (3.9 සංඛ්‍යා සටහන).

**3.9 සංඛ්‍යා සටහන : වී මිල ගණන් තීරණය කිරීමේ ස්වභාවය**

| මිල තීරණය කරන්නා | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| විකුණුම්කරු | 02 | 5.1 |
| ගැණුම්කරු | 27 | 69.2 |
| කේවල් කිරීමෙන් | 10 | 25.6 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

වී අලෙවියේදී විශ්වාසවන්ත භාවය/නෑදෑ මිත්‍ර සම්බන්ධතා ආදිය පදනම් කර ගනිමින් අලෙවි කිරීමට කටයුතු කිරීම් සුලභව සිදු නොවන අතර වී අලෙවිකළ සැනින් සියලු ගණුදෙනු හමාර කර සියලුම මුදල් එකවර ලබා ගැනීම (76%).

සියලු මුදල් පසුව ගෙවීම (8%),කොටසක් ගෙවා ඉතිරි මුදල් පසුව ගෙවීම(16%), මුදල් ගෙවන ආකාරයන් ලෙස දැක්විය හැකිය.

### වී මෝල්හිමියන් විසින් වී මිලදී ගැනීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහා පරිමාණ වී මෝල් 40 ක් පමණ පවතී (ඇමුණුම 01). ඔවුන් වැඩි වශයෙන්ම වී මිලදී ගනු ලබන්නේ තම වී මෝල් පිහිටි ගම අවට ප්‍රදේශයන් ගෙනි. එනම් 31%ක් පමණ වී මෝල් හිමියන් ගම අවට ප්‍රදේශවලින් වී මිලදී ගනු ලබන අතර, 29%ක් ගම තුළින් ද 26%ක් ගමින් දුරස්ථ දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශවලින් ද වී මිලදී ගනු ලබයි. එහිදී ඔවුන් ප්‍රධාන ලෙස වී මිලදී ගන්නේ ගොවීන්ගෙනි. එනම් වී මෝල් හිමියන් මිලදී ගනු ලබන වීවලින් 37%ක් ගොවීන්ගෙන් ද 32%ක් දිස්ත්‍රික්කය තුළ වී එකතුකරන්නන්ගෙන් ද 13%ක් දිස්ත්‍රික්කයෙන් බැහැර වී එකතු කරන්නන්ගෙන් ද මිලදී ගනු ලබයි. තැරැව්කරුවන්ගෙන් ලබා ගන්නා වී ප්‍රමාණය 19%කි.

වී මෝල්හිමියන්ගෙන් 90%ක් දෙනා වසර පුරාම වී මිලදී ගැනීම් කරන අතර 10%ක් තරම් සුළු ප්‍රමාණයක් අස්වනු නෙළන කාලය තුළදී පමණක් වී මිලදී ගනු ලබයි. ඒ සඳහා ප්‍රධාන ලෙස හේතුවී ඇත්තේ අස්වනු නෙළන කාලය තුළ අඩු මිලට වී මිලදී ගැනීමට හැකිවීමයි. ඊට අමතරව ණේවල් කිරීම මත මිල ගණන් තීරණය කර මිලදී ගැනීමට හැකිවීම සහ තම අවශ්‍යතාව අනුව තොග රැස්කර ගත හැකිවීම යනාදී වූ සාධක ද බලපානු ලබයි.

විශේෂිත කාලයක් තුළ වී මිලදී ගැනීමේ වාසි වශයෙන් වී මෝල් හිමියන් කරුණු තුනක් සඳහන් කරනු ලබයි. එනම්, අඩු මිලට වී මිලදී ගත හැකිවීම (48%), ණේවල් කිරීමෙන් මිල තීරණය කිරීමට හැකිවීම (22%), තම අවශ්‍යතාවන්ට අනුව වී තොග රැස්කර ගැනීමට හැකිවීම (30%) වශයෙනි.


වී මෝල් හිමියන් ප්‍රධාන ලෙස වී මිලදී ගනු ලබන්නේ වී මෝලේදීය. මිලදී ගනු ලබන වී තොග සඳහා වී මෝල් හිමියන් විසින් සියලුම මුදල් එකවර ගෙවා (60%) ගණුදෙනු අවසර කරයි. ඊට අමතරව කොටසක් ගෙවා ඉතිරිය පසුව ගෙවන අවස්ථා ද (24%) වේ. මෙහිදී ප්‍රධාන ලෙස මිල නියම කරන්නා වී මෝල්හිමියා (66%) වන අතර ගොවීන්ට මිල නියම කිරීමේ කිසිදු හැකියාවක් නැති නමුදු වී එකතු කරන්නන්ගෙන් මිලදී ගනු ලබන අවස්ථාවලදී ණේවල් කර (32%) මිල නියම කරනු ලබයි. මෙහිදී වී මෝල්හිමියා වී මිල ගණන් තීරණය කිරීමේදී සහල් කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ප්‍රධාන ලෙස සලකා බලනු ලබයි. අනතුරුව සැපයුමේ ස්වරූපය සැලකිල්ලට ගනී. එනම්, අස්වනු නෙළන කාල පරිච්ඡේදය තුළ අධි සැපයුමක් ඇති අතර ඒ මත මිල තීරණය කරන අතර කාලීන මිල වෙනස්වීමේ ස්වරූපය ද සැලකිල්ලට ගනී.

### සහල් අලෙවි කිරීම

සහල් අලෙවි ක්‍රියාදාමයේ මූලික පුරුක ලෙස වී මෝල් හිමියන් හඳුන්වාදිය හැකි අතර එහිදී ප්‍රධාන තැනක් ගනු ලබන්නේ මහා පරිමාණ වී මෝල්හිමියන්ය. වී මෝල් හිමියාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා වූ විවිධ අලෙවි පාර්ශව (තොග වෙළෙන්දා, සිල්ලර වෙළෙන්දා, කොන්ත්‍රාත් සැපයුම්කරුවා, ආපනශාලා/හමුදා සහ වෙනත් පාර්ශව) වෙත විවිධ අලෙවි මාර්ග (කුඩා පරිමාණ වී මෝල් හිමියන්, මහා පරිමාණ වී මෝල් හිමියන්, එකතු කිරීමේ නියෝජිතයන්, තැරැව්කරුවන්, තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන්) ඔස්සේ බෙදා හරිනු ලබයි (3.4 රූප සටහන). සහල් අලෙවි මාර්ග උපයෝගී කර ගනිමින් වී මෝල් හිමියන් විසින් සකස් කරනු ලබන සහල් විවිධ ප්‍රදේශ එනම්, ගම තුළ, ගම අවට, ගමින් දුරස්ථ සහ දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට බෙදා හරිනු ලැබේ (3.5 රූප සටහන).

3.4 රූප සටහන


සහල් අලෙවි මාර්ග




මූලාශ්‍ර-පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2004

3.5 රූප සටහන

මහා පරිමාණ වී මෝල්හිමියාගේ සිට විවිධ ප්‍රදේශ සඳහා සහල් බෙදා හැරීම




මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය-2004

මහා පරිමාණ වී මෝල්හිමියන් විසින් තම සහල් තොග වැඩි ප්‍රමාණයක් බෙදා හරිනු ලබන්නේ, දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට (52.7%) වන අතර 25.5% ක් ගම තුළ ද 9.1% ක් ගම අවට ද 12.7% ක් දිස්ත්‍රික්කය තුළ පිහිටි ගමින් දුරස්ත ප්‍රදේශවලට ද බෙදා හරිනු ලැබේ. තැරැව්කරුවන් විසින් සහල් තොගවලින් 25% ක් ගම තුළ ද, 75% ක් දිස්ත්‍රික්කයෙන් බැහැරව ද බෙදා හරිනු ලබන අතර බෙදා හැරීමේ නියෝජිතයන් තම සහල් තොගවලින් 100% ක ප්‍රමාණයක් දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට බෙදා හරිනු ලැබේ. නමුත් කුඩා පරිමාණ වී මෝල් හිමියන් තම සහල්

තොගවලින් 100% ක් අලෙවි කරන්නේ ගම තුළය. සහල් අලෙවියෙන් පසු වී මෝල් හිමියන්ට මුදල් ලැබෙන ආකාරය 3.10 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**3.10 සංඛ්‍යා සටහන : වී මෝල් හිමියන්ට සහල් අලෙවියෙන් පසු මුදල් ලැබෙන ආකාරය**

| මුදල් ලැබෙන අයුරු | ප්‍රතිශතය |
|---|---|
| සියලුම මුදල් එකවර | 26.0 |
| සියලුම මුදල් පසුව | 13.0 |
| කොටසක් ගෙවා ඉතිරිය පසුව | 21.0 |
| මුදල් කොටස් වශයෙන් | 25.0 |
| වෙනත් | 15.0 |
| **එකතුව** | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

### 3.3.2 භෞතිකමය බෙදා හැරීමේ කාර්යයන් (Physical distribution functions)

මෙහිදී ප්‍රධාන වශයෙන් සලකා බලනු ලබන්නේ, ඇසුරුම් කිරීම් (packing), ප්‍රවාහනය කිරීම (transporting), ගබඩා කිරීම (storaging), සහ සකස් කිරීම් (processing), වේ. වී අලෙවි කිරීමේ කාර්යය සම්බන්ධයෙන් වී මෝල් හිමියා, වී එකතු කිරීමේ නිරත අතරමැදියා සහ ගොවියා යන ප්‍රධාන වෙළඳපළ පාර්ශවයන් අතර විවිධ වෙනස්කම් පවතී.

#### ඇසුරුම් කිරීම

ගොවීන් සම්බන්ධයෙන් වී ඇසුරුම් කිරීමේ කාර්යය පිළිබඳව සලකා බැලීමේදී ඔවුන්ගේ 98%ක් ම වී ඇසුරුම් කිරීම සඳහා යොදා ගන්නේ පොහොර උරය. 2%ක ප්‍රමාණයක් වී ඇසුරුම් මාධ්‍යය ලෙස ගෝනි යොදා ගනී. ගෝනිවලට සාපේක්ෂව ගොවීන් විසින් පොහොර උර යොදා ගන්නේ ගෝනිවල මිල අධික බව නිසාය. නමුත් පොහොර උර සම්බන්ධයෙන් වන ගැටළු සලකා බැලීමේදී එම ඇසුරුම් ඉක්මණට විනාශවීම ප්‍රධාන ගැටළුවක් ලෙස පවතී. මෙලෙස කල් පැවැත්මෙන් අඩු (උපරිම වශයෙන් එක් උරයක් පාවිච්චි කිරීමේ හැකියාව ඇත්තේ කන්න 2 කි) ඇසුරුම් සඳහා රු:18.00 ක් වැනි මුදලක් එක් ඇසුරුමක් වෙනුවෙන් වැය කිරීමට වීම ප්‍රබල ගැටළුවක් ලෙස ගොවීහු සලකති. ඇසුරුම් ලබා ගැනීමට ඇති හිඟකම, අලෙවියෙන් පසු ඇසුරුම් නැවත ලබා නොදීම, අලෙවියෙන් පසු නැවත ලබාදෙන ඇසුරුම් හොඳ තත්ත්වයේ නොවීම ආදියද ඇසුරුම් සම්බන්ධයෙන් ගොවීන් මුහුණදෙන ගැටළු වුව ද ඒවා ප්‍රබල ප්‍රශ්න ලෙස නොසලකනු ලබයි. මෙහිදී ගොවීන්ගෙන් 93% ක් ම ඇසුරුම් ලෙස යොදා ගන්නේ තමන් සතු/තමා මිලදී ගත් ඇසුරුම් වන අතර වී මිලදී ගන්නකු සතු ඇසුරුම් ලබා ගන්නේ නම් එය 7%ක් තරම් වූ සුළු ප්‍රමාණයකි.

වී මිලදී ගැනීමේ නිරත එකතු කරන්නන් විසින් ද ඇසුරුම් මාධ්‍යය ලෙස ප්‍රධාන වශයෙන් යොදා ගන්නේ පොහොර උර (80%) වන අතර ඒවා ඔවුන් සතු/මිලදී ගත් ඒවා (79%) වේ. අතරමැදියන් විසින් ගොවීන් සතු පොහොර උර වී ඇසුරුම් කිරීම සඳහා 21%ක ප්‍රමාණයක් යොදා ගනී. එසේම වී අලෙවි මාර්ගයන් හි අවසාන පාර්ශවය ලෙස සැලකෙන වී මෝල් හිමියා විසින් වී ඇසුරුම් කිරීම සඳහා ප්‍රධාන ලෙස යොදා ගන්නේ පොහොර උර (84.4%) වන අතර 15.6% ක ප්‍රමාණයක් ඇසුරුම් මාධ්‍ය ලෙස ගෝනි යොදා ගනී. මෙහිදී ඇසුරුම්වල 76.9%ක අයිතියක් වී මෝල් හිමියා සතුව ඇති අතර 10%ක් ගොවියා සතුව ද, 13%ක් වී අලෙවි කිරීමේ අතරමැදියන් සතුව ද පවතී. මේ අනුව වී අලෙවිකරණ ක්‍රියාවලියේදී ප්‍රධාන වශයෙන් ඇසුරුම් සපයා ගන්නේ ඒ එක් එක් අලෙවි පාර්ශවයන් විසින්මය.

### ප්‍රවාහනය කිරීම

ගොවීන් විසින් වී අලෙවි කිරීමේදී ප්‍රවාහන මාධ්‍යය ලෙස ප්‍රධාන වශයෙන්ම යොදා ගන්නේ රෝද දෙකේ ට්‍රැක්ටරයයි (72.6%). ගොවීන්ගෙන් 22.9% ක ප්‍රමාණයක් ප්‍රවාහන මාධ්‍යය ලෙස රෝද හතරේ ට්‍රැක්ටරය යොදා ගනී. නමුත් ඉතාමත් සුළු වී තොග අලෙවි කිරීමට ඇති අවස්ථාවලදී මෙන්ම අලෙවි මධ්‍යස්ථානය ඉතා සමීපයේ පිහිටා ඇති අවස්ථාවලදී පාපැදිය හෝ ශ්‍රමය උපයෝගී කරගෙන (4%) වී ප්‍රවාහනය කරනු ලබයි. පාපැදිය සහ ශ්‍රමය හැර වෙනත් ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරීමේ දී ගොවීන්ට බලපාන ප්‍රබල ගැටළු 2ක් ලෙස ප්‍රවාහන වියදම් වැඩිවීම (41%) සහ මාර්ග පහසුකම් නොමැතිවීම (39%) හඳුනාගත හැකිවිය. ප්‍රවාහන මාධ්‍යය කුලියට හෝ තමන් සතු හෝ කුමන ආකාරයකින් ලබා ගත්ත ද ඒ සඳහා ඉහළ පිරිවැයක් දැරීමට වීම ගොවීන් මුහුණ දෙන ප්‍රබල ගැටළුවකි.

වී අලෙවිකරණ ක්‍රියාවලිය තුළ වී මිලදී ගැනීමේ නිරත එකතු කරන්නන්ගේ සහ වී මෝල් හිමියන්ගේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය ලොරියයි. එනම්, වී එකතු කිරීමේ නිරත එකතු කරන්නන්ගෙන් 70%ක ප්‍රමාණයක් ද වී මෝල් හිමියන්ගෙන් 78%ක ප්‍රමාණයක් ද ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යය ලෙස ලොරි භාවිතා කරයි. ඊට අමතරව මොවුන් ට්‍රක් රථය (17%) හා සුළු වශයෙන් රෝද හතරේ ට්‍රැක්ටරය ද ප්‍රවාහන මාධ්‍යයන් ලෙස භාවිතා කරයි. මෙහිදී වී මෝල් හිමියන් විසින් ප්‍රවාහන මාධ්‍ය භාවිතා නොකරන අවස්ථා ද වේ. ඒ සඳහා හේතු සාධක වී ඇති කරුණු ගණනාවකි. එනම්, තමන් සතු ප්‍රවාහන මාධ්‍යයක් නොවීම, අඩු ලාභයක් පැවතීම, ප්‍රමාණවත් නිෂ්පාදනයක් නොවීම, අලෙවිකරුවන් විසින් වී මෝල්හිමියා වෙත සැපයුම් කරදීම සහ ඉහළ මිලක් දැරීමට සිදුවීම යනාදී සාධකයන්ය. එහිදී ප්‍රධානතම හේතු සාධකය වී ඇත්තේ සැපයුම්කරුවන් විසින් වී තොග වී මෝල් වෙත සැපයුම් කරදීමයි (68%). වී මෝල්හිමියන් සතුව ප්‍රවාහන මාධ්‍යයන් නොවීම ද (11%) ඊළඟ වැදගත් සාධකය බවට පත්වී ඇත.

### වී ගබඩා කිරීම

ගොවීන්ගෙන් 71%ක ප්‍රතිශතයක් අස්වනු නෙළූ විගසම ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා නොකර අලෙවි කරනු ලබයි. එබැවින් ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කරනු ලබන්නේ ගොවීන්ගෙන් 29% ප්‍රමාණයකි. අස්වනු නෙළූ විගස වී අලෙවි කිරීමට බලපානු ලබන සාධක ගණනාවකි. ඒ අතර මුදල් හිඟකම, ණය ගෙවීමට සිදුවී තිබීම, කම්කරු කුලී ගෙවීම යනාදිය ප්‍රධාන වේ.

අනාගතයේ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කිරීම පිළිබඳව 3.11 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙන අතර එයට අනුව මැදිගිරිය ප්‍රදේශයේ වී ගබඩා කිරීම් ඉතාම අවම මට්ටමක පවතී. දිස්ත්‍රික්කය තුළ වී ගබඩා කරනු ලබන ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් වී ගබඩාකරන ස්ථානය වශයෙන් පාවිච්චි කරනු ලබන්නේ ගොවි නිවසමය. එනම්, ගබඩාව ලෙස ගොවි නිවස භාවිතා කිරීමේ ප්‍රතිශතය 88%කි. ගොවීන්ගෙන් 12%කට පමණක් වී ගබඩා කිරීම සඳහා නිශ්චිත වී ගබඩාවක් ඇත.

**3.11 සංඛ්‍යා සටහන : අනාගතයේ ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කිරීම**

| ගොවිජන සේවා බල ප්‍රදේශය | වී ගබඩා කිරීමේ ප්‍රතිශතය |
|---|---|
| හිඟුරක්ගොඩ | 10.5 |
| මැදිරිගිරිය | 1.8 |
| මනම්පිටිය | 4.3 |
| සේවාගම | 7.1 |
| ඇලහැර/බකමූණ | 4.7 |
| **සමස්ත නියැදිය** | 28.5 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

වී ගබඩා තුළ වී ගබඩා කරනු ලබන ගොවීන්ගෙන් 35%කට පමණ බුසල් පන් දහසට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ හැකියාව සහිතව වී ගබඩාව පවතී. ගොවීන්ගෙන් 18%කට පමණ වී බුසල් 1000-2500 අතර ප්‍රමාණයක්

ගබඩා කළ හැකි ගබඩා පහසුකම් ඇති අතර 24% ප්‍රතිශතයකට වී බුසල් 500-1000ක් අතර ප්‍රමාණයක් ගබඩා කළ හැකි ගබඩා පහසුකම් පවතී. ගොවීන්ගෙන් 12% කට පමණ ගබඩා පහසුකම් ඇත්තේ වී බුසල් 500කට වඩා අඩුවෙන් ගබඩා කළ හැකි ආකාරයෙනි.

වී මිලදී ගැනීමේ අතරමැදියන් අස්වනු නෙළන කාලයේදී මිලදී ගනු ලබන වී ප්‍රධාන වශයෙන් ගබඩා කරනු ලබන්නේ, මාස 3ක කාලයක් සඳහාය. එනම්, මාස 3ක් අවසානයේදී මිලදී ගත් වී තොග අලෙවි කිරීමෙන් ඉහළ ලාභයක් ලැබිය හැක. එනම් පොළොන්නරු දිස්ත්‍රික්කයේ මහ කන්නයේ අස්වනු නෙළීම මාර්තු, අප්‍රියෙල් මාසවලදී සිදුවන අතර එම කාල පරිච්ඡේදය තුළදී මිලදී ගනු ලබන වී තොග ජුනි/ජූලි මාසවලදී අලෙවි කිරීමෙන් ඉහළ ලාභයක් ලැබිය හැකිවේ. යල කන්නයේදී අස්වනු නෙළීම අගෝස්තු, සැප්තැම්බර් මාසවලදී සිදු කරන අතර එම කාල පරිච්ඡේදවලදී මිලදී ගනු ලබන වී තොග දෙසැම්බර්-ජනවාරි මාසවලදී අලෙවි කිරීමෙන් ඉහළ ලාභයක් ලැබිය හැකිවේ. එබැවින් වී මිලදී ගැනීමේ නිරත අතරමැදියන් ගෙන් 85%ක් පමණ වී ගබඩා කර තබනු ලබයි.

3.12 සංඛ්‍යා සටහන : ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා නොකිරීම සඳහා බලපාන ලද හේතු සාධක

| හේතුව | හිඟුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | බකමූණ % | සමස්ත නියැදිය % |
|---|---|---|---|---|---|---|
| 1. ණය පියවීමට සහ අනෙකුත් කටයුතු සඳහා හදිසි මුදල් අවශ්‍යතා | 14.2 | 16.9 | 15.5 | 13.2 | 15.6 | 75.0 |
| 2. ගබඩා පහුසකම් නොමැතිවීම | 1.1 | 2.6 | 1.1 | 1.2 | 1.4 | 7.6 |
| 3. වෙළඳපොළ මිල අවිනිශ්චිතතාව | 2.2 | 2.6 | 2.6 | 2.1 | 1.6 | 11.0 |
| 4. නාස්තිය වැඩිවීම | 0.8 | 1.9 | 1.0 | 1.2 | 0.4 | 5.4 |
| 5. විශාල ප්‍රමාණයක් වගා නොකිරීම | 0.0 | 0.3 | 0.3 | 0.2 | 0.0 | 0.7 |
| 6. බිත්තර වී සඳහා වගා කිරීම | 0.1 | 0.1 | 0.0 | 0.0 | 0.2 | 0.4 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

මහා පරිමාණ වී මෝල් හිමියන් විසින් අස්වනු නෙළන කාලය තුළදී තම ගබඩා ධාරිතාවයට ප්‍රමාණවත් අයුරින් වී මිලදී ගෙන ගල්/වැලි, තෙත ඉවත් කර, ගබඩා කරනු ලබයි. එම වී නැවත සහල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබීමට කටයුතු කරනු ලබන්නේ යල මහ දෙකන්නයේ වන අස්වනු කාල පරිච්ඡේදයන් (මාර්තු/අප්‍රේල්, අගෝස්තු/සැප්තැම්බර්) ගෙවී මාස තුනකින් පසුවය. එතෙක් එදිනෙදා දෛනික සහල් නිෂ්පාදන කටයුතු සිදු කරනු ලබන්නේ දෛනික වී මිලදී ගැනීම් ඔස්සේය. නමුත් කුඩා පරිමාණ වී මෝල් හිමියන් (කිලෝග්‍රෑම් 65 මිටි 25,000-100,000 අතර වන ගබඩා ධාරිතා නැති) සම්බන්ධයෙන් සලකා බැලීමේදී මෙම තත්ත්වය වෙනස් වේ. ඔවුන්ට මහා පරිමාණ ලෙස වී මිලදී ගෙන මාස 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා ගබඩා කිරීමේ මූල්‍යමය ශක්තියක් නොමැති අතර දෛනිකව මිලදී ගනු ලබන වී තොග සහල් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනී. වී ගබඩා කිරීම සඳහා ද අමතර ඉහළ පිරිවැයක් දැරිය යුතු වන අතර ඒ සඳහා ගල්/වැලි ඉවත් කරන යන්ත්‍ර, වී වියළීමේ යන්ත්‍ර ආදිය ද අවශ්‍ය වේ. නැතහොත් ඉහළ ගුණාත්මක තත්ත්වයකින් යුතු සහල් තොග නිෂ්පාදනය කිරීමේ දුෂ්කරතාවට මුහුණදීමට සිදුවන අතර තරඟකාරී වෙළඳපළ තුළ ඒවා අලෙවි කර ගැනීමේ දුෂ්කරතාවන්ට ද මුහුණ පෑමට සිදුවේ. තවද කුඩා පරිමාණ වී මෝල් හිමියන්ට මුහුණපෑමට සිදුවන ප්‍රධාන ගැටළුවක් වන්නේ, සහල් නිෂ්පාදනයට ප්‍රමාණවත් වී තොග ගබඩා නොකිරීම හේතුවෙන් එම හිඟ වී තොග පිට පළාත්වල අලෙවි මධ්‍යස්ථාන හෝ ගොවීන්ගෙන්, ගමේ හිතවත් ගොවීගෙන් තැරැව්කරුවන්ගෙන් සහ දිස්ත්‍රික්කයෙන් පිට ප්‍රදේශවලින් ලබා ගැනීමට සිදුවීමයි. මේ අතුරින් හිඟ වී තොග සපයා ගන්නා ප්‍රධාන මූලය වන්නේ ප්‍රදේශයේ හිතවත් ගොවි මහතුන්ගෙන් අවශ්‍ය වී තොග එකරැස් කර ගැනීමයි (57%). මහා පරිමාණ වී මෝල් හිමියන් විසින් වී තොග ගබඩා කරනු ලැබුව ද සම්පූර්ණ ගබඩා ධාරිතාව සහල් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා නොකරන අවස්ථා ඇත. ඒ සඳහා බලපාන ප්‍රධාන හේතු සාධක වන්නේ වෙළඳපළ අවිනිශ්චිතතාවයි. එනම් ගබඩා කරනු ලැබූ වී තොග හරහා සහල් නිෂ්පාදනයෙන් සැලකිය යුතු ලාභයක් ලබා ගැනීමේ අවිනිශ්චිත බවක් උද්ගත වී ඇති බවට වී මෝල් හිමියන්ට හැඟී ගියවිට එම සමස්ත ගබඩා ධාරිතාවයම අදාළ කන්නය තුළදී සහල් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා නොකරයි.

තවද ගබඩා කිරීමේදී අපතේ යන ප්‍රමාණයක් ද වේ. අපතේ යන ප්‍රමාණයෙන් 69%ක් වියළීම හේතුවෙන් ද 31%ක ප්‍රමාණයක් සත්ත්ව හානි හේතුවෙන්ද සිදුවේ. එබැවින් වී ගබඩා කරන වී මෝල් හිමියන්ට මෙම සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන සහල් අලෙවි මිල නියම කිරීමට සිදුව තිබේ.

## සැකසීම (Processing)

වී අලෙවි ක්‍රියාවලිය තුළදී ප්‍රධාන වශයෙන් සැකසීම් කටයුතුවල නියැළී සිටින්නේ වී මෝල් හිමියන්ය. මොවුන් සහල් සැකසීම් කටයුතු කරන අතර ඒ හා සම්බන්ධ සහාය කාර්යවල ද නියැළී සිටී. එනම් වී තැම්බීම සහ වේලීම (35%), ඒවා ඇසුරුම් කිරීම (35%) සහ ගබඩා කිරීම (16%) ඇතුළු කාර්යවල නියැළී සිටී. එනම්, මිලදී ගනු ලබන වී තොගවල තෙත, ගල්, වැලි ඉවත්කර තැම්බීම සහ වියළීමත්, අනතුරුව ඇසුරුම් කිරීමත්, ගබඩා කිරීමත් සිදුකරනු ලබයි. ඉන් අනතුරුව සහල් සැකසීම් කටයුතු කරනු ලබයි. මෙවැනි තත්ත්වයක් යටතේ සාමාන්‍ය සහල් නිෂ්පාදන පිරිවැය 3.12 සංඛ්‍යා සටහනින් දැක්වේ. මෙහිදී සහල් නිෂ්පාදන පිරිවැය ගණනය කර ඇත්තේ වී කිලෝග්‍රෑම් එකක උපරිම මිල රු.13.50 ක් ලෙස සලකා බැලීමෙනි (3.13 සංඛ්‍යා සටහන). මන්ද 2002/03 මහ සහ 2003 යල කන්නයේදී රජයේ සහතික මිල, වී කිලෝග්‍රෑමයක් සඳහා රු.13.50ක් වූ අතර අස්වනු නෙළන කාලය තුළදී අවශ්‍ය සියලුම වී තොග ගබඩා කර ඇත්තේ රු. 13.50 මිලට වඩා අඩු මිලක් යටතේය. එසේම කැකුළු සහල්වලට සාපේක්ෂව තැම්බූ සහල්වල නිෂ්පාදන පිරිවැය ඉහළ බැවින් තැම්බූ සහල් නිෂ්පාදනයේ පිරිවැය ගණනය කිරීමෙන් සහල් නිෂ්පාදන උපරිම පිරිවැය හඳුනාගත හැකිය.

3.13 සංඛ්‍යා සටහන : තැම්බූ සහල් කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය

| පිරිවැය විචල්‍යය | තැම්බූ සහල් කිලෝග්‍රෑම් 1/ රුපියල් |
|---|---|
| වී සඳහා වියදම | 22.50 |
| ප්‍රවාහන වියදම (මිලදී ගත් ස්ථානයේ සිට මෝලට) * | 0.24 |
| නාට්ටාමි කුලී | 0.30 |
| සහල් සැකසීමේ වියදම | 1.50 |
| **වී මෝලේ දී සහල් මිල** | 24.54 |
| ප්‍රවාහන වියදම (මෝලේ සිට වෙළඳපොළට) | 0.50 |
| නාට්ටාමි කුලී | 0.20 |
| බැංකු ණය සඳහා පොලී | -- |
| **මුළු වියදම** | **25.24** |

කි.ග්‍රෑ 65 සහල් මිටියක් වෙළඳපල දක්වා ඉදිරිපත් කිරීමේ නිෂ්පාදන පිරිවැය රු.1640.60කි.

* කි.මී. 01ක දුරක් සඳහා පිරිවැය ගණනය කර ඇත.

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

## ණය පහසුකම්

වී මෝල්හිමියන් විසින් ණය ලබා ගැනීමේ ප්‍රධාන අරමුණ වන්නේ වී මිලදී ගැනීමයි (42%). ඊට අමතරව සහල් සකස් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට ද (26%), ශ්‍රමය සඳහා ගෙවීම් කිරීමට ද (31%) ණය ලබා ගනී. මෙහිදී වී මිලදී ගැනීමේ කාර්යය සඳහා ප්‍රධාන ලෙස රු. 500,000/=ට වඩා වැඩි ප්‍රමාණයක ණය මුදල් ලබා ගන්නා අතර සහල් සැකසීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා රු.1,000,000- 2,000,000 අතර ණය ප්‍රමාණයන් ගනු ලබයි. ඊට අමතර කම්කරු කුලී ඇතුළු සියලු වියදම් සඳහා ණය ලබා ගැනීමේදී වැඩි වශයෙන් රු. 2,000,000- 3,000,000 ක් අතර ණය ප්‍රමාණයක් ලබාගනී.

3.14 සංඛ්‍යා සටහන : වී මෝල්හිමියන්ගේ ණය ලබා ගැනීමේ ස්වරූපය

| ණය ගැනීමට හේතුව | ණය ප්‍රමාණය (රුපියල් ලක්ෂවලින්) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 5 - 10 | 10 - 20 | 20 - 30 | 30 - 40 | 50 ට වැඩි | මුළු ප්‍රතිශතය |
| 1. වී මිලදී ගැනීම | 11.3 | 8 | 5.1 | 5.2 | 11.4 | **42.0** |
| 2. යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 5.7 | 11.4 | 8.5 | - | - | **26.8** |
| 3. ශ්‍රමික කුලී ගෙවීම් සඳහා | - | 5.9 | 17.6 | - | 5.9 | **31.2** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- (2004)

වී මෝල්හිමියන් විසින් විවිධ අරමුණු සඳහා ණය ලබාගෙන ඇත්තේ, 10% -20% අතර වූ පොලී අනුපාතයක් යටතේය. මෙහිදී ඔවුන් විසින් ප්‍රධාන ණය මූලාශ්‍රය ලෙස තෝරා ගෙන ඇත්තේ රාජ්‍ය බැංකුයි (66%). රාජ්‍ය බැංකුවලින් ණය මුදල් ලෙස වැඩි වශයෙන් ලබා ගෙන ඇත්තේ රු.5,000,000/=ට වැඩි ප්‍රමාණයකි. දෙවනුවට වැදගත් ණය මූලාශ්‍රය ලෙස පෞද්ගලික බැංකු (26%) භාවිතා කර ඇත.ඒ තුළින් වැඩි වශයෙන් ණය මුදල් ලෙස ලබාගෙන ඇත්තේ රු.2,000,000/= -3,000,000/= අතර ප්‍රමාණයකි. රාජ්‍ය බැංකුවලින් වැඩි වශයෙන්ම ණය ලබාගෙන ඇත්තේ වී මිලදී ගැනීම් සඳහා (45%) වන අතර පෞද්ගලික බැංකු මගින් වැඩි වශයෙන් ණය ලබාගෙන ඇත්තේ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමටය (20%). රාජ්‍ය බැංකුවලින් ණය ලබා ගැනීමේදී ප්‍රධාන වශයෙන්ම ක්‍රියාත්මක වී ඇත්තේ 10% - 15% අතර පොලී අනුපාතිකයක් වන අතර පෞද්ගලික බැංකු වැඩි වශයෙන් ක්‍රියාත්මක වී ඇත්තේ 15%-20%ක් අතර පොලී අනුපාතිකයකි.

**වෙළඳපළ පිළිබඳ ඇති දැනුම**

වෙළඳපළ පිළිබඳ ගොවීන්ගේ තුළ පවතින දැනුම පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් සාධක කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී,

01. වී වර්ග තෝරා ගැනීමේදී ඊට පෙර කන්නයේ පැවති වී මිල ගණන් සැලකිල්ලට යොමු කිරීම හෝ නොකිරීම
02. වී වර්ග තෝරා ගැනීමේදී සහල් වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ සැලකිල්ලට ගැනීම හෝ නොගැනීම

එයට අමතරව වී අලෙවි කිරීමේදී පවත්නා වී මිල ගණන් පිළබඳව සොයා බලන්නේ ද ? යන්න සහ මිල ගණන් උච්චාවචනය වන කාලයන් පිළිබඳව අවබෝධයක් පවතින්නේ ද? යන කරුණු වැදගත් වේ.

මූලික ලෙසම ගොවීන් වී වගා කිරීමේදී වී වර්ග තෝරා ගනු ලබන්නේ පෙර කන්නයේදී වගා කළ වී වර්ගවල සම්බා, නාඩු (සුදු), නාඩු (රතු )මිල ගණන් සැලකිල්ලට ගැනීමෙන් නොවේ. එහිදී ගොවීන් වී වර්ග තෝරා ගනු ලබන්නේ පහත සඳහන් සාධකවලට ප්‍රමුඛත්වයක් දෙමිනි. එනම්,

1. ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන සහ පසේ යෝග්‍යතාවට අනුව කන්නය අනුව වී වර්ග තෝරා ගනී.
2. යායේ අනෙකුත් ගොවීන් වගා කරනු ලබන වී වර්ගය අනුව වී තෝරා ගනී.
3. ජල සැපයුමේ ස්වරූපය අනුව (කන්නය ආරම්භයේදීම ජලය සපයනවාද? නැද්ද? යන්න මත සහ පවතින ජල ධාරිතාව අනුව)
4. කලින් කන්නයේ වගා කළ වී වර්ගයම තෝරා ගැනීම
5. හදිසි වගා කටයුතු සඳහා නාඩු තෝරා ගැනීම
6. නාඩුවලට සාපේක්ෂව සම්බා මිල ගණන් සමස්තයක් ලෙස ඉහල වීම
7. බිත්තර වී නිෂ්පාදනය අරමුණු කොට ගෙන වගා කිරීම
8. සම්බා සහ නාඩු යන වී වර්ග දෙකම වගා කිරීම
9. අස්වැන්න වැඩි යැයි සිතන වී වර්ග තෝරා ගැනීම
10. ලැබෙන බිත්තර වී වර්ගය අනුව වගා කිරීම

තවද ගොවීන් වී වර්ග තෝරා ගැනීමේදී ප්‍රධාන වශයෙන් සහල් වෙළඳපළ ඉල්ලුම පිළිබඳව ද සැලකිල්ලක් නොදක්වයි. නමුත් ගොවීන් ප්‍රධාන වශයෙන් වී අලෙවි කිරීමේදී පවතින මිල ගණන් කෙරෙහි සැලකිල්ලක් දක්වනවාක් මෙන්ම මිල ගණන් උච්ඡාවචනය වන කාල පරිච්ඡේදයන් පිළිබඳව ද අවබෝධයක් පවතී. එනම්, වී අස්වනු නෙළන කාලය තුළ (මාර්තු/අප්‍රියෙල් හා ජූලි/ අගෝස්තු/ සැප්තැම්බර්) මිල ගණන් පහළ යන බවත් වී වගා කටයුතු ආරම්භ කරන අවස්ථාවලදී (දෙසැම්බර්/ජනවාරි හා අප්‍රියෙල්/මැයි) ඉහළ මිල ගණන් පවතින බවටත් අවබෝධයක් පවතී.

3.15 සංඛ්‍යා සටහන : ගොවීන් තුළ වෙළඳපොළ තොරතුරු පිළිබඳව ඇති දැනුම

| වෙළඳපොළ තොරතුරු | අවබෝධයක් ඇත/නැත | ගොවිජන සේවා බල ප්‍රදේශය | | | | | සමස්ත නියැදිය |
|---|---|---|---|---|---|---|---|
| | | හිඟුරක්ගොඩ | මනම්පිටිය | මැදිරිගිරිය | සේවාගම | බකමූණ | |
| සහල් වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ අවබෝධය | ➢ ඇත | 5.5 | 4.9 | 5.9 | 9.7 | 6.9 | 33 |
| | ➢ නැත | 14.6 | 14.6 | 13.8 | 11.1 | 12.8 | 67 |
| වී අලෙවි කිරීමේදී පවතින මිල ගණන් කෙරෙහි ඇති අවබෝධය | ➢ ඇත | 20.2 | 18.0 | 19.6 | 20.0 | 19. | 97.4 |
| | ➢ නැත | 0.0 | 1.6 | 0.2 | 0.8 | 0.0 | 2.6 |
| මිල ගණන් උච්චාවචනය වන කාලයන් පිළිබඳ වූ අවබෝධය | ➢ ඇත | 20.2 | 16.4 | 19.6 | 18.8 | 19.8 | 94.7 |
| | ➢ නැත | 3.2 | 0.2 | 2.0 | 0.0 | 0.0 | 5.1 |

මූලාශ්‍ර : පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය - 2004

### 3.3.3 පහසුකම් සැපයීමේ කාර්යය (Facilitating function)

පහසුකම් සැපයීමේ කාර්යයේදී ප්‍රධාන වශයෙන් වෙළඳපළ පිළිබඳ තොරතුරු, ණය පහසුකම්, වෙළඳපළ නීතිරීතිවලට අනුකූලවීම ආදිය ඇතුළත් වේ. වී අලෙවිකරණ ක්‍රියාවලිය තුළ පහසුකම් සැපයීමේ කාර්යය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අධ්‍යයනය සඳහා යොදාගත් ගොවිජන සේවා බලප්‍රදේශ පහ තුළදීම යල, මහ දෙකන්නයටම ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් ණය පහසුකම් ලබාගෙන තිබේ. එනම්, මහ කන්නයේදී සමස්ත ගොවීන්ගෙන් 85.4%ක් ණය ලබාගෙන ඇති අතර, යල කන්නයේදී 80.4%ක් ණය ලබාගෙන ඇත. වී වගා කටයුතු සඳහා ගොවීන් බහුල වශයෙන් ණය පහසුකම් ලබාගෙන ඇත්තේ, ගොවිජන බැංකුවෙන් (30%) වූ අතර රාජ්‍ය බැංකුවලින් (18%) සහ ගමේ තෙල්/පොහොර අලෙවි කරන්නාගෙන් ද (18%) ප්‍රධාන ලෙස ණය ලබාගෙන ඇත. පෞද්ගලික බැංකු (1%) මුදල් ණයට දෙන්නන් (9.8%), නෑදෑයින් (8.0%), රාජ්‍ය නොවන සංවිධාන (2.8%), වී මිලදී ගන්නන් (9.5%) සහ සමෘද්ධි බැංකුව (6.1%) යන ණය දෙන ආයතන සහ ආයතනික නොවන මාර්ගවලින් ගොවීන් ණය ලබා ගැනීමට කටයුතු කර ඇත්තේ ඉතා සුළු වශයෙනි. ණය ලබාගත් ගොවීන්ගේ මූලික අරමුණ වූයේ තෙල්/පොහොර මිලදී ගැනීම (57%) සඳහා මුදල් සපයා ගැනීමයි. එයට අමතර අනෙකුත් සියලුම වගා කටයුතු සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමේ (23%) අරමුණින් ද ණය ලබාගෙන තිබුණි. මෙහිදී 2002/03 මහ කන්නය තුළදී ගොවීන් විසින් ලබා ගත් ණය ප්‍රමාණයන් 3.15 සංඛ්‍යා සටහනින් දැක්වේ.

3.16 සංඛ්‍යා සටහන: ගොවීන් ලබාගත් ණය ප්‍රමාණය 2002/03 මහ කන්නය

| ගොවිජන සේවා බල ප්‍රදේශය | ණය මුදල් ප්‍රමාණය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **<10,000** | **10,000 = <20,000** | **20,000= < 30,000** | **30,000 =< 40,000** | **40,000 =< 50,000** | **=>50,000** | සමස්ත නියැදිය |
| හිගුරක්ගොඩ | 16.3 | 47.7 | 23.3 | 5.8 | 1.2 | 5.8 | 100.0 |
| මනම්පිටිය | 40.8 | 40.8 | 10.2 | 3.1 | 3.1 | 1.0 | 100.0 |
| මැදිරිගිරිය | 36.1 | 32.5 | 13.3 | 15.7 | 1.2 | 1.2 | 100.0 |
| සේවාගම | 24.1 | 38.0 | 20.3 | 5.1 | 6.3 | 5.1 | 100.0 |
| බකමූණ | 33.3 | 59.3 | 1.2 | 3.7 | 2.5 | 0.0 | 100. |
| **එකතුව** | **30.4** | **43.6** | **13.7** | **6.6** | **2.8** | **2.9** | 100.0 |

මූලාශ්‍ර : පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය - 2004

මෙහිදී ණය ලබා ගැනීම් සම්බන්ධව ගොවීන් විසින් සඳහන් කර ඇත්තේ වගා කටයුතු සඳහා මුදලින් හෝ ගොවි ජන බැංකුවලින් කෘෂිකාර්මික අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වන ණය ප්‍රමාණයන් පමණි. සමස්ත ගොවීන්ගෙන් 85%ක ප්‍රමාණයක් ලබාගත් ණය සම්පූර්ණයෙන්ම පියවීමට කටයුතු කර ඇති අතර, 3%ක් මුළු ණය පියවා නොමැත. මෙසේ ණය පියවා නොමැත්තේ ලබා ගත හැකිවූ ආදායම අඩුවීම හේතුවෙනි.

වී අලෙවිකරණ ක්‍රියාවලිය තුළදී අතරමැදියෙකු ලෙස කටයුතු කරන ව්‍යාපාරිකයන් විශාල ලෙස (93%) ණය මුදල් ලබාගෙන ඇති අතර එහි මූලික අරමුණ වී තිබුණේ, වී මිලදී ගැනීමයි. එහිදී ඔවුන් ප්‍රධාන වශයෙන් (54%) ණය ලබා ගෙන ඇත්තේ රාජ්‍ය බැංකුවලිනි. ඊට අමතරව සුළු වශයෙන් පෞද්ගලික බැංකුවලින් (11%)ක් ද, ණය ලබාගෙන ඇත. නමුත් ආයතනික නොවන ආකාරයට ණය ලබා ගැනීම් ද වෙළඳුන් විසින් සිදු කර ඇති අතර මුදල් ණයට දෙන්නන් (7.1%), වී මිල දී ගන්නන් (14%), සහ නෑදෑයින් (14%) ඒ අතර වැදගත් වේ. රාජ්‍ය හා පෞද්ගලික බැංකු මගින් විධිමත් ලෙස ලබා ගන්නා ලද ණය ව්‍යාපාරිකයන් විසින් සම්පූර්ණයෙන්ම පියවා ඇති (96%) අතර ඉතිරි 4% ප්‍රමාණය ණය පියවීම ඉදිරියට සිදු කරගෙන යාමට කටයුතු කරයි. මෙලෙස ණය ගෙවීම් ප්‍රමාදයට බලපා ඇති ප්‍රධාන හේතු සාධකයවී ඇත්තේ අඩු ලාභයක් ලැබීමයි.

ගොවියා සහ ව්‍යාපාරිකයා මෙන්ම වී මෝල් හිමියා විසින් ද ණය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ණය ලබා ගැනීමට කටයුතු කරන වී මෝල් හිමියන් ප්‍රමාණය 44% කි. ණය ලබා නොගන්නා වී මෝල් හිමියන්ගේ සංඛ්‍යාව 57% ක් වේ. මේ අනුව ණය ලබා ගන්නා ප්‍රමාණයට සාපේක්ෂව ණය ලබා නොගන්නා වී මෝල් හිමියන්ගේ ප්‍රමාණය ඉහළ බැවින් ඔවුන්ගේ කටයුතුවලට අවශ්‍ය අරමුදල් සපයා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍ර වන්නේ තැන්පතු මුදල් භාවිතය (38%) . හිතවතුන්ගෙන් මුදල් අතමාරු (21%) සහ දෛනික ව්‍යාපාරික ලාභ (21%) වේ.

සිව්වන පරිච්ඡේදය

# අලෙවි ගැටළු සහ මිල විශ්ලේෂණය

## 4.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයේදී වී අලෙවියේදී ගොවීන්, වී එකතු කිරීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්, මෙන්ම වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු පිළිබඳව විග්‍රහ කෙරේ. එයට අමතරව ගොවීන්, ව්‍යාපාරිකයන් සහ වී මෝල් හිමියන් යන පාර්ශව තුනම තම ගැටළු සඳහා ඉදිරිපත් කළ යෝජනා ඉදිරිපත් කෙරේ. එමෙන්ම මිල ප්‍රවණතා, මිල උච්චාවචනයන් සහ ඒ සඳහා බලපාන හේතු කාලීන මිල වෙනස්වීම්, මිල ව්‍යාප්තීන්, මිල පැතිරීම (price spread) පිළිබඳ විග්‍රහ කෙරේ. එමෙන්ම

## 4.2 වී අලෙවියේදී ගොවීන් මුහුණදෙනු ලබන ගැටළු සහ දුෂ්කරතා

### 4.2.1 ඇසුරුම්කරණය සම්බන්ධ ගැටළු

වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙනු ලබන ගැටළු ඇසුරුම්කරණයේ සිට වී අලෙවිකර මුදල් ලබාගැනීම දක්වා වූ ක්‍රියාදාමය පුරාම පැතිර පවතී. අධ්‍යයනයට ලක් කළ නියැදියෙන් 92.4%ක් ඇසුරුම්කරණය සම්බන්ධ වූ විවිධ ගැටළුවලට මුහුණ දෙන බව අනාවරණය විය. වී ඇසුරුම්කරණයේදී ගොවීන්ගෙන් 98%ක් පොහොර උර භාවිතා කරන අතර ඉතිරි පිරිස ගෝනි පාවිච්චි කරනු ලබයි. ගොවීන්ගෙන් 93%ක්ම වී ඇසිරීම සඳහා පාවිච්චි කරනු ලබන්නේ තමන් සතු ඇසුරුම් මළු වන අතර වී මිලදී ගන්නන් සතු ඇසුරුම් මලු භාවිතා කරන්නේ 07%ක් තරම් සුළු පිරිසකි. වී ඇසිරීම සඳහා භාවිතා කරනු ලබන හිස් පොහොර උරයක දළ වශයෙන් වී කිලෝ ග්‍රෑම් 50 - 60ත් අතර වී ප්‍රමාණයක් අසුරනු ලැබිය හැකිය. වී ඇසුරුම්කරණය සඳහා භාවිතා කරනු ලබන හිස් පොහොර මලු කල් තබාගත නොහැකිවී, මිල ඉහළයාම, අලෙවියෙන් පසු නැවත ලැබෙන මලු හොඳ තත්ත්වයේ නොවීම හෝ ඒවා නැවත නොලැබීම එම ගැටළු අතර මූලික වේ. එම ගැටළු අතරින් ප්‍රබලම ගැටළුව වී ඇත්තේ ගොවීන් මිලට ගන්නා පොහොර උර කල්තබා ගත නොහැකිවීමයි (4.1 සංඛ්‍යා සටහන).

4.1 සංඛ්‍යා සටහන : ඇසුරුම්කරණය සම්බන්ධව ගොවීන් මුහුණදෙන ගැටළු (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගැටළුව | ගොවිජන සේවා බලප්‍රදේශය* | | | | | සමස්ත නියැදිය |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇළහැර/ බකමූණ % | % |
| 1. ඇසුරුම් මිළ ඉහළ යාම | 38.9 | 27.5 | 36.6 | 32.7 | 35.8 | 34.1 |
| 2. ඇසුරුම් මාධ්‍ය හිගකම | 9.2 | 11.1 | 6.6 | 8.3 | 4.2 | 8.0 |
| 3. අලෙවියෙන් පසු නැවත නොලැබීම | 4.4 | 12.6 | 6.2 | 9.8 | 3.3 | 7.5 |
| 4. නැවත ලැබෙන මලු හොඳ තත්ත්වයේ නොවීම | 4.8 | 19.1 | 10.7 | 11.3 | 15.3 | 12.3 |
| 5. ඇසුරුම් කල්තබා ගත නොහැකිවීම | 42.8 | 29.8 | 39.9 | 38.0 | 41.4 | 38.1 |
| **එකතුව** | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

*ගැටළුවට මුහුණදුන් සංඛ්‍යාව වූ 462හි ප්‍රතිශතයක් ලෙස සංඛ්‍යා සටහන ඉදිරිපත් කර ඇත

මූලාශ්‍ර:- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 38%කට ආසන්න ප්‍රමාණයක් ඇසුරුම් මලු කල් තබා ගත නොහැකිවීම ගැටළුවක් ලෙස දක්වා ඇති අතර ගොවීන් සමග සාකච්ඡා කිරීමේදී අනාවරණය වූයේ, ඇසුරුම් මලු කන්න දෙකකට වඩා භාවිතා කිරීමට නොහැකි බවයි. මේ සමග බැඳුණු අනෙක් ප්‍රධාන ගැටළුවක් වන්නේ පොහොර උරවල මිල ඉහළ යාමයි. සාමාන්‍යයෙන් පොහොර උරයක මිල රු: 15.00 - 20.00 අතර වේ. මෙම මුදල ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස්වන අතර හිගුරක්ගොඩ සහ මනම්පිටිය ගොවිජන සේවා බලප්‍රදේශවල පොහොර උරයක මිල සාමාන්‍යයෙන් රු: 15.00 - 20.00 අතර වේ. මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයට අයත් බේබියාවැව ප්‍රදේශයේ එම මිල රු:

18-20 ක් අතර වේ. අධ්‍යයනයට ලක්වූ අනෙකුත් ප්‍රදේශවල පොහොර උරයක සාමාන්‍ය මිල වන්නේ, රු: 18.00 කි. එක් උරයක දළ වශයෙන් කිලෝග්‍රෑම් 50-60ක් අතර ප්‍රමාණයක් අසුරනු ලැබිය හැකිය. නමුත් ඇසිරිය හැකි ප්‍රමාණය වී වර්ගය අනුව වෙනස් වේ. මේ අනුව ඇසුරුම් සඳහා වාර්ෂිකව ඉතා ඉහළ මිලක් වැය කිරීමට ගොවීන්ට සිදුවී ඇත.

එක් එක් ගොවිජන සේවා බලප්‍රදේශ අනුව ඇසුරුම්කරණය සම්බන්ධ ගැටළු විමසා බැලීමේදීද පැහැදිලි වන්නේ සෑම ගොවිජන සේවා බලප්‍රදේශයකම ඇසුරුම් සම්බන්ධව පවතින ප්‍රධාන ගැටළුව, ඇසුරුම් මලු ඉක්මණින් විනාශවීම බවයි.

මෙයට අමතරව රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් ඇසුරුම් සම්බන්ධ ගැටළු දෙකකට මුහුණදෙනු ලබයි. එනම්,

1. ඇසුරුම් මලු සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම.
2. ඇසුරුම් මලු නැවත ලබා නොදීම වශයෙනි.

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීහු 43.8%ක් ඇසුරුම් සම්බන්ධ ගැටළු වලට මුහුණදෙනු ලබයි. ගොවීන්ගෙන් 29.2%ක් සඳහන් කරනුයේ රාජ්‍ය අංශයට වී අලෙවිකළ පසු තමන්ට නැවත ඇසුරුම් මලු නොලැබෙන බවයි (වගු සටහන් අංක 4.4). නියැදියෙන් 11.2% රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට නැවත ඇසුරුම් මලු ලැබුන ද තමන් ලබාදුන් අළුත් ඇසුරුම් මලු වෙනුවට ලැබෙන ඇසුරුම මලු ප්‍රයෝජනයට ගත නොහැකි, පරණ ඒවා බව සඳහන් කරනු ලබයි. මෙම ගැටළුවට මුහුණ දෙනු ලබන ගොවීන් සඳහන් කරනුයේ, එවැනි ඇසුරුම් මලු හෝ ලබාගැනීමට ප්‍රවාහන වියදම් දරා ගනිමින් කිහිප වතාවක් අදාළ ආයතන වෙත යාමට සිදුවීම තම අත්දැකීම බවයි.

කෙසේ වුවද පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ඇසුරුම් මලු නැවත ලබා ගැනීම ගැටළුවක් ලෙස සඳහන් කර ඇති ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 0.2% ක් පමණි. මේ අනුව පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ඇසුරුම් මලු සම්බන්ධ ගැටළුවකට මුහුණදීමට ගොවීන්ට සිදු නොවන අතර එහිදී ව්‍යාපාරිකයන් තම ඇසුරුම් මලුවලට වී ඇසිරීම එයට හේතුවී ඇත.

### 4.2.2 ප්‍රවාහන වියදම්

මෙයට පෙර අධ්‍යයනයන්හිදී ද (බෝගහවත්ත, 03, සෝමරත්න, 1987, 16) වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළුවක් ලෙසින් ප්‍රවාහන වියදම් අනාවරණය කර ඇත. ප්‍රවාහන වියදම් අධිකවීම ගොවීන් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළුවක් ලෙසින් මෙම අධ්‍යයන ප්‍රතිඵලවලින් ද තහවුරු කරනු ලබයි. අධ්‍යයනයට ලක්වූ නියැදියෙන් 99.3% (497)ක් තමන් කිසියම් අන්දමක ප්‍රවාහන ගැටළුන්ට මුහුණ දෙන බව සඳහන් කර ඇත. මෙම ප්‍රවාහන ගැටළු අතර ප්‍රවාහන වියදම් අධිකවීම, නිසියාකාර මාර්ග පහසුකම් නොවීම, ප්‍රවාහන පහසුකම් හිඟය ප්‍රධාන කරුණු වේ. මෙයට අමතරව වී ප්‍රවාහනය කළයුතු දුර ප්‍රමාණය අධිකවීම, ප්‍රවාහනයේ පවතින අඩු කාර්යක්ෂමතාව හේතු කොට ගෙන නිසි වේලාවට ප්‍රවාහනය කරගත නොහැකිවීම ප්‍රවාහනය සම්බන්ධයෙන් ගොවීන් මුහුණ දෙනු ලබන අනෙකුත් ගැටළු අතර වේ. අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 41%ක් අධික ප්‍රවාහන වියදම තම ප්‍රවාහන ගැටළුව ලෙසින් සඳහන් කර ඇති අතරම මාර්ග පහසුකම් නොවීම ගැටළුවක් ලෙසින් 39%ක් සඳහන් කර ඇත (සංඛ්‍යා සටහන අංක 4.2). ගොවිජන සේවා බලප්‍රදේශ අනුව විමසීමේදී නගරයට තරමක් ආසන්නව පිහිටි හිගුරක්ගොඩ ප්‍රදේශයේ 52%ක් තම ප්‍රවාහන ගැටළුව ලෙසින් පෙන්වා දෙන්නේ ප්‍රවාහන වියදම් අධිකවීමයි. එමෙන්ම ඇලහැර - බකමූණ ප්‍රදේශයේ මෙම ගැටළුවට මුහුණ දෙනු ලබන පිරිස 49%කි (සංඛ්‍යා සටහන් අංක 4.2).

4.2 සංඛ්‍යා සටහන : ප්‍රවාහන මාධ්‍ය භාවිතයේදී මුහුණදෙන ගැටළු ගොවිජන සේවා බලප්‍රදේශ අනුව

| ගැටළුව | ගොවිජන සේවා බලප්‍රදේශය * | | | | | සමස්ත නියැදිය % |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇළහැර/ බකමූණ % | |
| මාර්ග පහසුකම් නොවීම | 31.3 | 36.0 | 50.8 | 38.4 | 33.3 | 39.0 |
| ප්‍රවාහන පහසුකම් හිඟය | 14.9 | 25.6 | 14.1 | 19.8 | 16.0 | 19.1 |
| අධික ප්‍රවාහන වියදම | 52.2 | 37.2 | 33.6 | 41.9 | 49.4 | 40.8 |
| අධික දුරක් ප්‍රවාහනය කිරීමට සිදුවීම | 1.5 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.2 |
| අඩු කාර්යක්ෂමතාව නිසා නිසි වේලාවට ප්‍රවාහනය කිරීමට නොහැකිවීම | 0.0 | .20 | 1.6 | 0.0 | 1.2 | 0.9 |
| **එකතුව** | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

*ගැටළුවට මුහුණ දුන් සංඛ්‍යාව වූ 497 හි ප්‍රතිශතයක් ලෙස සංඛ්‍යා සටහන ඉදිරිපත් කර ඇත.

මූලාශ්‍ර:- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

ගොවීන් වී ප්‍රවාහනය කිරීමේදී වී මිටියකට හෝ වී තොගයකට වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබයි. ගොවීන් සමග සිදුකරන ලද අවිධිමත් සම්මුඛ සාකච්ඡා මගින් හෙළි වූ අන්දමට ප්‍රවාහන වියදම් ගෙවීමේදී වී මල්ලක් සඳහා රු.10-12 දක්වා මුදලක් ගෙවීමට සිදු වේ. වී ප්‍රවාහනය සඳහා ගොවීන් භාවිතා කරනු ලබන මාධ්‍ය වන්නේ රෝද හතරේ ට්‍රැක්ටරය සහ අත් ට්‍රැක්ටරයයි. මනම්පිටිය, අසේලපුර ප්‍රදේශයේ ගොවීන්ට වී ප්‍රවාහනය සඳහා විශේෂයෙන් වියදම් දැරීමක් සිදු නොවන අතර ගොවීන්ගේ වී, ගොවිපලේ සිට නිවසට රැගෙන ඒම සිදු කරන්නේ කොළ මැඩීම කරනලද ට්‍රැක්ටර්කරුවන් විසිනි. ගොයම් කැපීම, පෑගීම, අට්ටි ගැසීම, නිවසට රැගෙන ඒම යන සියළු කාර්යයන් ප්‍රථමයෙන් ගිවිසගත් මුදලකට සිදුකරනු ලබයි. අනෙක් ප්‍රදේශවල තමන්ගේ හෝ කුලියට ලබාගත් අත්ට්‍රැක්ටර් වී ප්‍රවාහනය සඳහා බහුලව යොදා ගැනෙන මාධ්‍යය වේ.

වී ප්‍රවාහන වියදම ප්‍රදේශය, ප්‍රවාහන මාධ්‍ය, මාර්ග පහසුකම් මෙන්ම මිටියකට හෝ තොගයන්ට ගෙවීම ආදී විවිධ හේතු සාධක අනුව වෙනස් වේ. වී ප්‍රමාණයේ හෝ ප්‍රවාහන දුරෙහි වැඩිවීමත් සමග ගොවීන් වී ප්‍රවාහනය සඳහා දරණ වියදමද ඉහළ යයි.

මෙම වියදමට අමතරව ගොවීන්ට තම වී කමතේ සිට නිවසට හෝ නිවසේ සිට වෙළඳ මධ්‍යස්ථානය වෙත ප්‍රවාහනය කිරීමේදී වී පැටවීම සහ බෑම, අට්ටි ගැසීම ආදී කාර්යයන් සඳහා ශ්‍රමික කුලියක් ගෙවීමට සිදුවේ. මනම්පිටය සහ ඇළහැර/බකමූණ ගොවිජන සේවා බලප්‍රදේශය තුළ වී ප්‍රවාහනයට සම්බන්ධ ශ්‍රමික කුලිය සඳහා ගෙවීමක් සිදු නොවේ. එයට හේතු සාධක වන්නේ ගොයම් කැපීමේ සිට අස්වැන්න නිවසට ගෙන ඒම සඳහා වූ සියළු කාර්යයන් ඇතුළත්ව, කොන්ත්‍රාත් ක්‍රමයට සිදු කිරීමයි. එමෙන්ම මෙම ප්‍රදේශයේ පවතින ප්‍රවාහන අපහසුතා නිසා වෙළඳ මධ්‍යස්ථාන කරා වී ගෙනයාම ඉතා අඩුවෙන් සිදුවන අතරම නිවසට පැමිණෙන වෙළෙඳුන් විසින් වී මිලට ගැනීම සිදු කරනු ලබයි. වී ප්‍රවාහනය සම්බන්ධ කටයුතුවල ශ්‍රමික කුලිය පවතින වී ප්‍රමාණය සහ ප්‍රදේශය අනුව වෙනස් වේ. මෙම වියදම් සඳහා තම පවුලේ ශ්‍රමය ඇතුළත් කර නොමැති අතර රුපියල් 500 සිට ඉහළ මිලක් ඒ සඳහා වැය කිරීමට සිදුවේ.

ගොවීන්ගෙන් 10.6% රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන වෙත වී ප්‍රවාහනය සඳහා වියදම් දැරීමට සිදුවීම ගැටළුවක් ලෙසින් සඳහන් කරනු ලබයි. ප්‍රවාහන වියදම් අධික වීම, වී මිලට ගැනීම ප්‍රමාද වීම නිසා ප්‍රවාහන මධ්‍යන්ට වැඩිපුර මුදල් ගෙවීමට සිදුවීම, වී මිලට ගන්නා මධ්‍යස්ථානයන්ට පවතින දුර වැඩිවී නිසා වැඩි ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවීම සහ එම වියදම ගොවියාට දරා ගැනීමට සිදුවීම, විවිධ කරුණු ඉදිරිපත් කරමින් වී තොග නැවත හරවා එවීම නිසා කිහිප වතාවක් ගෙන යාමට වියදම් දැරීමට සිදුවීම ආදිය මෙම ගැටළුවට සම්බන්ධ අනෙකුත් සාධක වේ. පෞද්ගලික අංශයේ වෙළඳුන් කමතට හෝ නිවසට පැමිණ වී මිලට ගැනීම නිසා පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන්ට මෙම වියදම දැරීමට සිදු නොවේ.

වී ප්‍රවාහනයේදී රෝද හතරේ ට්‍රැක්ටරයට වඩා වැඩි මුදලක් අත් ට්‍රැක්ටරය වෙනුවෙන් ගෙවීමට සිදුවේ. එසේ වැඩි මුදලක් ගෙවීමට සිදුවුවත්, ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ අපහසුවත්, ප්‍රදේශයේ බහුල ප්‍රවාහන මාධ්‍යය අත්ට්‍රැක්ටරයවීමත් නිසා වී ප්‍රවාහනයේදී වැඩි වශයෙන් යොදා ගැනෙනුයේ අත් ට්‍රැක්ටරයයි. වී ප්‍රවාහනයේදී අවම මිලක් ප්‍රවාහන වියදම් වශයෙන් සඳහන් කර ඇති ගොවීන්ගේ ප්‍රවාහන මාධ්‍යය ඔවුන්ටම අයත් ඒවා වේ. ප්‍රවාහන මාධ්‍යය කුලියට ගැනීමේදී ඒ සඳහා ඉහළ මිලක් ගෙවීමට ඔවුන්ට සිදුවේ.

### 4.3 රාජ්‍ය /පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙන ගැටළු

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයටම වී අලෙවි කිරීමේදී මතුවන ගැටළු පිළිබඳව ගොවීන් කරුණු දක්වා ඇත. මෙහිදී දැනට රාජ්‍ය අංශයට වී අලෙවි නොකළද පෙර අවස්ථාවලදී වී අලෙවි මණ්ඩලය, සමුපකාර වැනි රාජ්‍ය අංශයේ ආයතනවලට මෙන්ම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට වී අලෙවි කිරීමෙන් ලද අත්දැකීම් ඔස්සේ ගොවීන් කරුණු ඉදිරිපත් කර ඇත. රාජ්‍ය අංශයට වී අලෙවියේදී තම වෙළඳපළ අතිරික්තය සම්පූර්ණයෙන් රාජ්‍ය අංශය විසින් මිලට නො ගන්නා හෙයින් ගොවීන්ට පෞද්ගලික අංශයටද වී අලෙවි කිරීමට සිදුවේ. මේ නිසා ගොවීන් රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම පවතින ගැටළු පිළිබඳව අවධාරණය කරනු ලබයි. 4.3 වගු සටහනින් පෙන්නුම් කරන ආකාරයට රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් ගැටළුවලට මුහුණපානු ලබන බව අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 95%ක් සඳහන් කරනු ලබයි. ඉතිරි 5% කිසි දිනෙක රාජ්‍ය අංශයට වී අලෙවි නොකළ, බිත්තර වී නිෂ්පාදනය කරනු ලබන, වී අලෙවි මණ්ඩලයට සම්බන්ධකම් තිබූ ආදී පිරිස්වලින් සමන්විත විය. අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 85%කට ආසන්න පිරිසක් පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී මතුවන ගැටළු හා දුෂ්කරතා සම්බන්ධව සඳහන් කර ඇත. එයට අයත් නොවූ 15%ට වී එකතු කිරීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්, වී එකතු කරන ව්‍යාපාරිකයන්ගේ ඥාතීන් හිතවතුන් හෝ දීර්ඝ කාලීනව ඔවුන් සමග වෙළඳ සබඳතා පවත්වන්නන්, වී මෝල් හිමියන් සහ බිත්තර වී නිෂ්පාදනය කරන්නන් ආදීන් ද ඇතුළත් විය.

4.3 වගු සටහන : රාජ්‍ය/පෞද්ගලික අංශවලට වී අලෙවියේදී ගැටළුවලට මුහුණපෑම (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගොවිජන සේවා බලප්‍රදේශය | ගැටළුවලට මුහුණදීම | |
|---|---|---|
| | රාජ්‍ය අංශය % | පෞද්ගලික අංශය % |
| හිඟුරක්ගොඩ | 97 | 82 |
| මනම්පිටිය | 97 | 88 |
| මැදිරිගිරිය | 99 | 98 |
| සේවාගම | 100 | 92 |
| ඇලහැර/බකමූණ | 82 | 64 |
| **සමස්ත නියැදිය** | **95.2** | **84.8** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

#### 4.3.1 රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණ දෙන ගැටළු

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙනු ලබන ගැටළු රාශියකි. එනම්,

1. ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම
2. මුදල් ලබාදීමේ ප්‍රමාදය
3. අලෙවි කිරීමේ ප්‍රමාදය
4. ඇසුරුම් වියදම් දැරීමට සිදුවීම
5. ප්‍රවාහන සහ නාට්ටාම් කුළී දැරීමට සිදුවීම
6. නිලධාරීන්ගේ අක්‍රමිකතා සහ වංචනික ක්‍රියා
7. සීමිත ප්‍රමාණයක් මිලට ගැනීම
8. මිලට ගැනීම් මධ්‍යස්ථාන දුර බැහැර පිහිටීම

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදුන් ගැටළු සහ ගොවීන්ගේ ප්‍රතිශතය ගොවිජන සේවා ප්‍රදේශ මට්ටමින් 4.4 සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

4.4 සංඛ්‍යා සටහන : රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගැටළුව | ගොවිජන සේවා බලප්‍රදේශය * | | | | | සමස්ත නියැදියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | හිඟුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇලහැර/ බකමූණ % | |
| අඩු මිලක් ලැබීම | 3.0 | 6.0 | 11.0 | 6.0 | 2.0 | 5.6 |
| ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම | 86.0 | 96.0 | 88.0 | 83.0 | 77.0 | 86.0 |
| මුදල් ලැබීමේ ප්‍රමාදය | 71.0 | 59.0 | 80.0 | 78.0 | 43.0 | 66.2 |
| අලෙවි කිරීමේ ප්‍රමාදය | 58.0 | 43.0 | 63.0 | 44.0 | 32.0 | 48.0 |
| ඇසුරුම්කරණ සම්බන්ධ ගැටලු | 56.0 | 34.0 | 45.0 | 57.0 | 26.0 | 43.8 |
| ප්‍රවාහන වියදම් දැරීමට සිදුවීම | 5.0 | 20.0 | 10.0 | 7.0 | 11.0 | 10.6 |
| අමතර ශ්‍රමික කුලී ගෙවීමට සිදුවීම | 18.0 | 12.0 | 12.0 | 24.0 | 4.0 | 14.0 |
| නිලධාරීන්ගෙ අක්‍රමිකතා/ අකාර්යක්ෂමතා | 20.0 | 33.0 | 24.0 | 37.0 | 8.0 | 24.4 |
| වී වලින් බර අඩු කිරීම | 18.0 | 23.0 | 25.0 | 27.0 | 18.0 | 22.2 |
| සීමිත ප්‍රමාණයක් මිලට ගැනීම | 6.0 | 4.0 | 4.0 | 4.0 | 0.0 | 3.6 |
| මිලට ගැනීමේ මධ්‍යස්ථාන ගම්වලට සමීපයේ නොවීම | 0.0 | 6.0 | 10.0 | 1.0 | 15.0 | 6.4 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

**ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම**

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණ දෙනු ලබන ප්‍රධානතම ප්‍රශ්නය ලෙසින් ඉදිරිපත් වී ඇත්තේ ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීමය. මෙය අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් (430) 86% ට බලපා ඇති අතර මනම්පිටිය ප්‍රදේශයේදී 96%ක් තරම් ඉහළ අගයක් ගනී. ගොවීන් මෙහිදී ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් යටතේ අදහස් ඉදිරිපත් කරනු ලබයි. එනම්,

i කිහිපවතාවක් වී පිරිසිදු කිරීමට සිදුවීම

ii දැඩිව පරීක්ෂා කිරීමෙන් අනතුරුව වී ප්‍රතික්ෂේප කිරීම

මෙම කරුණු දෙක යටතේ අදහස් දක්වා නොමැති තවත් පිරිසක් වීවල ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම තම ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරනු ලබයි. ගොවීන් සමග සිදුකරනු ලැබූ සාකච්ඡාවන්හිදී අනාවරණය වූ පරිදි නියමිත පරිදි පිරිසිදු කර රැගෙන යන වී තොගවල වුව ද බොහෝවිට නැවත බොල් ඉවත් කිරීමට සහ සල්ලඩි කිරීමට (ගල් ඉවත් කිරීමට) සිදුවේ. එසේ බොල්, ගල් ඉවත් කර නියමිත ප්‍රමිතියට ඉදිරිපත් කරනු ලැබුවද නිලධාරීන්ගේ වංචනික ක්‍රියා, ගබඩා පහසුකම් මදිවීම මුදල් ප්‍රමාණවත් නොවීම යන හේතූන් මත වී තොග ප්‍රතික්ෂේප කිරීම විවිධ අවස්ථාවල සිදුවී ඇත. සමස්ත නියැදියෙන් 65.2%ක් මේ යටතේ තම ගැටළුව ලෙස කිහිපරක් වී ශුද්ධ

කිරීමට සිදුවීම සඳහන් කර ඇති අතර 17.6%ක් වී වල ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම තම ගැටළුව ලෙස ඉදිරිපත් කරනු ලබයි.

**මුදල් ලැබීමේ ප්‍රමාදය**

ගොවීන්ගෙන් 66.2% (331)ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට මුදල් ලැබීමට ප්‍රමාදවීම ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරනු ලබයි. මේ ආකාරයට මුදල් ලැබීම ප්‍රමාදවීමේ කාලසීමාව සතියක සිට මාස 3ක් පමණ දක්වා වේ. මුදල් ප්‍රමාදයට අමතරව චෙක්පත්වලින් මුදල් ගෙවීම නිසා ඒවා බැංකු ගිණුමට බැර කිරීමට සිදුවීම සහ ඒ වෙනුවෙන් කිහිපවතාවක් ගමනාගමනයේ යෙදීමට සිදුවීම, බැංකු විසින් චෙක්පත්වලින් බැංකු කටයුතුවල යෙදීම වෙනුවෙන් කිසියම් මුදලක් අඩු කරගෙන ගොවියාට මුදල් ලබාදීම මේ සම්බන්ධ අනෙකුත් ගැටළු වේ. රාජ්‍ය අංශයට වී අලෙවියේදී මුදල් ප්‍රමාදයන් සිදුවීම ගැටළුවක් ලෙස සඳහන් කළ පිරිසෙන් ඒ ඒ ගැටළුවලට මුහුණදුන් ප්‍රතිශතය සහ සමස්ත නියැදියේ ප්‍රතිශතයක් ලෙස එම ගැටළුවලට මුහුණදුන් ප්‍රතිශතය 4.5 වගුවෙන් දැක්වේ.

4.5 වගු සටහන : රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී මුදල් ලැබීමේ ප්‍රමාදය හා සම්බන්ධ ගැටළු(ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගැටළුව | හිඟුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇලහැර/ බකමූණ % | සමස්ත නියැදිය % |
|---|---|---|---|---|---|---|
| සතියක් දක්වා මුදල් ප්‍රමාදවීම | 21.0 | 11.0 | 10.0 | 6.0 | 11.0 | 11.8 |
| සති දෙකක් දක්වා මුදල් ප්‍රමාදවීම | 14.0 | 03.0 | 14.0 | 12.0 | 09.0 | 10.4 |
| මාසයක් දක්වා මුදල් ප්‍රමාදවීම | 21.0 | 09.0 | 35.0 | 22.0 | 07.0 | 18.8 |
| මාසයකට වැඩි කාලයක් මුදල් ප්‍රමාදවීම | 06.0 | 07.0 | 14.0 | 17.0 | 00.0 | 8.8 |
| බැංකු ගිණුමට බැර කිරීමට සිදුවීම | 05.0 | 01.0 | 04.0 | 06.0 | 11.0 | 5.4 |
| බැංකු කටයුතු සඳහා වන ගාස්තු බැංකුව විසින් අඩු කර ගැනීම | 01.0 | 20.0 | 02.0 | 11.0 | 04.0 | 7.6 |
| හේතු ඉදිරිපත් නො කළ | 03.0 | 08.0 | 01.0 | 04.0 | 01.0 | 3.4 |
| **එකතුව** | **71.0** | **59.0** | **80.0** | **78.0** | **43.0** | **66.2** |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

ඉහත සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙන ආකාරයට ගොවීන්ගෙන් 75.2%ක් තමන් අලෙවි කළ වී සඳහා අයවිය යුතු මුදල් ලබා ගැනීමට සති එකේ සිට මාසයකට වැඩි කාලයක් බලා සිටිය යුතුය. මෙම කාලසීමාව මාසයක සිට මාස තුනක පමණ කාලසීමාවක පැතිර පවතී. මෙය සමස්ත නියැදියෙන් 49.8%ක් තරම් ඉහළ අගයක් ගනී. වගාවන්ට සහ අනෙකුත් අවශ්‍යතා සඳහා වූ ණය පියවීම, අස්වනු නෙළීම සඳහා වූ කුලී, ප්‍රවාහන වියදම් ආදිය ඉක්මණින් ගෙවීමට සිදුවීම තුළ රාජ්‍ය අංශයට වී අලෙවියේදී මුදල් ලැබීමේ ප්‍රමාදය ගොවියාට දැඩිව බලපානු ලබන කරුණක් බවට පත්වී ඇත.

**වී අලෙවි කිරීමේ ප්‍රමාදයන්**

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 48% (240)ක් තම වී, මිලදී ගන්නා ස්ථානයේදී අලෙවි කර ගැනීමේදී ප්‍රමාදයන්ට මුහුණදෙනු ලබයි. මෙම ගැටළු පිළිබඳ සඳහන් කරන ගොවීන්ගෙන් 67% (161)ක් දිනක් හෝ එයට වැඩි කාලයක් ඒ සඳහා පෝලිම්වල සිටීමට සිදුවන බව සඳහන් කරනු ලබයි. එම ප්‍රමාණය සම්පූර්ණ නියැදියෙන් 32.2%ක් තරම් ඉහළ ප්‍රතිශතයකි. දින කිහිපයක් වී අලෙවිකර ගැනීමට ප්‍රමාදවන බව හෙළි කළ ප්‍රතිශතය, සමස්ත නියැදියෙන් 26.8%ක් වේ. ඔවුන් දින 2-5 අතර කාලයක් ඒ සඳහා වැයවන බව සඳහන් කරනු ලබයි. පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මෙම ගැටළුවට මුහුණ නොදෙන අතර ව්‍යාපාරිකයන් නිවසට හෝ කමතට පැමිණ වී මිලට ගැනීම එයට හේතු වී ඇත.

## ශ්‍රමික කුලී ගෙවීමට සිදුවීම

වී බෑම, අට්ටි ගැසීම ආදී කාර්යයන් සඳහා ශ්‍රමිකයන් තම වියදමින් යොදවා ගැනීමට සිදුවීම රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී මතුවන ගැටළුවක් ලෙසින් 14% ක් පෙන්වා දී ඇත. මෙම කුලී ශ්‍රමිකයින්ට කුලී ගෙවීමේදී වී තොගයකට මුදලක් හෝ දෛනික කුලිය ගෙවීමට සිදුවේ. මෙය අමතර වියදමක් ලෙස ගොවීන් පෙන්වා දෙන්නේ පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට එම වියදම දැරීමට සිදු නොවන හෙයිනි.

## නිලධාරීන්ගේ අක්‍රමිකතා/අකාර්යක්ෂමතා

අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් 25% ආසන්න ගොවීන් සංඛ්‍යාවක් සඳහන් කරනුයේ, රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් වී මිලට ගැනීමේ නිරත නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ විවිධ අකටයුතුකම් සහ අකාර්යක්ෂමතාවන්ට මුහුණදෙනු ලබන බවයි. නිලධාරීන්ට අල්ලස් දීමට සිදුවීම (10.6%), නිලධාරීන් තම පුද්ගලික හිතවත්කම් මත, වී මිලට ගැනීම (8.4%), නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව (2.6%), වංචනික ආකාරයෙන් වී මැනීම (0.6%), වී මලු සොරකම් කිරීම (0.2) මෙම අක්‍රමිකතා වශයෙන් සඳහන් කර ඇත. තම වී අලෙවිකර ගැනීම සඳහා රු: 200/- සිට 1500/- අතර මිලක් නිලධාරීන්ට සහ සේවකයන්ට අල්ලස් වශයෙන් දීමට සිදුවන බව ගොවීන් අනාවරණය කරනු ලබයි. පුද්ගලික හිතවත්කම් මත වී මිලට ගැනීම මෙන්ම ගොවීන්ගේ වී මිලට ගැනීමට වඩා පෞද්ගලික අංශයේ වී එකතු කිරීමේ නිරත ව්‍යාපාරිකයන්ගේ වී මිලට ගැනීමට රාජ්‍ය අංශයේ නිලධාරීන් ප්‍රමුඛතාව දෙනු ලබන බවත්, එම වීවල ගුණාත්මක තත්ත්වය සැලකිල්ලට නො ගන්නා බවත් තම අත්දැකීම් ආශ්‍රයෙන් ගොවීන් සඳහන් කරනු ලබයි. එමෙන්ම වී අස්වනු නෙළන සමය ආරම්භවීමත් සමග වී මිලට ගැනීමට කටයුතු නොකිරීම ද රාජ්‍ය නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවන් ලෙස ගොවීහු පෙන්වා දෙති.

## වියළි බර සඳහා වීවලින් අඩු කිරීම

වීවල වියළි බර ලෙස සලකා වී මල්ලක බරෙන් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම රාජ්‍ය අංශයට වී අලෙවියේදී තමන් මුහුණපාන ගැටළුවක් ලෙසින් 22.2%ක් සඳහන් කරනු ලබයි. එම ගැටළුවට මුහුණදෙන පිරිසෙන් 64% (සමස්ත නියැදියෙන් 14.2%)ක් පවසන්නේ එසේ අඩු කරන ප්‍රමාණය කිලෝග්‍රෑම් 65 මිටියකට කිලෝග්‍රෑම් 01 ක් හෝ එයට අඩු ප්‍රමාණයක් වන බවයි. ගැටළුවට මුහුණදෙන පිරිසෙන් 32.4% (සමස්ත නියැදියෙන් 7.2%)ක් පවසන්නේ ඒ සඳහා අඩු කරන ප්‍රමාණය කිලෝග්‍රෑම් 65 මල්ලකට කිලෝග්‍රෑම් එකට වඩා වැඩිවන බවයි.

## සීමිත ප්‍රමාණයක් මිලට ගැනීම

ගොවීන්ගෙන් 3.6%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුව ලෙසින් වී සීමිත ප්‍රමාණයක් මිලට ගැනීම සඳහන් කරන අතර සීමිත පිරිසකගේ වී පමණක් මිලට ගැනීම සහ තමන් සතු සියලුම වී මිලට නො ගැනීම යන කරුණු දෙකම මෙයට ඇතුළත් වේ. රජය විසින් ගොවි සංවිධාන හෝ ගොවි ජනසේවා මධ්‍යස්ථාන හරහා වී මිලට ගැනීමේදී ගොවි සංවිධානයේ හෝ ගොවිජන බැංකුවේ සාමාජිකයන්ගේ වී පමණක් මිලට ගන්නා බවත්, අඳයට හෝ වී බද්දට කුඹුරු කරන පුද්ගලයින්ට මේ යටතේ වී අලෙවි කිරීමට අවස්ථාව නො ලැබෙන බවත් ගොවීන් විසින් අනාවරණය කෙරුණි.

## මිලට ගැනීමේ මධ්‍යස්ථාන නොවීම

ගොවීන්ගෙන් 6.4%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුවක් ලෙස රාජ්‍ය අංශයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන නොතිබීම හඳුනාගෙන ඇත. ඇලහැර - බකමූණ, මැදිරිගිරිය සහ මනම්පිටිය මෙම ප්‍රශ්නයට මුහුණ දී ඇති වැඩි පිරිසක් නියෝජනය කරන ප්‍රදේශ වේ. උපනගර ආශ්‍රිතව වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන පිහිටියත් එම මධ්‍යස්ථානවලට ඇති දුර ප්‍රමාණය වැඩිවීම ගොවීන් මුහුණදෙන ගැටළුවකි. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ගොවීන් මෙම ගැටළුව පිළිබඳ සඳහන් නොකිරීම විශේෂත්වයකි.

**වී සඳහා අඩු මිලක් ලැබීම**

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී වී නිෂ්පාදනය, ප්‍රවාහනය, ශුද්ධ කිරීම ආදී සියලු කාර්යයන්ට වැයවන මිලට සාපේක්ෂව ලැබෙන මුදලෙහි ලාභය අඩු බව පවසන ගොවීන්ගේ ප්‍රතිශතය 5.6% කි. රාජ්‍ය අංශයට අවශ්‍ය යැයි සැලකෙන ගුණාත්මක තත්ත්වයේ වී එයට වැඩි මිලකට පුද්ගලික අංශයට අලෙවි කළ හැකි බව ඔවුන්ගේ අදහසයි.

### 4.3.2 පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු

රාජ්‍ය අංශයට මෙන්ම පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ද තමන් විවිධ ප්‍රශ්නවලට මුහුණදෙන බව ගොවීන්ගෙන් 84.8%ක් අනාවරණය කර ඇත (4.6 සංඛ්‍යා සටහන). ඔවුන් මුහුණදෙන ගැටළු අතර,

i අඩු මිලක් ලැබීම
ii කිරුම්, මිණුම් වංචනික ආකාරයෙන් සිදු කිරීම
iii ඇසුරුම් බර/අඩු ගුණාත්මක තත්ත්වය සඳහා වීවලින් කිසියම් ප්‍රමාණයක් අඩුකිරීම
iv තැරැව්කරුවන්ට මුදල් ගෙවීමට සිදුවීම
v මුදල් ලැබීමේ ප්‍රමාදයන්
vi විකල්පයක් නොමැතිවීම ආදිය ප්‍රමුඛ වේ.

**4.6 සංඛ්‍යා සටහන : පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)**

| ගැටළු | ගොවිජන සේවා බලප්‍රදේශය | | | | | සමස්ත නියැදිය |
|---|---|---|---|---|---|---|
| | හිඟුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇලහැර/ බකමූණ % | % |
| අඩු මිලක් ලැබීම | 74.0 | 76.0 | 88.0 | 87.0 | 59.0 | 76.8 |
| විකල්පයක් නොමැතිවීම | 6.0 | 41.0 | 22.0 | 31.0 | 26.0 | 25.2 |
| වංචනික කිරුම්,මිණුම් භාවිතය | 5.0 | 29.0 | 14.0 | 10.0 | 8.0 | 13.2 |
| ඇසුරුම් බර සඳහා වී වලින් අඩු කිරීම | 1.0 | 13.0 | 0.0 | 7.0 | 1.0 | 4.4 |
| ගුණාත්මක තත්ත්වය සඳහා වී වලින්/මුදලින් අඩු කිරීම | 2.0 | 6.0 | 7.0 | 3.0 | 2.0 | 4.0 |
| තැරැව්කරුවන්ට මුදල් ගෙවීමට සිදුවීම | 1.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.2 |
| මුදල් ලැබීමේ ප්‍රමාද | 0.0 | 4.0 | 1.0 | 2.0 | 1.0 | 1.6 |
| ඇසුරුම් නැවත නොලැබීම | 0.0 | 0.0 | 1.0 | 0.0 | 0.0 | 0.2 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

**අඩු මිලක් ලැබීම**

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ප්‍රධාන ගැටළුව අඩු මිලක් ලැබීමයි. මෙම ගැටළුවලට අමතරව සහතික මිලට වඩා අඩු මුදලක් ගෙවීම, වෙළඳපොළට විශාල වී ප්‍රමාණයක් එකවර ලැබීම, වී ගුණාත්මක තත්ත්වයෙන් බාලවීම, වෙළෙන්දා විසින් මිල තීරණය කිරීම, වීවලින් කිලෝග්‍රෑමයක් දක්වා බර අඩු කිරීම ගොවීන් මුහුනදෙන ගැටළු වේ.

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 77% ආසන්න ප්‍රමාණයකට අඩු මිලක් ලැබෙන බව 4.6 සංඛ්‍යා සටහන අනුව පැහැදිලි වේ. මැදිරිගිරියේදී 88%ක් සහ සේවාගමදී 87%ක් තරම් ඉහළ ප්‍රතිශතයක් ද එම ගැටළුවට

මුහුණදී ඇත. මෙම එක් එක් ප්‍රදේශවල වී සඳහා අඩු මිල ගණන් ලැබීමට විවිධ හේතු බලපා ඇති අතර පොදුවේ තම එදිනෙදා අවශ්‍යතා සඳහා මුදල් අවශ්‍යවීම, වගාවන් සහ වෙනත් කටයුතු සඳහා වූ ණය පියවීමේ අවශ්‍යතාව ගුණාත්මක බව අඩුවීම, ගබඩා පහසුකම් නොවීම, විකල්පයක් නොමැති නිසා පෞද්ගලික වෙළෙඳුන්ට අඩු මුදලට හෝ වී විකිණීමට සිදුවීම, ප්‍රවාහන අපහසුතා නිසා නිවසට පැමිණෙන වෙළෙඳුන්ට අඩු මුදලට වී අලෙවි කිරීමට සිදුවීම, වෙළඳපළට එකවර විශාල වී සැපයුමක් සිදුවීම, ව්‍යාපාරිකයන් සමග පවතින විවිධ සම්බන්ධතා ප්‍රධාන හේතු සාධක වේ (වී මිල අඩුවීමට බලපාන හේතු පිළිබඳ මිල විශ්ලේෂණයක් තුන්වන පරිච්ඡේදයේදී ඉදිරිපත් කර ඇත).

4.7 වගු සටහන : වී සඳහා පෞද්ගලික අංශයෙන් අඩු මිලක් ලැබීම සම්බන්ධ සාධක

| හේතුව | ගොවිජන සේවා බලප්‍රදේශය * | | | | | ගැටළුවට මුහුණදුන් සමස්තයේ % |
|---|---|---|---|---|---|---|
| | හිඟුරක්ගොඩ % | මනම්පිටිය % | මැදිරිගිරිය % | සේවාගම % | ඇලහැර/ බකමූණ % | |
| වෙළෙන්දා මිල තීරණය කිරීම | 83.8 | 57.9 | 81.8 | 79.3 | 94.9 | 78.9 |
| වෙළඳපොලට වී සැපයුම වැඩිවීම | 5.4 | 2.6 | 12.5 | 17.2 | 1.7 | 8.6 |
| අඩු ගුණාත්මක තත්ත්වය | 0.0 | 0.0 | 4.5 | 2.3 | 1.7 | 1.8 |
| කි.ග්‍රෑ.1 දක්වා වී වලින් අඩුකිරීම | 0.0 | 0.0 | 0.0 | 1.1 | 0.0 | 0.3 |
| හේතුවක් සඳහන් නොවූ | 10.8 | 39.5 | 1.1 | 0.0 | 1.7 | 10.4 |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

*අඩු මිලක් ලැබීම තම ගැටළුව ලෙස ඉදිරිපත් කළ සංඛ්‍යාව වූ 385හි ප්‍රතිශතයක් ලෙස මෙම වගු සටහන ඉදිරිපත් කර ඇත.
මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

අධ්‍යයනය සිදු කෙරෙන කාලය තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2003/2004 මහ කන්නයේ අස්වනු නෙළීම ආරම්භ වී තිබූ අතර කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් මාර්ගයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ වී මිලට ගැනීමේ කටයුතු ආරම්භ කර තිබිණි. එහිදී වී කිලෝග්‍රෑමයක් රුපියල් 15.00 බැගින් මිලට ගැනීමට සිදුවූ නමුත්, පෞද්ගලික අංශයේ වී මිලට ගන්නන් වී සඳහා ගෙවූ මුදල් හිඟුරක්ගොඩ ප්‍රදේශයේදී රු:10.00-12.00 අතර විය. මනම්පිටිය, අසේලපුර ප්‍රදේශයේ එම මිළ රු 9.00-10.00 අතර විය. මැදිරිගිරිය බේබියාවැව ප්‍රදේශයේ එම මුදල 9.00-11.00 අතර වූ බව නිරීක්ෂණවලින් මෙන්ම ගොවීන්ගෙන් ද අනාවරණය විය. අනෙකුත් ප්‍රදේශ සමග සාපේක්ෂව බැලීමේදී මනම්පිටිය ප්‍රදේශයේ (එගොඩපත්තුව) සහ මැදිරිගිරිය බේබියාවැව ප්‍රදේශයේ වී සඳහා ලැබෙන මිල අඩු මට්ටමක පැවතීමට එහි වී වල අඩු ගුණාත්මක තත්ත්වය ද දැඩිව බලපා ඇත. ගොවීන් සමග සිදුකරන ලද අවිධිමත් සාකච්ඡාවලදී අනාවරණය වූ පරිදි අඩු ගුණාත්මක තත්ත්වයේ වී නිෂ්පාදනයට බලපානු ලබන සාධක කිහිපයකි. එනම්,

- i වැලි සහිත පසක්වීම
- ii ජලයෙහි කිවුල් ස්වභාවයක් තිබීම
- iii වගාවන් සඳහා නිසි කලට ජලය නො ලැබීම සහ ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම
- iv තාක්ෂණික දැනුම හිඟකම
- v නව බීජ වර්ග හඳුන්වා නොදීම

ඉහත i සිට iii දක්වා වූ හේතුවල බලපෑමෙන් වී කළු පුල්ලි සහිත දිලීර රෝගයට බඳුන්වීම, වී වල වර්ණය අවපැහැවීම, අසම්පූර්ණ වී ඇට නිෂ්පාදනය වීම සිදුවන බවත්, ඒනිසා එම වී ඉහළ මිලකට අලෙවි කළ නොහැකි බවත් හෙළි විය.

මෙයට අමතරව බේබියාවැව, අසේලපුර, වීරාන, ඇලහැර, බකමූණ ගොවිජන සේවා බලප්‍රදේශයේ අතරගල්ලෑව ප්‍රදේශවලට මාර්ග පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් නො ලැබීමේ ගැටළුව පවතින අතර වී මිලට ගැනීමට පිටතින් පැමිණෙන වෙළෙන්දන් ප්‍රමාණයද ඉතාම සීමිත වේ. තමන්ගේ වී අලෙවිකර ගැනීමට වැඩිදුර ප්‍රමාණයක් ප්‍රවාහනය

කිරීමේදී වැයවන ප්‍රවාහන වියදම් සහ ලැබෙන මුදල අනුව සලකා බැලීමේදී විශාල ලාභයක් නොමැති නිසා නිවසට පැමිණෙන වෙළෙන්දන්ට අඩු මුදලකට හෝ වී අලෙවි කිරීමට ගොවීන් පෙළඹී ඇත. මේ අන්දමට වී සඳහා අඩු මිලක් ලැබුණද, පොළොන්නරු දිස්ත්‍රික්කය තුළ රජය වී මිලට ගත් රු.15.00ට වඩා වැඩි මිලක් ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු වී සඳහා පෞද්ගලික අංශය විසින් ගෙවනු ලැබිය. එය රුපියල් 15.00-16.00 අතර විය. රාජ්‍ය අංශය විසින් කෘ.ප.ති.ස.වරුන් හරහා ප්‍රාදේශීයව වී මිලට ගැනීමට ඉදිරිපත්වීම තුළ ඇතිවූ තරගකාරිත්වය එයට එක් හේතුවක් විය.

### වෙළඳුන් කිහිපදෙනෙක් විසින් වෙළඳපොළ හැසිරවීම

ගොවීහු 25%කට ආසන්න ප්‍රමාණයක් පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී තමන්ගේ වී මිල අඩුවීම කෙරෙහි වෙළෙඳුන් කිහිප දෙනෙකු විසින් සිදුකරනු ලබන වෙළෙඳපොළ මිල හැසිරවීම බලපාන බව සඳහන් කරති.පිටතින් පැමිණෙන වෙළෙඳුන්ගේ පැමිණීම වැළැක්වීම (14.8%) ව්‍යාපාරිකයා විසින් වී මිල තීරණය කිරීම (57.4%) වංචනික කිරුම්, මිනුම් ක්‍රම භාවිතය (1.6) සහතික මිලට වඩා අඩුවෙන් ගෙවීම (3.3%) මෙයට අදාළව ගොවීන් ඉදිරිපත් කර ඇති කරුණු වේ.

ගොවීන් සමග කරනු ලැබූ අවිධිමත් සම්මුඛ සාකච්ඡාවලදී මෙන්ම ප්‍රශ්නාවලි සඳහා ලබාදුන් පිළිතුරුවලින් හෙළි වූ අන්දමට වී මිල තීරණයවීම බොහෝ දුරට සිදුවන්නේ ව්‍යාපාර ප්‍රජාවේ තීරණය මත බව පෙනේ. තම වී අලෙවියේදී ව්‍යාපාරිකයින් විසින් තම මිල තීරණය කරන බව හෙළි කළ ප්‍රතිශතය 97%කි. ප්‍රදේශයේ වී මිල තීරණය කිරීම මහා පරිමාණ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකු විසින් පාලනය කරන බව ප්‍රදේශයේ ගොවීන් සමග මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ ව්‍යාපාරිකයන් සමග කරන ලද අවිධිමත් සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය.

මෙම හේතුවලට අමතරව වී මිල සම්බන්ධව දැඩි ග්‍රහණයක් පවත්වා ගැනීමට ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට හැකියාව ලැබී ඇති තවත් ප්‍රධාන මාර්ගයක් වන්නේ පිටතින්, විශේෂයෙන්ම මරදගහමුල ප්‍රදේශයෙන් පැමිණෙන වී මිලට ගන්නා ව්‍යාපාරිකයන් විවිධ තර්ජනාත්මක ක්‍රියා මාර්ගවලින් ප්‍රදේශයට පැමිණීම වැළැක්වීමයි. ගොවීන් පෙන්වාදෙන අන්දමට මරදගහමුල ප්‍රදේශයෙන් ලොරි පැමිණීමේදී ප්‍රදේශයේ පවතින මිලට වඩා කිසියම් වැඩි මිලකට වී අලෙවි කිරීමේ අවස්ථාව ගොවීන්ට හිමිවුව ද වර්තමානයේ සංවිධානාත්මක පිරිස් විසින් වෙනත් ප්‍රදේශවලින් වී මිලට ගැනීම සඳහා පැමිණෙන ලොරි වැළැක්වීම නිසා එම අවස්ථාව ඔවුන්ට අහිමි වී ඇත.

### වංචනික කිරුම්, මිනුම් භාවිතය

ගොවීන්ගෙන් 13%කට ආසන්න ප්‍රමාණයක් තමන් පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී වංචනික කිරුම්, මිනුම් භාවිතය පිළිබඳ ගැටළුවට මුහුණ දී ඇත. මනම්පිටිය ප්‍රදේශයේදී මෙය 29%ක් තරම් ඉහළ අගයක් ගෙන ඇත (4.6 සංඛ්‍යා සටහන). වංචනික කිරුම්, මිනුම් සිදුවන ආකාරයන් ලෙස ගොවීන් අනාවරණය කර ඇත්තේ තරාදියේ රියම් කොටස් ඉවත් කිරීමෙන් වැඩි වී ප්‍රමාණයක් අඩු බරක් ලෙස අගවා මැනීම, වී මල්ලක බරෙන් කිලෝග්‍රෑම් එකක් අඩු කිරීම, තරාදියේ ( දුනු කොටස්) වෙනස් කිරීම, බිලේඩ් වැනි ද්‍රව්‍ය තැබීමෙන් මිනුම්වල වෙනස්කම් ඇති කිරීම, වැඩි බරක් බර අඩුවෙන්, පවතින බව තහවුරු කරමින් වී මැනීමයි. වංචනික කිරුම්, මිනුම් භාවිතා කිරීම තම ගැටළුවක් ලෙස සඳහන් කර ඇති ගොවීන්ගෙන් 75.7%ක් වී මැනීමේදී ව්‍යාපාරිකයන් විවිධ ක්‍රම භාවිතා කරමින් තරාදියේ දිස්වන බරට වඩා වැඩි වී ප්‍රමාණයක් එම බර යටතේ කිරන බව සඳහන් කර ඇත. මේ ආකාරයට ගොවීන්ගෙන් වංචනිකව ලබා ගන්නා වී ප්‍රමාණය වී මල්ලකට ග්‍රෑම් 500 සිට කිලෝග්රෑම් 5ක් පමණ දක්වා පරාසයක පැතිර පවතී.

### ඇසුරුම් සඳහා වීවලින් බර අඩු කිරීම

සමස්ත නියැදියෙන් 4.4%ක් පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙනු ලබන ගැටළුවක් ලෙසින් ඇසුරුමෙහි බරට (ගෝනි බර සඳහා) වීවලින් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම සඳහන් කර ඇත. මෙසේ අඩු කරන ප්‍රමාණය ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට වෙනස් වේ. ඇසුරුම් බර සඳහා වී වලින් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම

තම ගැටළුව ලෙස සඳහන් කළ පිරිසෙන් 63.6%ක් සඳහන් කර ඇත්තේ එම ප්‍රමාණය කිලෝග්‍රෑම් එකක් දක්වා ප්‍රමාණයක් වන බවයි. මෙම ප්‍රමාණය සමස්ත නියැදියෙන් 2.8%කි. මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශය තුළ මෙම ගැටළුව වාර්තා නොවීම මෙහි විශේෂ ලක්ෂණයකි.

**වීවල අඩු ගුණාත්මක තත්ත්වය සඳහා වීවලින් හෝ මුදලින් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම**

වීවල අඩු ගුණාත්මක තත්ත්වය නිසා ලබාදෙන මුදලින් කිලෝ ග්‍රෑමයට මුදලක් අඩු කිරීම හෝ වීවල බරෙන් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම පෞද්ගලික ව්‍යාපාරිකයන්ට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුවක් වශයෙන් සමස්ත නියැදියෙන් 4.0%ක් සඳහන් කර ඇත. එම ගැටළුවට මුහුණ දෙන්නන් අතුරින් 35% ක් වීවල තෙත ගතිය වැඩිවීම නිසා තමන්ට අඩු මුදලක් ලැබෙන බව සඳහන් කරනු ලබයි. පඩංගු භාවිතා නොකර වී පැගීමේදී වීවලට ගල් සහ වැලි මුසුවීම නිසා එම වීවල බරින් වී මිටියකට කිලෝග්‍රෑම් එකක් දක්වා බරක් අඩු කර ගන්නා බව මෙම ගැටළුවට මුහුණ දෙන්නන්ගෙන් 20% (සමස්ත නියැදියෙන් 1.0%)ක් සඳහන්කර ඇත. මනම්පිටිය ප්‍රදේශය තුළත් මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයේ බේබියාවැව ප්‍රදේශයත් මෙම ගැටළුවට විශේෂයෙන් මුහුණදෙනු ලබන ප්‍රදේශ වේ. මෙයට අමතරව ඉහත සඳහන් කළ ප්‍රදේශ දෙකෙහි වීවල අව පැහැය, වී ඇට සම්පූර්ණ වී නොතිබීම, කළු පුල්ලි රෝගය වැළදීම ආදිය නිසා වීවල ගුණාත්මක තත්ත්වය අඩුවන හෙයින් එම වී සඳහා රජයේ ස්ථාවර මිලට සාපේක්ෂව රු.2.00-3.00 අතර අඩු මිලක් ලැබේ.

4.8 වගු සටහන : පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගුණාත්මක තත්ත්වය සම්බන්ධයෙන් මුහුණදෙන ගැටළු

| වී සඳහා මිල / බර අඩු කිරීම් | ගොවිජන සේවා බලප්‍රදේශය * (%) | | | | | සමස්ත නියැදිය සංඛ්‍යාව =24 |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ සංඛ්‍යාව =2 | මනම්පිටිය සංඛ්‍යාව=9 | මැදිරිගිරිය සංඛ්‍යාව =7 | සේවාගම සංඛ්‍යාව= 4 | ඇලහැර/ බකමූණ සංඛ්‍යාව= 2 | |
| තෙත වී සඳහා අඩු මිලක් ගෙවීම | 50 | 33.3 | 42.9 | 33.3 | 0.0 | 35.0 |
| ගල්/වැලි සඳහා බර අඩු කිරීම (1 Kg දක්වා) | 0.0 | 16.7 | 28.6 | 33.3 | 0.0 | 20.0 |
| ගල්/වැලි සඳහා බර අඩු කිරීම (1 Kg ට වැඩි) | 0.0 | 0.0 | 14.3 | 0.0 | 0.0 | 5.0 |
| ගුණාත්මක තත්ත්වයෙන් අඩුවීම නිසා අඩුමිලක් ගෙවීම | 50.0 | 33.4 | 14.3 | 0.0 | 100.0 | 30.0 |
| හේතුවක් සඳහන් නොකළ | 0.0 | 16.70 | 0.0 | 33.3 | 0.0 | 10.0 |
| **එකතුව** | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

* ගුණාත්මක තත්ත්වය සම්බන්ධ ගැටළුවට මුහුණදුන් සංඛ්‍යාව වූ 24හි ප්‍රතිශතයක් ලෙස සංඛ්‍යා සටහන ඉදිරිපත් කර ඇත.
මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

**මුදල් ගෙවීමේ ප්‍රමාද**

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී මුදල් ලබා ගැනීමේ ප්‍රමාදයන් ඇති බව සමස්ත නියැදියෙන් 1.6%ක් සඳහන් කර ඇත. මෙහිදී මුදල් වාරික වශයෙන් ගෙවීම, කෘමි නාශක, පොහොර, බිත්තර වී ආදී විවිධ ණය සඳහා වූ මුදල් අය කරගෙන ඉතිරි මුදල් ගෙවීම මෙයට සම්බන්ධ කරුණු වශයෙන් සඳහන් කර ඇත.

### 4.3.3 වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා

මෙම පරිච්ඡේදයේ දෙවන සහ තුන්වන කොටස්වලින් සාකච්ඡා කළ වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණ දෙන ගැටළුවලට විසඳුම් ලෙස ඉදිරිපත් කළ යෝජනා මෙහිදී ඉදිරිපත් කෙරේ.

ඇසුරුම් මළු සම්බන්ධව මුහුණදෙන ගැටළුවට පිළියමක් ලෙසින් අවිධිමත් සාකච්ඡාවලදී ගොවීන් පෙන්වා දෙනු ලබන්නේ ගුණාත්මක කල් තබා ගතහැකි ආකාරයේ ඇසුරුම් මළු රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් වෙළඳපොළට නිකුත් කළ යුතු බවයි. එමෙන්ම රාජ්‍ය අංශය මැදිහත් වී සහන මිලට ඇසුරුම් මළු ලබාදීම ද මේ සඳහා පිළියමක් ලෙස ගොවීන් විසින් පෙන්වා දෙනු ලබයි.

වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙන ප්‍රවාහන වියදම් ගැටළුව සඳහා රාජ්‍ය අංශයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන ගම්වලට සමීපව ආරම්භ කිරීමත්, වී මිලට ගැනීමේ රාජ්‍ය අංශයේ ජංගම සේවා ඇති කිරීමත් පිළියම් ලෙස ගොවීහු පෙන්වා දෙති. එයට අමතරව වී මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත රජයේ මධ්‍යස්ථාන පිහිටුවීම, සහතික මිලක් නියම කිරීම, ජංගම වෙළඳසැල් ආරම්භ කිරීම, රාජ්‍ය අංශයේ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම , වංචනික කටයුතුවලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීම, රජයේ සහල් සැකසුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම මෙම යෝජනා අතර ප්‍රමුඛ වේ.

**4.9 සංඛ්‍යා සටහන : වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා**

| යෝජනා * | ගොවිජන සේවා බලප්‍රදේශය (%) | | | | | සමස්ත නියැදියේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | හිඟුරක්ගොඩ | මනම්පිටිය | මැදිරිගිරිය | සේවාගම | ඇලහැර/ බකමූණ | |
| ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත රජයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම | 30.0 | 64.0 | 58.0 | 36.0 | 65.0 | 50.2 |
| රු.13.00-15.00 අතර සහතික මිලකට වී මිලදී ගැනීම | 11.0 | 3.0 | 2.0 | 4.0 | 0.0 | 4.0 |
| රු.15.00-18.00 අතර සහතික මිලකට වී මිලදී ගැනීම | 76.0 | 73.0 | 92.0 | 60.0 | 63.0 | 72.8 |
| රු. 18.00 ට වැඩි සහතික මිලකට වී මිලදී ගැනීම | 14.0 | 10.0 | 9.0 | 24.0 | 13.0 | 14.0 |
| නිෂ්පාදන යෙදවුම් මිල අඩු කිරීම | 10.0 | 9.0 | 7.0 | 14.0 | 36.0 | 15.2 |
| අලෙවි මධ්‍යස්ථාන දක්වා ප්‍රවාහන පහසුකම් සැපයීම හෝ ජංගම අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම | 13.0 | 7.0 | 14.0 | 16.0 | 7.0 | 11.4 |
| රජයේ වී මිලදී ගන්නා ස්ථානයේදීම මුදල් ගෙවීම | 22.0 | 11.0 | 16.0 | 16.0 | 10.0 | 15.0 |
| ගුණාත්මක බව දැඩිව පරීක්ෂා නොකිරීම | 14.0 | 6.0 | 5.0 | 9.0 | 11.0 | 9.0 |
| රජය, ගොවින්ගෙන් සෘජුවම වී මිලට ගැනීම | 0.0 | 0.0 | 1.0 | 1.0 | 0.0 | 0.4 |
| රාජ්‍ය නිලධාරීන්ගේ අක්‍රමිකතා වැලැක්වීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 47.0 | 30.0 | 30.0 | 37.0 | 3.0 | 29.4 |
| රජයේ සහතික මිලට වී නොගන්නා පිරිස්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම | 8.0 | 3.0 | 2.0 | 4.0 | 0.0 | 3.4 |
| වී කි.ග්‍රෑ. 65 මිටියකින් අඩු කරන වී ප්‍රමාණය අඩු කිරීම | 2.0 | 0.0 | 1.0 | 3.0 | 0.0 | 1.2 |
| නැවත පාවිච්චි කළ හැකි ඇසුරුම් මළු වෙළඳපළට නිකුත් කිරීම | 13.0 | 3.0 | 2.0 | 12.0 | 0.0 | 6.0 |
| වී ගබඩා කර තබා ගැනීමට රජය විසින් ගොවීන්ට මූල්‍ය පහසුකම් සැපයීම | 3.0 | 3.0 | 3.0 | 5.0 | 2.0 | 3.2 |
| රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක කරන සහල් සැකසීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම | 5.0 | 5.0 | 9.0 | 5.0 | 6.0 | 6.0 |

* මෙම යෝජනා ඉදිරිපත් කරන ලද්දේ 2003 වර්ෂයේ අග කාර්තුව සහ 2004 වර්ෂයේ මුල් කාර්තුව අතර කාලය තුළදීය.

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

ඉහත සංඛ්‍යා සටහනෙන් ඉදිරිපත් කෙරෙන යෝජනා අතර ගොවීන්ගෙන් 91%ට ආසන්නවූ පිරිසක් යෝජනා කර ඇත්තේ තම වී සඳහා රජය මගින් සහතික මිලක් නියම කළයුතු බවයි. මෙම සහතික මිල කාණ්ඩ තුනක් යටතේ

ගොවීන් ඉදිරිපත් කර ඇත. වී කිලෝ ග්‍රෑමයක් රු.13.00-15.00 අතර මිලකට රජය විසින් මිලට ගැනීම කළයුතු බව ගොවීන්ගෙන් 4.0%ක් අදහස් දක්වා තිබූ අතර එවැනි මිලකට වී ගැනීමේදී යෙදවුම් සඳහා විශේෂයෙන්ම පොහොර සහ කෘෂි රසායනික මිල අඩු කළයුතු බවට අදහස් ඉදිරිපත් විය. 2004 මහ කන්නයේ අස්වනු සඳහා පොහොර සහ වෙනත් යෙදවුම් සඳහා වැය කළ මිල සැලකිල්ලට ගනිමින් රු.15.00-18.00 අතර සහතික මිලක් වී කිලෝ ග්‍රෑමයකට තිබිය යුතු බව ගොවීන්ගෙන් 72.8%ක් සඳහන් කරනු ලැබිය. ගොවීන්ගෙන් 14%ක් ප්‍රකාශ කරනු ලැබුවේ රු.18.00 ට වැඩි සහතික මිලක් වී කිලෝ ග්‍රෑමයක් සඳහා ලැබිය යුතු බවයි. එයට හේතු වශයෙන් ඔවුන් පෙන්වා දෙනු ලබන්නේ කෘෂි යෙදවුම් සඳහා වැයවන මිල මෙන්ම ප්‍රවාහන සහ ඇසුරුම් මිල දිනෙන් දින ඉහළ යාමයි. වී කිලෝ ග්‍රෑමයකට ලැබෙන මිල මෙයට වඩා අඩුවන්නේ නම් විශේෂයෙන්ම පොහොර මිල අඩුවිය යුතු බවත් එසේ නොමැතිනම් පහසුවෙන් භාවිතා කළ හැකි මිලෙන් අඩු කාබනික පොහොර රටපුරා ව්‍යාප්ත කළ යුතු බවත් ගොවීන්ගේ අදහසයි.

රජය විසින් වී මිලට ගැනීමේ කාර්යයට සක්‍රීය දායකත්වයක් ලබාදිය යුතු බව ගොවීන්ගේ යෝජනා අතර තවත් ප්‍රධාන යෝජනාවකි. ප්‍රධාන නගරයෙන් එපිට ප්‍රදේශවල මෙම යෝජනාව කරන ප්‍රමාණය ඉහළ ප්‍රතිශතයකි. මනම්පිටිය, මැදිරිගිරිය, ඇලහැර-බකමූණ ප්‍රදේශවල මෙම පිරිස 57%ට ආසන්නවේ. හිඟුරක්ගොඩ සහ සේවාගම ප්‍රදේශවල මෙම අදහස ඉදිරිපත් කරන ගොවීන් ප්‍රතිශතය පිළිවෙලින් 27.0% සහ 30% බැගින් වේ.

මෙයට අමතරව ගොවීන්ගෙන් 10.4% සඳහන් කරනුයේ වී මිලට ගැනීම සඳහා රජය විසින් ජංගම වෙළඳසැල් ආරම්භ කළයුතු බවයි. මෙම යෝජනා අනුව පැහැදිලි වන්නේ අඩු මාර්ග සහ ප්‍රවාහන පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල වී මිලට ගැනීම සඳහා එම ප්‍රදේශ ආශ්‍රිතව වී මිලට ගැනීම් මධ්‍යස්ථාන හෝ ජංගම වෙළඳසැල් අස්වනු නෙළන සමය ආරම්භ වනවිටම රජය විසින් ආරම්භ කළයුතු බවයි. 2004 මහ කන්නයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ මාර්ගයෙන් ඉතාම පහළ මට්ටමේ සිට වී මිලට ගැනීම ආරම්භ කර තිබුණ ද එය සාර්ථක කර ගැනීමෙහිලා තිබූ එක් අඩුපාඩුවක් ලෙස ගොවීන් සඳහන් කරනුයේ ග්‍රාමීයව වී ගබඩා කිරීමට තරම් පහසුකම් නොවීම හා අවශ්‍ය තරම් මුදල් ප්‍රතිපාදන ලබා නොදීමයි. එම නිසා ඉතා සීමිත පිරිසකගේ, අස්වැන්නෙන් සුළු කොටසක් පමණක් අලෙවි කර ගැනීමට හැකි වූ බවත් පොළොන්නරු ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස සැලකිය යුතු තරම් භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පවතින නිසා ග්‍රාම නිලධාරී කොට්ඨාස 2-3 සඳහා එක් මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීම ද එතරම් සාර්ථක පිළියමක් නොවන බවත් ගොවීන්ගේ අදහසයි. ගොවීන් යෝජනා කරනු ලබන්නේ කෘ.ප.නි.ස සහ ගොවි සංවිධානවල සහභාගිත්වයෙන් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයකට වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් බැගින් අස්වනු නෙළීම ආරම්භවීමත් සමගම ආරම්භ කර දිනපතා රැස්වන වී තොග රජයේ දැනට වසාදමා ඇති ප්‍රධාන ගබඩා සංකීර්ණවල හෝ වෙනත් ගොඩනැගිලිවල ගබඩා කර තැබීමත්, ඒ අවස්ථාවේ සිටම ඉන් කිසියම් ප්‍රමාණයක් රජයේ සහල් සැකසීමේ මධ්‍යස්ථාන හරහා සහල් බවට පත්කොට බෙදා හැරීම සිදු කිරීමටත්. එමගින් ගබඩා සංකීර්ණවල ඇතිවන අනවශ්‍ය තදබදය වළක්වා ගැනීමටත් තම වී සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමටත් මාර්ගය සැලසෙන බව ගොවීන්ගේ අදහසයි.

මේ ආකාරයේ සක්‍රීය වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන ජාලයක් හරහා දිස්ත්‍රික්කය පුරා වී මිලට ගැනීමේ කාර්යය, දැනට අත්හැර දමා ඇති හෝ අප්‍රයෝජනයට ලක්වී ඇති රාජ්‍ය සම්පත් යොදවා ගනිමින් සිදුකළ හැක.

පෞද්ගලික අංශයට මිල අඩුවෙන් හෝ වී අලෙවි කිරීමට ගොවීන් පෙළඹීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ අස්වැන්න නෙළීමේදී හා වෙනත් කටයුතු සඳහා වූ ණය ගෙවීමට අවශ්‍යවීමත් එදිනෙදා අවශ්‍යතා සඳහා මුදල් ඉක්මණින් අවශ්‍යවීමත් ය. රාජ්‍ය අංශයට වී අලෙවියේදී මුදල් ලබා ගැනීම ප්‍රමාදවීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන අතර එයට විසඳුමක් ලෙස ගොවීන් ඉදිරිපත් කරන්නේ වී මිලදී ගන්නා ස්ථානයේදීම (ගොවි සංවිධාන සාමාජිකයන් සහ කෘ.ප.නි.ස ඇතුළු කමිටුවකින් සමන්විත) වී සඳහා මුදල් ගෙවීමේ ක්‍රමයක් ආරම්භ කළයුතු බවයි. මේ සඳහා ඉදිරිපත් වන තවත් අදහසක් වන්නේ වී මිල ඉහළ යන අවස්ථාවක වී විකිණීමට, තම වී ඇපයට තබාගෙන රජය මඟින් මුදල් ලබාදිය යුතු බවයි. මෙම අදහස ඉදිරිපත් කළ පිරිස ගොවීන්ගෙන් 3.2% කි. ගොවීන් මෙහිදී යෝජනා කරනු ලබන්නේ අලෙවි සවිය වැඩසටහන යටතේ ලබාදුන් ණය මුදල වැනි ණය මුදලක් නොව තම වී සඳහා මුදලකි.

රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් වී මිලට ගැනීම්දී නිලධාරීන් සහ සේවකයන් විසින් සිදුකරන අක්‍රමිකතා සහ අල්ලස් ගැනීම නතර කළයුතු බව ගොවීන්ගෙන් 13%කගේ අදහසයි. එමෙන්ම නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව නිසා ගොවීන්ට සිදුවන පාඩු සහ අපහසුතා මග හරවා ගැනීමට නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වෙනුවෙන් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතු බව ගොවීන්ගෙන් 15%ක් පෙන්වා දී ඇත.

## 4.4 වී මිලට ගැනිමේදී සහ අලෙවියේදී අතරමැදියන් සහ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු සහ ඔවුන් විසින් යෝජිත විසඳුම්

### 4.4.1 වී මිලට ගැනීමේදී අතරමැදියන් සහ වී මෝල් හිමියන් මුහුණ දෙන ගැටළු

වී මිලට ගැනීමේදී වී මෝල් හිමියන් මෙන්ම වී එකතු කිරීමේ නිරත අතරමැදියන් ද පොදුවේ මුහුණ දෙනු ලබන ගැටළු කිහිපයකි. වීවල ගුණාත්මක තත්ත්වය පහළ මට්ටමක තිබීම, මුදල් හිඟකම, ගබඩා පහසුකම් හිඟකම, වී මිලෙහි අවිනිශ්චිත බව ඒ අතර ප්‍රධාන සාධක වේ. 4.10 සංඛ්‍යා සටහනින් වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් හා වී මෝල් හිමියන් වී මිලට ගැනීම්දී මුහුණදෙන ගැටළු ඉදිරිපත් කෙරේ.

4.10 සංඛ්‍යා සටහන : වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්/වී මෝල්හිමියන් වී මිලට ගැනීම්දී මුහුණදෙන ගැටළු

| ගැටළුව | අතරමැදි ව්‍යාපාරිකයන් | වී මෝල් හිමියන් |
|---|---|---|
| අඩු ගුණාත්මක තත්ත්වයේ වී මිලට ගැනීමට සිදුවීම | 92.1 | 92.1 |
| මුදල් හිඟකම | 55.3 | 42.1 |
| ගබඩා පහසුකම් හිඟකම | 15.8 | 13.2 |
| තරඟකාරීත්වය | 5.3 | 0.0 |
| වී සඳහා ස්ථාවර මිලක් නොවීම | 5.3 | 5.3 |
| ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට අපහසුවීම | 5.3 | 7.9 |
| ගොවීන්ගේ වංචනික ක්‍රියා | 2.6 | 0.0 |
| බැංකු ණය නියි කලට නොලැබීම | 0.0 | 2.6 |
| සහන පොලියට බැංකු ණය ලබා නොදීම | 0.0 | 2.6 |
| වී සඳහා මුදල් එකවර ගෙවීමට සිදුවීම | 0.0 | 5.3 |
| වී මිල අධිකවීම | 0.0 | 5.3 |
| මහා පරිමාණයේ වෙළෙඳුන් වී මිල වැඩි කිරීම | 0.0 | 2.6 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

### අඩු ගුණාත්මක තත්ත්වයේ වී මිලට ගැනීමට සිදුවීම

මෙයට පෙර සිදුකරන ලද අධ්‍යයන්හිදී ද(සෝමරත්න, 1987) පෙන්වාදී ඇති පරිදි වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයින් මෙන්ම වී මෝල් හිමියන් ද මුහුණදෙනු ලබන ප්‍රධානම ගැටළුව වන්නේ ගොවියන් විසින් නිෂ්පාදනය කරනු ලබන වී අඩු ගුණාත්මක තත්ත්වයේ ඒවාවීමයි (4.10 සංඛ්‍යා සටහන). පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල තවමත් අස්වනු සකස් කරනුයේ, සාම්ප්‍රදායික ක්‍රමයට කමත තුළ වන අතර මනම්පිටිය, මැදිරිගිරිය, ඇලහැර-බකමූණ වැනි ප්‍රදේශවල 100% ආසන්න ප්‍රමාණයක්ම ගොයම් පෑගීම කුඹුරේ අස්වනු කපාගත් ලියැද්දක පඩංගු භාවිතයෙන් තොරව සිදුකරනු ලබයි. මෙහිදී ගල්,වැලි වැනි අපද්‍රව්‍ය මුසුවීම සිදුවන අතර එවැනි වී සඳහා ව්‍යාපාරිකයින් විසින් ගුණාත්මක තත්ත්වයේ පවතින වී වලට සාපේක්ෂව කිලෝග්රෑමයක් සඳහා රු.1.00-2.00 අතර මුදලක් අඩුවෙන් ගෙවනු ලබයි. එයට හේතු වන්නේ මෙම වී පිරිසිදු කිරීමට (ගල්,වැලි,බොල් ඉවත් කිරීමට හා තෙත සහිත වී වියළීමට) අමතර වියදමක් දැරීමට සිදුවීමත්, අඩු ගුණාත්මක තත්ත්වයේ වී වලින් ඉහළ ගුණාත්මක

තත්ත්වයේ සහල් නිෂ්පාදනය කිරීමට නොහැකි නිසා එම සහල්වලට අඩු මිලක් ලැබීමත්ය. එමෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන් විසින් මෙවැනි වී මිලට ගෙන වී මෝල් හිමියන්ට විකිණීමේදී ඒවා ඉහළ මිලකට විකිණීමට නොහැකිවීමත්, නියමිත ප්‍රමාණයට නො වියලුණු වී කල්තබා ගැනීමේදී වියළීම නිසා බර අඩුවීම නිසා පාඩු සිදුවීමත්, පුස්හට ගැනීමත් ගැටළු ලෙස තවදුරටත් ඉදිරිපත් වේ.

මෙම ගැටළුව සම්බන්ධව ව්‍යාපාරිකයන් සඳහන් කරනු ලබන්නේ වී ගොවීන් මේ පිළිබඳව දැනුවත් කළ ද ඔවුන් ඉහළ ගුණාත්මක තත්ත්වයේ වී නිෂ්පාදනයට උනන්දු නොවන බවත්, පඩංගු සපයා ගැනීමේ දුෂ්කරතාවන්ට, ඒවායේ මිල අධිකවීම වැනි ගැටළුන්ට ගොවීන් මුහුණදීම නිසා අඩු ගුණාත්මක තත්ත්වයේ වී නිෂ්පාදනය කිරීමට ඔවුන් තවදුරටත් ක්‍රියා කරන බවත්ය. මෙම තත්ත්වය මත අඩු මිලට හෝ ඔවුන්ගේ වී මිලට ගැනීම හැර විකල්පයක් නොමැති බව මෙම ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාරිකයන්ගේ පෙන්වා දෙනු ලබයි.

**මුදල් හිඟකම**

වී වෙළඳාමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද තමන් මුහුණපාන අනෙක් ප්‍රධාන ගැටළුව ලෙසින් සඳහන් කරනු ලබන්නේ ව්‍යාපාරයට යෙදවීමට අවශ්‍ය තරම් මුදල් නො තිබීමයි. තමන්ගේ මුදල්, නෑ හිතවතුන්ගේ මුදල් මෙන්ම ආයතනික හා ආයතනික නොවන මට්ටමින් ණයට ගනු ලැබූ මුදල් මේ සඳහා යොදවා ඇති බව ව්‍යාපාරිකයන් සමග කරන ලද සාකච්ඡාවලදී හෙළිවිය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද ණය ලබා ගෙන ව්‍යාපාරය සඳහා යෙදවීමට බියක් දක්වනුයේ මෙම ව්‍යාපාරය අවදානම් සහිත ව්‍යාපාරයක් වන බැවිනි. වී මෝල් හිමියන් පවසන්නේ බැංකු ණය ලබාගෙන ව්‍යාපාරයට පිවිසි හෝ ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමට උත්සාහ දැරූ බොහෝ වී මෝල් හිමියන් පවතින අවදානම් සහගත තත්ත්වය යටතේ අසාර්ථකත්වයට සහ අසීරුතාවන්ට පත්වීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර ගොඩනැගිලි, ඉඩම් පවා බැංකු වෙත පවරා ගෙන ඇති බවයි. ව්‍යාපාරයට මුදල් යොදවා වී මිලට ගෙන තිබෙන අවස්ථාවන්හිදී රජය විසින් සහල් ආනයනය කිරීම නිසා සහල් මිල පහත වැටීම එයට බලපා ඇති එක් හේතුවකි. ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වී තොග ඉහළ මිලක් යටතේ ප්‍රධාන වී මෝල්හිමියන් විසින් මිලට ගැනීම නිසා බොහෝවිට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට අඩු ගුණාත්මක තත්ත්වයේ වී තොග ලැබීමත්, එම වී වලින් නිෂ්පාදිත සහල් සඳහා වැඩි මිලක් දැරීමට සිදුවීම මෙන්ම ගුණාත්මක තත්ත්වයෙන් අඩු සහල් සඳහා සාපේක්ෂව අඩු මිලක් ලැබීම තුළ එවැනි වී මෝල්හිමියන් ලබන ලාභය අවමවීමත් එවැනි වී මෝල් අසාර්ථකවීමට බලපානු ලබන අනෙක් සාධක වේ.

ග්‍රාමීය හා කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට ආයතනික මට්ටමේ ණය ලබා ගැනීමේදී ණය ප්‍රමාදවී ලැබීම, ණය ලබා නොදීම, අවශ්‍ය මුදල ලබා ගැනීමට නොහැකිවීම ආදී ගැටළු හේතුවෙන් ආයතනික මාර්ගයෙන් මූල්‍ය පහසුකම් සපයා ගැනීමට අපහසු බවද අනාවරණය වේ. මුදල් හිඟකම සහ වී සඳහා එකවර මුදල් ගෙවීමට සිදුවීම මිලට ගනු ලබන වී ප්‍රමාණය සීමා කිරීමට බලපාන බව ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් සඳහන් කරනු ලබයි.

**ගබඩා පහසුකම් හිඟය**

වී වෙළඳාමේ නිරත ව්‍යාපාරිකයන්ට/වී මෝල් හිමියන්ට ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන තවත් ගැටළුවකි. ග්‍රාමීය මට්ටමේ අතරමැදි ව්‍යාපාරිකයන් මේ හේතුව නිසා තමන් එදිනෙදා මිලට ගනු ලබන වී තොග දිගු කාලයක් ගබඩා කර තබා නොගෙන ඉක්මණින් අලෙවි කිරීම සිදු කරනු ලබයි. මේ හේතුව නිසා වැඩි ලාභයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව සුළු හා මධ්‍ය පරිමාණ අතරමැදි ව්‍යාපාරිකයන්ගේ මතයයි. අස්වනු නෙළා අවසන්වූ පසු වී මිල ඉහළ යන නමුත් ඒ වනවිට ඔවුන් තමන් රැස් කළ වී තොග එදිනෙදා අලෙවි කිරීම නිසා ඔවුන් සතුව පවතින්නේ තම ගබඩාවල තබා ගත හැකි මට්ටමේ අඩු වී ප්‍රමාණයකි. කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් ද මෙම ගැටළුවට මුහුණදෙනු ලබන අතර සහල් මිල ඉහළ යන අවස්ථාව වනවිට ඔවුන් සතුව වී තොග නොමැති බවත්, එම අවස්ථාවේදී ඔවුන්ට වී සපයා ගැනීම අපහසු බවත්, වී ලබා ගැනීමට ඉහළ මිලක් ගෙවීමට සිදුවන බවත් ඔවුන් විසින් පෙන්වා දේ. ඔවුන් පවසන අන්දමට සහල් මිල ඉහළ යන අවස්ථාවේදී වී තොග සියල්ලම පාහේ පවතින්නේ ප්‍රධාන වී මෝල් හිමියන් කිහිපදෙනෙකුගේ ගබඩා සංකීර්ණයන්හිය. ඉහත කී හේතු

මත ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද තමන්ට ප්‍රමාණවත් තරම් ගබඩා පහසුකම් නොතිබීම ප්‍රධාන ගැටළුවක් ලෙසින් හඳුනාගෙන ඇත.

ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ ගැටළුව නිසා වී මිලට ගන්නා අතරමැදියන්/වී මෝල්හිමියන් තම ව්‍යාපාරික ස්ථානයේදී පමණක් වී මිලට ගැනීම සිදු කරනු ලබයි. ඔවුන්ට මිලට ගැනීමට අවස්ථාව ලැබෙනුයේ සීමිත වී ප්‍රමාණයකි. තමන් සතුව ප්‍රවාහන පහසුකම් නොමැතිව වී මිලට ගැනීම් සිදුකරන විට කුලියට ලබාගත් ප්‍රවාහන මාධ්‍ය භාවිතා කරනු ලබයි. ඒ සඳහා ඔවුන්ට අධික ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවන බවත්, ගොවීන්ට අඩු මුදලක් වී සඳහා ලැබීමට මෙම හේතුව ද දායක වන බවත් අතරමැදි ව්‍යාපාරිකයින්ගේ මතයයි. ප්‍රවාහන පහුසකම් නොමැති වී මෝල්හිමියන්ගෙන් 5.6%ක් තම ව්‍යාපාරික ස්ථානයට ගොවීන් හෝ අතරමැදි ව්‍යාපාරිකයන් විසින් රැගෙන එන වී තොග පමණක් මිලට ගනු ලබයි. තම ව්‍යාපාරය දියුණු කිරීමට බලපාන බාධාවක් ලෙසින් ඔවුන් එය සලකනු ලබයි.

### 4.4.2 වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ විසඳුම්

**ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම**

ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම සම්බන්ධ විසඳුම් ලෙස අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන්ද යෝජනා 03ක් ඉදිරිපත් කරනු ලබයි. එනම්,

i උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය සඳහා ගොවීන්ට උපදෙස් ලබාදීම.

ii සාපේක්ෂව අඩු මිලකට මිලදී ගැනීම.

iii අඩු ප්‍රමිතියේ වී ප්‍රතික්ෂේප කිරීම වේ.

උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනයට ගොවීන්ට උපදෙස් ලබාදීම කළ යුතු බවඅධ්‍යයනයට ලක්වූ අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 25% ද, වී මෝල්හිමියන් ගෙන් 15.8% ද සඳහන් කරනු ලබයි. වී මිලට ගැනීමේදී ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය කරන ලෙස ගොවීන්ට ඔවුන් විසින් දන්වනු ලැබුවත් ඒ පිළිබඳව ගොවීන් සැලකිල්ලක් නොදක්වන බවත් රාජ්‍ය අංශය මේ සඳහා මැදිහත්වී ගොවීන්ට උපදෙස් ලබාදීම තුළින් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය කිරීමට පෙළඹවිය හැකි බවත් ඔවුන්ගේ යෝජනාව වේ. වී පැගීම සඳහා පඩංගු ලබාදීම මේ සඳහා ඉදිරිපත් වන තවත් යෝජනාවකි.

ප්‍රමිතියෙන් අඩු වී සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු වීවලට සාපේක්ෂව අඩු මිලක් ලබාදීමේ යෝජනාව අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 47.4% ද, වී මෝල් හිමියන්ගෙන් 55.3% ද ඉදිරිපත්කර ඇත. ගල්,වැලි මුසුවූ වී සඳහා කිලෝ ග්‍රෑමයකට ශත 50 සිට රු.2.00 දක්වා මුදලක් අඩුවෙන් ගෙවන බව අධ්‍යයනයෙන් හෙළි විය. එමෙන්ම ඇතැම් ව්‍යාපාරිකයන් විසින් ගල්,වැලි සහිත වී මිලට ගැනීමේදී වී මල්ලකින් (50 කි.ග්‍රෑ) වී කිලෝග්‍රෑම් 1-2 අතර ප්‍රමාණයක් හෝ කිලෝ ග්‍රෑම් 64ක වී මල්ලකට කිලෝග්‍රෑම් 3 අඩු කර මුදල් ගෙවන බවත්, තෙත වී මිලට ගැනීමේදී රු.1.00-2.00 අතර මුදලක් කිලෝග්‍රෑමයකට අඩු කරන බවත් අධ්‍යයනයේදී හෙළි විය. වීවල පැහැය අවර්ණවීම නිසා ද වී අඩු මිලට මිලදී ගනු ලබයි. එහිදී නියමිත වර්ණයෙන් යුතු වීවලට වඩා වී කිලෝග්‍රෑමයක් සඳහා ශත 20 සිට ශත 75 පමණ මුදලක් අඩුවෙන් ලබාදේ.

නියමිත ප්‍රමිතියෙන් තොර වී ප්‍රතික්ෂේප කිරීම මෙම ගැටළුව සම්බන්ධව ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් ඉදිරිපත් කරනු ලබන අනෙක් විසඳුම වේ. අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 18.4% ද, වී මෝල් හිමියන්ගෙන් 10.5% ද මෙම අදහස ඉදිරිපත් කරනු ලබයි.

**මුදල් හිඟය**

වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද මුහුණදෙන ප්‍රධාන ගැටළුවක් වන ප්‍රමාණවත් පරිදි මුදල් නොවීමේ ගැටළුවට පිළියම් ලෙසින් ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව වන්නේ, ආයතනික මාර්ගයෙන් ණය ලබාදීමට කටයුතු කළයුතු බවයි.

අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 42.1% ද, වී මෝල්හිමියන්ගෙන් 18.4% ද තම මූලධනමය අවශ්‍යතා සඳහා හිතවතුන්ගෙන්, ඥාතීන්ගෙන් මුදල් ණයට ලබා ගැනීම සිදුකරන බව සඳහන් කර ඇත. ආයතනික මාර්ගයෙන් ණය ලබා ගැනීමේදී අවශ්‍ය වේලාවට ණය ලබාගත නොහැකිවීම, ණය ලබාදීමට බැංකු අකමැතිවීම, බැංකුවට ඇපයට තැබීමට අවශ්‍ය වන වත්කම් තමන් සතු නොවීම යන ගැටළු හේතුවෙන් ආයතනික මාර්ගවලට වඩා පෞද්ගලික මාර්ගවලින් ණය ලබා ගැනීමට ඔවුහු පෙළඹී සිටිති. මේ හේතුවෙන් ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ද වී මෝල්හිමියන්ගෙන් 25% ද ආයතනික මාර්ගයෙන් අවම ඇපයකට තම ව්‍යාපාර සඳහා ණය ලබාදීමට කටයුතු කළයුතු බවට ඔවුන් යෝජනා කරනු ලබයි.

ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ද, වී මෝල්හිමියන්ගෙන් 10.4% ද මුදල් හිඟය නිසා සීමිත වී ප්‍රමාණයක් මිලට ගැනීමට සිදුවීම තම ව්‍යාපාරයේදී මතුවන බාධාවක් ලෙසින් සඳහන් කරනු ලබයි. ආයතනික මාර්ගයෙන් ණය ලබාදීම තුළින් මෙම බාධාව මඟ හරවා ගැනීමේ හැකියාව ලැබෙන බව ඔවුන්ගේ අදහසයි.

**ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීම**

ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීමේ ගැටළුවට පිළියමක් වශයෙන් ක්‍රියාත්මක කළ හැකි යෝජනා 03ක් ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් විසින් ඉදිරිපත් කර ඇත. එනම්,

i ගබඩා ධාරිතාව වැඩි කිරීම.

ii ගබඩා ධාරිතාවට සරිලන ප්‍රමාණය පමණක් මිලට ගැනීම.

iii වසර පුරා වී මිලට ගැනීම වශයෙනි.

ව්‍යාපාරිකයන්ගේ 5.3% හා වී මෝල්හිමියන්ගෙන් 2.6% මෙම ගැටළුවට පිළියමක් වශයෙන් යෝජනා කරනු ලබන්නේ ගබඩා ධාරිතාවන් වැඩි කිරීමයි. රාජ්‍ය අංශයට අයත් ගොඩනැගිලි කුලියට ලබාදීම හෝ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි කුලියට ලබා ගැනීම සඳහා රාජ්‍ය අංශය ආධාර කිරීම තුළින් මෙම ගැටළුව නිරාකරණය කරගත හැකි බව ඔවුන්ගේ අදහසයි.

ගබඩා ධාරිතාවන් අඩුවීම නිසා පවතින ධාරිතාවට සරිලන වී ප්‍රමාණයක් පමණක් මිලට ගැනීම සිදුකරන බව වී මෝල්හිමියන්ගෙන් 13.2% ද, ව්‍යාපාරිකයන්ගේ 7.9% ද සඳහන් කරනු ලබයි. මෙයට අමතරව වී මෝල්හිමියන්ගෙන් 2.6% ක් මෙම ගැටළුවට පිළියමක් ලෙසින් වසර පුරාම වී මිලට ගැනීමට සිදුකරනු ලබයි.

**තරඟකාරීත්වය**

තරඟකාරීත්වයට මුහුණදීම සඳහා ව්‍යාපාරිකයන්ගෙන් 5.6% ක් ගොවීන් සමඟ සම්බන්ධතා වර්ධනය කර ගැනීම, ඔවුන්ගේ විශ්වාසය ගොඩනැගීම යන උපක්‍රම භාවිතා කරනු ලබයි. මෙයට අමතරව වී මිල ඉහළ යාමේදී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීමට අස්වනු නෙළන සමයේදී වැඩිපුර වී මිලට ගැනීම වී මෝල්හිමියන්ගෙන් 2.6%ක් විසින් සිදු කරනු ලබයි.

### 4.4.3 වී /සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු

වී මිලට ගන්නා අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් එම වී/සහල් අලෙවියේදී මුහුණ දෙනු ලබන ප්‍රධානම ගැටළුව වන්නේ වෙළඳපොළේ වී සහ සහල් මිල පිළිබඳව පවතින අවිනිශ්චිතතාවයි. මෙම මිල අවිනිශ්චිතතාව මෙන්ම වී ප්‍රමිතියෙන් තොරවීම, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම, රජය විසින් සහල් ආනයනය කිරීමට අවසර දේ යැයි පවතින සැකය හේතුවෙන් වී එකතු කරන්නන් දිගු කාලයක් තබා නොගෙන තම වී තොග අලෙවි කිරීමට කටයුතු කරනු ලබයි. වෙළඳපළ තත්ත්වය වෙනස් කිරීමට නොහැකි බව ව්‍යාපාරිකයන්ගෙන් 26.3%ක් සඳහන් කරන අතර වෙළඳපොළේ මිල අස්ථාවරත්වය නිසා මිලදී ගත් මිලටම වී අලෙවි කිරීම හෝ වී මෝල් හිමියන් (21.0%) විසින් වෙළඳපොළේ පවතින මිලට වඩා අඩු මිලකට සහල් අලෙවි කිරීම සිදු කරනු ලබයි.

4.11 සංඛ්‍යා සටහන : වී/සහල් අලෙවියේදී වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්, වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු

| ගැටළු | ගැටළුවලට මුහුණදෙන ප්‍රතිශතය | |
|---|---|---|
| | අතරමැදි ව්‍යාපාරිකයන් % | වී මෝල්හිමියන් % |
| මිල අවිනිශ්චිතතාව | 55.3 | 31.6 |
| වී/සහල් ප්‍රමිතියෙන් තොරවීම | 47.4 | 26.3 |
| තමන් සතුව ප්‍රවාහන පහසුකම් නොවීම | 7.9 | 13.2 |
| ණයට විකිණීමට සිදුවීම/මුදල් එකවර නොලැබීම | 2.6 | 23.7 |
| වී/ සහල් වෙළඳපළ කිහිපදෙනෙකු විසින් හැසිරවීම | 18.5 | 23.7 |
| වී මිලදී ගන්නන් විසින් රවටනු ලැබීම | 2.6 | 0.0 |
| රජය විසින් සහල් ආනයනය කිරීම | 2.6 | 21.0 |
| විශාල සහල් තොග සැපයීමට නොහැකිවීම | 0.0 | 2.6 |
| ගබඩාකරණ ගැටළු | 2.6 | 2.6 |
| සහල් පරිභෝජනය පහළ යාම | 0.0 | 5.3 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

රජය විසින් සහල් ආනයනයට අවසර දේ යැයි පවතින සැකය නිසා කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන්ද විශාල වී තොග රැස්කර තබා ගැනීම අවදානමක් ලෙස සලකනු ලබයි. මෙම කාණ්ඩ දෙකම මුහුණදෙනු ලබන තවත් ප්‍රධාන ගැටළුවක් වන්නේ ගොවීන් විසින් ලබාදෙන වී නියමිත ප්‍රමිතියෙන් තොරවීමයි. ගල්,වැලි ඉවත් කිරීමට අමතර වියදමක් දැරීමට සිදුවන බවත්, එසේ නොමැතිව ගල්,වැලි මුසුවූ සහල් වෙළඳපොළට නිකුත් කිරීමේදී නියමිත ප්‍රමිතියෙන් යුතු වී වලට වඩා අඩු මුදලක් ඒ සඳහා ලැබීමත් මේ සම්බන්ධ ගැටළු වේ. එසේ වුවත් ගොවීන් විසින් තෙත ප්‍රමාණය වැඩි වී අලෙවි කිරීමේදී පෞද්ගලික හිතවත්කම් සහ සබඳතා නිසා බොහෝවිට ඒවා ප්‍රතික්ෂේප කිරීමට නොහැකිවීමත් එවැනි වී මිලට ගෙන කල් තබා ගැනීමේදී පුස් සෑදීම නිසා අතරමැදි ව්‍යාපාරිකයන් විසින් වෙනත් ව්‍යාපාරිකයෙකුට හෝ වී මෝල්වලට අලෙවි කිරීමේදී ඇතැම්විට මිලදීගත් මිලට පවා අලෙවි කිරීමට නොහැකි වීමත් ගැටළු වේ. මෙවැනි වී මිලට ගන්නා වී මෝල්හිමියන්ට එය අතරමැදි ව්‍යාපාරිකයන්ට තරම් බරපතල ගැටළුවක් බවට පත්ව නොමැති බව 4.11 සංඛ්‍යා සටහන අනුව පෙන්නුම් කෙරේ. එසේ වන්නේ එවැනි වී තොග ප්‍රමිතියෙන් යුතු වීවලට වඩා අඩු මිලකට ගෙන ඉක්මණින්ම සහල් බවට පත්කර අලෙවි කිරීමේ හැකියාව පවතින බැවිනි. ව්‍යාපාරිකයන්ගෙන් 42.1% පවසන්නේ ප්‍රමිතිය අඩු වී අඩු මිලට (වැඩි ලාභයක් තබා නොගෙන) අලෙවි කිරීමට සිදුවන බවයි.

කුඩා සහ මධ්‍ය පරිමාණයේ වී මෝල්හිමියන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන් ද වී/සහල් අලෙවියේදී මුහුණදෙන තවත් ගැටළුවක් වන්නේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් සමග පවතින තරගකාරිත්වය යි. මහා පරිමාණ ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් සතුව පවතින සම්පත් උපයෝගී කර ගනිමින් ඔවුන් දිස්ත්‍රික්කය පුරා වී මිලට ගැනීමත්, වී මිල ඉහළ දැමීමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන්ද පොදුවේ මුහුණදෙන ගැටළුවකි. මෙයට අමතරව වී මෝල්හිමියන් තම නිෂ්පාදන මහා පරිමාණයෙන් සිදු කිරීම තුළ ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවීම තුළ මහා පරිමාණ වී මෝල්හිමියන් තම නිෂ්පාදන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගේ නිෂ්පාදනවලට වඩා අඩු මිලකට වෙළඳපළට නිකුත් කිරීම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළුවකි. මෙම තත්ත්වය තුළ ඔවුන්ට පාරිභෝගිකයන් රඳවා ගැනීම අපහසු වේ. මහා පරිමාණ වී මෝල්හිමියන් නිෂ්පාදන අලෙවි කරන මිලටම කුඩා හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන් තම නිෂ්පාදන අලෙවි කිරීමේදී සිදුවන පාඩුව වළක්වා ගැනීමට හෝ එය පියවා ගැනීමට මාර්ගයක් නොමැති අතර මෙම තරගකාරී තත්ත්වය තුළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට තම වී මෝල් පවත්වා ගෙන යාමේ නොහැකියාවකට මුහුණ දීමට සිදුවේ.

ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද ප්‍රවාහන පහසුකම් හිඟවීම නිසා වී මිලට ගැනීමේ කටයුතුවලදී මෙන්ම වී/සහල් අලෙවියේදීද ගැටළුවලට මුහුණපානු ලබයි. ප්‍රවාහන පහසුකම් තමන් සතුව පවතී නම් තම වී තොග ඉහළ මිලක් ගෙවන වී මෝල්හිමියන්ට ගෙන ගොස් දීමට හැකියාව පවතින බව ව්‍යාපාරිකයන් අදහස් කරන අතර වී මෝල්හිමියන් පවසන්නේ තම සහල් පිට ප්‍රදේශවලට ගෙනගොස් අලෙවි කිරීමට ඒ මගින් හැකියාව ලැබෙන බවත්, වෙළඳපොළ තුළට ප්‍රවේශවීමට තමන්ට හැකියාව වැඩි වශයෙන් ලැබෙන බවත්ය. වී මිලට ගැනීමට පිටතින් ලොරි නොපැමිණීම ව්‍යාපාරිකයන්ගේ 5.3% ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරනු ලබයි. මේ හේතුව නිසා ළඟම පවතින වෙළඳපොළට (වී මිලට ගැනීමේ මධ්‍යස්ථානයට හෝ වී මෝල්හිමියන්ට) අඩු මුදලකට වී අලෙවි කිරීමට ව්‍යාපාරිකයන්ට සිදුවේ.

ප්‍රධාන වී මෝල්හිමියන් කිහිපදෙනෙකු විසින් වී මිල පාලනය කිරීම, තමන් වී අලෙවියේදී මුහුණදෙන ගැටළුවක් ලෙසින් ව්‍යාපාරිකයන්ගෙන් 5.3%ක් සඳහන් කරනු ලබන අතර, මේ නිසා වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් තමන්ට අඩු මිලකට වී අලෙවි කිරීමට සිදුවන බව සඳහන් කරනු ලබයි.

### 4.4.4 වී / සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයින්/වී මෝල්හිමියන් තම ගැටළු සඳහා ඉදිරිපත් කළ යෝජනා

වී එකතු කිරීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 2.6%ක් සහ වී මෝල්හිමියන්ගෙන් 7.9%ක් ප්‍රවාහන ගැටළුවට පිළියමක් ලෙසින් යෝජනා කරනු ලබන්නේ ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම සඳහා රාජ්‍ය අංශයෙන් ණය පහසුකම් සලසාදීම කළයුතු බවයි. වී මෝල් හිමියන්ගෙන් 7.9% මෙම ගැටළුවට පිළියමක් ලෙස වී මෝලට පැමිණෙන ව්‍යාපාරිකයන්ට සහල් අලෙවි කිරීම සිදු කරනු ලබයි. තරගකාරිත්වයට මුහුණදීම සඳහා ඉහළ ගුණාත්මක තත්ත්වයන්ගෙන් යුතු වී ගොවීන්ගෙන් ලබා ගැනීම කළයුතු බවත් ඒ සඳහා ගොවීන් දැනුවත් කිරීම් කළ යුතු බවත් අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 7.9%ක් ප්‍රකාශ කරනු ලබයි. වී මිල අවිනිශ්චිතතාව කෙරෙහි රජය විසින් සහල් ආනයනයට අවසරදීම බලපානු ලබන හෙයින් සහල් ආනයනය නතර කළයුතු බව ව්‍යාපාරිකයන්ගෙන් 2.6%ක් විසඳුම් ලෙස ඉදිරිපත් කරනු ලබයි.

මිල අවිනිශ්චිතතාවට පිළියමක් ලෙසින් වී මෝල්හිමියන්ගෙන් 18.4%ක් ඉදිරිපත් කරනුයේ, වී/සහල් සඳහා සහතික මිලක් නියම කළයුතු බවයි. වී මිල ඉහළ යාමේදී සහල් නිෂ්පාදන වියදම් ඉහළයාම සිදුවන අතර සහල් මිල ඉහළ යාමට මෙය බලපෑමක් වේ. මිල අවිනිශ්චිතතාව තුළ තමන්ට සිදුවන පාඩුව අවම කර ගැනීමට වී/සහල් මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම හේතුවන බව ඔවුන්ගේ අදහසයි. එමෙන්ම රජය විසින් සහල් ආනයනය තහනම් කළයුතු බව වී මෝල්හිමියන්ගෙන් 7.9%කගේ මත යයි. වී මෝල් හිමියන්ගෙන් 7.9%ක් මිල අවිනිශ්චිතතාව නිසා සහල් නිෂ්පාදනය සීමා කරන බව සඳහන් කරනු ලබයි.

සහල් වෙළඳපොළේ ඇති තරගකාරිත්වයට පිළියම් ලෙසින් ඉහළ ගුණාත්මක තත්ත්වයේ සහල් නිෂ්පාදනය (13.1%) ප්‍රදේශයේ සහල් සැකසුම්කරුවන් වැඩි වශයෙන් ප්‍රවේශ නොවන මහනුවර, රඹුක්කන වැනි ප්‍රදේශවලට සහල් අලෙවි කිරීමට මාර්ග සකසා ගැනීම (2.6%), සහල් පරිභෝජනයට පාරිභෝගිකයින් පෙළඹවීම සඳහා ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (2.6%) සිදු කළ යුතු බව යෝජනා කරනු ලබයි

## 4.5 මිල ප්‍රවණතා


4.12 සංඛ්‍යා සටහනින් 1993 සිට 2003 වර්ෂය දක්වා වී මිල ගණන් පෙන්නුම්කර ඇති අතර එම මිල ගණන් කාල ශ්‍රේණි විශ්ලේෂණය මගින් 2010 දක්වා පුරෝකතනය කළ මිල ප්‍රවණතාවන් පෙන්නුම් කර ඇත. 4.1 සහ 4.2 ප්‍රස්ථාරවලින් මෙම තත්ත්වය යල,මහ දෙකන්නය සම්බන්ධයෙන්ම සලකා බලා ඇති අතර එහි නාමික ප්‍රවණතාවෙන් පෙන්නුම් කරන්නේ උපනතයකි. එනම් පුරෝකතික මිල ගණන් විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ 1993 සිට 2010 වර්ෂය දක්වා ක්‍රමයෙන් වී මිල ගණන්වල නාමිකව ඉහළ යාමකි. එසේම එක් එක් වර්ෂයට අදාළ සත්‍ය මිල ගණන්වල මිල ඉහළ යාමේ ප්‍රතිශතය සලකා බැලීමෙන් ද පැහැදිලි වන්නේ බොහෝ වර්ෂවලදී නාමික මිල ගණන් ඉහළ ගොස් ඇති බවය.

4.12 වගු සටහන : 1993 - 2010 දක්වා වී මිල ප්‍රවණතා

| වර්ෂය | නාමික මිල (කිලෝග්‍රෑම් 1 / රු) | | | | පුරෝකතික මිල (කි.ග්‍රෑ 1 / රු) | |
|---|---|---|---|---|---|---|
| | යල | මිල ඉහළ යාමේ % | මහ | මිල ඉහළ යාමේ % | යල | මහ |
| 1993 | 7.60 | - | 6.75 | - | 7.6 | 6.1 |
| 1994 | 6.60 | 15.2 | 6.53 | 3.4 | 8.1 | 6.7 |
| 1995 | 8.60 | 23.3 | 6.53 | 0 | 8.7 | 7.3 |
| 1996 | 10.50 | 18.1 | 7.93 | 17.6 | 9.2 | 7.9 |
| 1997 | 10.70 | 1.9 | 8.94 | 11.3 | 9.7 | 6.6 |
| 1998 | 9.30 | -15.1 | 8.61 | -3.8 | 10.3 | 9.2 |
| 1999 | 12.30 | 24.3 | 12.02 | 28.4 | 10.8 | 9.8 |
| 2000 | 11.90 | -3.4 | 6.54 | -40.7 | 11.4 | 10.4 |
| 2001 | 12.10 | 1.7 | 11.32 | 24.9 | 12.1 | 11.1 |
| 2002 | 11.90 | -1.7 | 11.99 | 5.2 | 12.5 | 11.7 |
| 2003 | 12.50 | 4.8 | 12.16 | 1.4 | 13.1 | 12.3 |
| 2004 | - | - | - | - | 13.6 | 12.9 |
| 2005 | - | - | - | - | 14.2 | 13.5 |
| 2006 | - | - | - | - | 14.7 | 14.1 |
| 2007 | - | - | - | - | 15.3 | 14.7 |
| 2008 | - | - | - | - | 15.9 | 13.4 |
| 2009 | - | - | - | - | 16.4 | 15.9 |
| 2010 | - | - | - | - | 17.1 | 16.6 |


මූලාශ්‍ර: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2004

4.1 ප්‍රස්තාර සටහන




මූලාශ්‍ර: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2004

## 4..2 ප්‍රස්තාර සටහන




මූලාශ්‍ර: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2004

## 4.6 කාලීන මිල වෙනස්වීම

කාලීන මිල වෙනස්වීම සලකා බැලීමේදී වර්ෂයක් තුළ ප්‍රධාන ලෙස ක්‍රියාත්මක වන යල සහ මහ කන්නයන්ට අදාළව අස්වනු නෙළන කාල පරිච්ඡේදයත් ඉන් බැහැර වගා කටයුතු ආරම්භ කරන කාල පරිච්ඡේදයත් තුළ පැහැදිලි මිල වෙනස්වීම් සිදු වන බව 4.13 සංඛ්‍යා සටහනින් පැහැදිලි වේ. එනම්, යල සහ මහ කන්නයන්ට අදාළ අස්වනු නෙළන කාලය වන මාර්තු, අප්‍රේල්, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවලදී අනෙකුත් මාසවලට සාපේක්ෂව මිල ගණන් පහළ මට්ටමක පවතින අතර වී වගා කටයුතු ආරම්භ කරන යල සහ මහ දෙකන්නයට අදාළ නොවැම්බර්, දෙසැම්බර් සහ ජනවාරි යන මාසවලදී අනෙකුත් මාසවලට සාපේක්ෂව වී මිල ගණන් ඉහල මට්ටමක පවතී.

4.13 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කාලීන වී මිල ගණන් වෙනස්වීම්

| මාසය | වාර්ෂික මිල කි.ග්‍රෑ.1/රු. | | | | | වර්ෂ 5 ක සාමාන්‍ය මිල කි.ග්‍රෑ. 1 /රු. | මිල දර්ශකය |
|---|---|---|---|---|---|---|---|
| | 1998 | 1999 | 2000 | 2001 | 2002 | | |
| ජනවාරි | -- | 13.76 | 11.96 | 13.34 | 15.00 | 13.52 | 114 |
| පෙබරවාරි | 8.17 | 11.23 | 8.75 | 12.84 | 15.06 | 11.21 | 96 |
| මාර්තු | 9.11 | 11.73 | 8.32 | 12.00 | 10.96 | 10.42 | 98 |
| අප්‍රේල් | 8.16 | 12.31 | 8.75 | 10.73 | 13.03 | 10.59 | 90 |
| මැයි | 9.55 | 12.88 | 9.03 | 11.15 | 13.60 | 11.24 | 96 |
| ජූනි | 9.31 | 12.33 | 9.41 | 11.86 | 13.28 | 11.24 | 96 |
| ජූලි | 9.77 | 12.19 | 11.35 | 11.94 | 12.20 | 11.49 | 98 |
| අගෝස්තු | 9.52 | 12.18 | 13.00 | 12.25 | 12.30 | 11.85 | 100 |
| සැප්තැම්බර් | 9.00 | 12.46 | 10.91 | 11.87 | 11.43 | 11.13 | 95 |
| ඔක්තෝම්බර් | 9.09 | 12.63 | 10.77 | 12.00 | 12.25 | 11.35 | 97 |
| නොවැම්බර් | 10.30 | 12.52 | 11.50 | 13.17 | 12.96 | 12.09 | 103 |
| දෙසැම්බර් | 12.14 | 12.41 | 12.42 | 13.80 | 13.49 | 12.85 | 109 |
| **සාමාන්‍යය** | **9.46** | **12.39** | **10.51** | **12.25** | **12.97** | **11.68** | **100** |

මූලාශ්‍ර : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2002)

කෙසේ වුවද යල මහ දෙකන්නය පිළිබඳව සන්සන්දනාත්මකව සලකා බැලීමේදී ශීඝ්‍ර මිල පහළයාමක් මහ කන්නයේ වී අස්වනු නෙළා ගැනීමත් සමග සිදුවේ. යල කන්නයේදී ප්‍රමාණවත් පරිදි ජලය ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ලැබෙනුයේ, අඩු අස්වනු ප්‍රමාණයකි. තොග රැස්කරන්නන් විසින් එම ප්‍රමාණය අනාගතයේදී ඉහළ මිලක් යටතේ අලෙවිකර ගැනීමේ අපේක්ෂාවෙන් සාපේක්ෂව ඉහළ මිලකට මිලදී ගනු ලබයි. විශේෂයෙන්ම වී මෝල්හිමියන් විසින් ඉහළ මිල ගණන් ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය තුළ (නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, ජුලි) ඉහළ ලාභයක් ලබා ගැනීමේ අරමුණින් වී ගබඩා කරනු ලබයි. සාමාන්‍යයක් ලෙස  සලකා බැලීමේදී පොළොන්නරු දිස්ත්‍රික්කයේ පහළම වී මිල ගණන් වාර්තා කරනුයේ මාර්තු මාසයේදී වන අතර ඉහළම මිල ගණන් වාර්තා කරනුයේ ජනවාරි මාසයේදීය (4.13 සංඛ්‍යා සටහන). එනම් ජනවාරි මාසයේ වී මිල ගණන් 14%කින් ඉහළ ගොස් ඇති අතර මාර්තු මාසයේ 12%කින් පහළ බැස ඇත.

### 4.7 මිල පැතිරීම

මිල පැතිරීම සලකා බැලීමේදී එය ගොවියා, වී මිලදී ගැනීමේ නිරත එකතු කරන්නා සහ වී මෝල් හිමියා යන එක් එක් මට්ටම්වලදී සිදුවේ. නමුත් මෙම තත්ත්වය වී අලෙවි මාර්ගයේ ස්වරූපය අනුව තීරණය වේ. එනම් වී මිලදී ගැනීමේ නිරත එකතුකරන්නා යන අලෙවි පාර්ශවය සලකා බැලීමේදී ඒ තුළ ගමේ වී එකතු කරන්නා, ගමෙන් දුරස්ථ පිට ප්‍රදේශවල වී එකතු කරන්නා, තැරැව්කරුවන් ආදිය ඇතුළත් වේ. සාමාන්‍යයක් ලෙස සලකා බැලීමේදී ගොවියා තම වී තොග වී එකතු කිරීමේ  නිරත අතරමැදියන්ට ද ඔවුන් තැරැව්කරුවන් හරහා වී මෝල් හිමියන්ට ද අලෙවි කරන්නේ නම්, මිලෙහි පැතිරීමේ  නිශ්චිත වෙනසක් ඇතිවිය හැකිය. නමුත් ගොවීන් විසින් වී මෝල්හිමියන්ට සෘජුවම තම වී තොග අලෙවි කිරීමේදී ගොවියාට ලැබෙන මිලෙහි වෙනසක් අතරමැදියකුට අලෙවි කිරීමට සාපේක්ෂව නොමැත. ඒ අනුව නිෂ්පාදන මට්ටමේ, අතරමැදි මට්ටමේ සහ තොග මිලදී ගැනීමේ (වී මෝල්හිමියා) අවස්ථාවේ මිල ගණන්වල පවතින වෙනස එකින් එකට රු.1-2 ක් අතර මිල වැඩිවීමේ ප්‍රවණතාවකින් යුක්ත වේ. කෙසේ හෝ එම මිල මට්ටම සැමවිටම අස්වනු නෙළන කාලය තුළදී රජයේ සහතික මිල ඉක්ම නොයන මිලකි. නමුත් අස්වනු නෙළීමේ කාලයෙන් බැහැර කාල පරිච්ඡේදය තුළ පෞද්ගලික  අංශයේ වී මිල ගණන් රජයේ සහතික මිල ඉක්මවා යයි.

### 4.8 මිල උච්චාවචනය

වාර්ෂික වී මිල ගණන්වල වෙනස්වීමේ ස්වරූපය පරීක්ෂා කිරීමේදී එහි ඇත්තේ උච්චාවචනයක් බව 4.14 සංඛ්‍යා සටහනින් පැහැදිලි වේ. ඒ සඳහා ආර්ථික අස්ථාවරත්වය ප්‍රධාන සාධකයක් වී පවතී. එයට අමතරව වෙළඳපළ ක්‍රියාකාරිත්වයේ ස්වභාවයද (පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය සහ රාජ්‍ය අංශයේ මැදිහත්වීම) වී මිල ගණන් උච්චාවචනය සඳහා බලපාන අනෙකුත් සාධකය වේ.

4.14 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල උච්චාවචනය (1990-2002)

| වර්ෂය | අවම මිල කි.ග්‍රෑ. 1/රු. | උපරිම මිල කි.ග්‍රෑ. 1/රු. | මිල වෙනස | මිල වෙනස්වීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1990 | 6.07 | 8.82 | 2.75 | 45 |
| 1991 | 5.56 | 8.35 | 2.79 | 50 |
| 1992 | 6.95 | 8.48 | 1.53 | 22 |
| 1993 | 6.74 | 8.89 | 2.15 | 32 |
| 1994 | 6.38 | 8.24 | 1.86 | 29 |
| 1995 | 6.38 | 8.24 | 1.86 | 29 |
| 1996 | 7.65 | 11.59 | 3.94 | 52 |
| 1997 | 8.70 | 13.18 | 4.48 | 51 |
| 1998 | 8.10 | 12.14 | 4.04 | 50 |
| 1999 | 11.23 | 13.76 | 2.53 | 23 |
| 2000 | 8.32 | 13.00 | 4.68 | 56 |
| 2001 | 10.73 | 13.80 | 3.07 | 29 |
| 2002 | 10.96 | 15.06 | 4.1 | 37 |

මූලාශ්‍ර : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව- (2002)

ප්‍රධාන වශයෙන්ම කෘෂි නිෂ්පාදනවල මිල ගණන් ජීව විද්‍යාත්මක සාධක මත වෙනස් වේ. එනම්, වී නිෂ්පාදනය සම්බන්ධයෙන් සලකා බැලීමේදී සලකා බලනු ලබන කන්නයක් තුළදී සැලකිය යුතු මට්ටමින් වී නිෂ්පාදනය ඉහළ ගොස් සහල් නිෂ්පාදනයද (සැපයුම) ඉහළ ගියවිට එම ඉහළ ගිය සහල් සැපයුමට සාපේක්ෂව පාරිභෝගික ඉල්ලුමේ ඉහළ යාමක් සිදු නොවේ. එනම් පාරිභෝගික ඉල්ලුම කෙටි කාලයක් තුළ ස්ථාවරව පවතී. එබැවින් වී නිෂ්පාදනයේ ඉහළ යාමට සාපේක්ෂව වී මිල ගණන් පහළ යාම සිදුවේ (4.15 සංඛ්‍යා සටහන). එනම් 1990 වර්ෂයට සාපේක්ෂව 1991 වර්ෂයේදී පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය මෙ.ටො. තුන්සිය හතර දහසක් ලෙස ඉහළ ගියවිට වී කිලෝග්‍රෑමයක මිල රු.6.85 ක් ලෙස, 1990 වර්ෂයට සාපේක්ෂව ශත 31 න් මිල ගණන් පහළ ගොස් ඇත. නමුත් 2000 වර්ෂයට සාපේක්ෂව 2001 වර්ෂයේදී වී නිෂ්පාදනය මෙ.ටො. විසිහය දහසකින් ඉහළ ගොස් ඇති විට වී කිලෝවක මිල ද රු.2.83කින් ඉහළ ගොස් තිබුණි. මිල මට්ටමේ ඉහළ යාම හා වෙළඳපළ ක්‍රියාකාරිත්වය සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම යන සාධක ඒ සඳහා පාදකවී ඇත

**4.15 සංඛ්‍යා සටහන : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය සහ මිල ගණන් වෙනස්වීම**

| වර්ෂය | වී මිල ගණන් රු./කි.ග්. 1 | වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | නිෂ්පාදනය (මෙ.ටො. දහස් ගණනින්) |
|---|---|---|---|
| 1990 | 7.16 | 78350 | 291 |
| 1991 | 6.85 | 81800 | 304 |
| 1992 | 7.59 | 72159 | 266 |
| 1993 | 6.75 | 83275 | 359 |
| 1994 | 6.53 | 88152 | 285 |
| 1995 | 6.53 | 88553 | 356 |
| 1996 | 7.93 | 76011 | 300 |
| 1997 | 8.94 | 79628 | 326 |
| 1998 | 8.61 | 91824 | 339 |
| 1999 | 12.02 | 93329 | 352 |
| 2000 | 8.54 | 99051 | 394 |
| 2001 | 11.37 | 96967 | 420 |
| 2002 | 11.99 | 95074 | 372 |
| 2003 | 12.16 | 103,108 | |

මූලාශ්‍ර : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - (2003) , (2004)

## 4.9 ගොවීන්ගේ වී මිල ගණන් වෙනස්වීමේ ස්වභාවය

ගොවීන්ගේ මිල ගණන්වල වෙනස්වීමේ ස්වභාවය පිළිබඳව හඳුනාගැනීමේ දී ප්‍රධාන විචල්‍ය කිහිපයක් පිළිබඳව විමර්ශනය වැදගත් වේ. එනම් අලෙවි කළ මුළු ප්‍රමාණය, ප්‍රවාහන පිරිවැය, ණයට ගත් ප්‍රමාණය, ගොවීන්ගේ නිෂ්පාදන මට්ටම සහ වගා කළ මුළු බිම් ප්‍රමාණය ආදියයි.

2002/2003 මහ හා 2003 යල කන්නයට අදාළව සිදු කළ අධ්‍යයනයට අනුව ගොවීන්ගෙන් 70%ක් වී කිලෝග්‍රෑම් 1000-5000ක් අතර ප්‍රමාණයක් අලෙවිකර ඇත්තේ වී කිලෝ ග්‍රෑමයක් රු.11.72ක් වැනි සාමාන්‍ය මිල මට්ටමක් යටතේය. ගොවීන්ගෙන් 9%ක් වී අලෙවි කර ඇත්තේ කිලෝග්‍රෑම් 1000 ට අඩු ප්‍රමාණයක් වන අතර එය කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 10.39ක් වැනි මිලකටය. ගොවීන්ගෙන් 21%ක් වී කිලෝග්‍රෑම් 5000 - 20000 අතර ප්‍රමාණයක් අලෙවිකර ඇත්තේ කිලෝ ග්‍රෑමයක් රු.12.70ක මිලකටය. ඒ බව සංඛ්‍යා සටහන් අංක 4.16න් යල/මහ කන්නවලට අදාළව පැහැදිලි වේ. මෙහිදී ගොවීන්ගෙන් ඉතා සුළු ප්‍රතිශතයක් ඉතා සුළු වී ප්‍රමාණයක් සඳහා ඉතාමත් පහළ මිලක් ලබා ගෙන ඇති අතර ගොවීන්ගේ සුළු ප්‍රතිශතයක් විශාල වී තොග ප්‍රමාණයක් සඳහා ඉහළ මිලක් ලබා ගන්නා බව පැහැදිලි වේ.

එනම්, ගොවීන්ගෙන් 66%ක් සුළු වී ප්‍රමාණයක් අස්වනු නෙළූ විගසම විවිධ හේතූන් මත මුළු වී තොගයම හෝ කොටසක් අලෙවි කරන අතර අස්වනු නෙළා මාස තුනකට වඩා වැඩි කාලයක් තුළ ඉහළ මිලක් යටතේ වී තොග අලෙවි කිරීමට තවත් ගොවීන් සුළු පිරිසක් කටයුතු කරනු ලබයි. එහිදී වී කිලෝ ග්‍රෑමයක් සඳහා රු.13.35ක් වැනි උපරිම මිලක් ලැබෙන්නේ වී කිලෝග්‍රෑම් 10,000-15,000 වැනි ඉහල ප්‍රමාණයක් අලෙවිකරන ගොවීන් සුළු පිරිසකට බව 4.16 සංඛ්‍යා සටහනෙන් පැහැදිලි වේ. ඒ අනුව ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයකට අවම හා උපරිම මිලෙන් බැහැර වූ මධ්‍යස්ථ මිලක් ලැබේ.

4.16 වගු සටහන : වී අලෙවි ප්‍රමාණය මත මිල වෙනස්වීම

| අලෙවි ප්‍රමාණය (කි.ග්‍රෑ.) | යල කන්නය | | | මහ කන්නය | | |
|---|---|---|---|---|---|---|
| | ගොවීන් % | සාමාන්‍ය මිල | ඇස්තමේන්තු මිල | ගොවීන් % | සාමාන්‍ය මිල | ඇස්තමේන්තු මිල |
| 0<-< 1000 | 7.4 | 9.75 | 10.58 | 11.7 | 11.02 | 11.58 |
| 1000=<-< 2500 | 28 | 11.31 | 11.01 | 27.4 | 11.92 | 11.69 |
| 2500=<-< 5000 | 42.4 | 11.68 | 11.45 | 44.0 | 11.95 | 11.81 |
| 5000=<-< 7500 | 13 | 12.41 | 11.9 | 12.4 | 11.49 | 11.92 |
| 7500=<-< 10000 | 5.3 | 12.46 | 12.35 | 0.2 | 12.59 | 12.04 |
| 10000=<-< 15000 | 2.8 | 13.47 | 12.79 | 3.5 | 13.23 | 12.15 |
| 15000=<-< 20000 | 0.8 | 12.21 | 13.24 | 0.2 | 12.00 | 12.26 |
| >=20000 | - | - | - | 0.5 | 11.63 | 12.38 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

මිල වෙනස්වීම් නිෂ්පාදන ප්‍රමාණය අනුව සලකා බැලීමේදී වී කිලෝවක් සඳහා ඉහළ මිලක් එනම් රු.13.35ක මිලක් ලැබෙන්නේ වී කිලෝග්‍රෑම් 10,000-15,000ක් වැනි ඉහළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ගොවීන්ගෙන් 10%ක් වැනි සුළු ප්‍රමාණයක් සඳහාය. නමුත් ගොවීන්ගෙන් බහුතරයක් වන 60%ක් සඳහා වී කිලෝවකට රු.11.84ක මිලක් ලැබෙන්නාවූ අතර එහිදී ඔවුන්ගේ සමස්ත නිෂ්පාදන ප්‍රමාණය කිලෝග්‍රෑම් 2500-7500ක් අතර වේ. 4.17 සංඛ්‍යා සටහනින් යල/මහ කන්නවල වී නිෂ්පාදනය අනුව මිල වෙනස්වීම පිළිබඳව ඉදිරිපත් කෙරේ.

එමෙන්ම මිල වෙනස්වීම වගාකළ මුළු වගා බිම් ප්‍රමාණය අනුව සලකා බැලීමේදී ගොවීන්ගෙන් 90% ක් දෙනා අක්කර 2-6 ක් අතර ප්‍රමාණයක් වී වගා කරනු ලබන අතර, එහිදී ඔවුන්ට වී කිලෝ ග්‍රෑමයක් සඳහා රු.12.00ක සාමාන්‍ය මිලක් ලැබේ. නමුත් අක්කර දෙකට වඩා අඩුවෙන් වගා කරන ගොවීන් සඳහා ලබාගත හැකි වන්නේ අඩු නිෂ්පාදන ප්‍රමාණයක් වන අතර ඒ සඳහා ඔවුන්ට කිලෝග්‍රෑමයක් සඳහා රු.11.44 ක තරම් සාපේක්ෂ අඩු මිලක් ලැබී තිබේ. නමුත් අක්කර 10ට වඩා වැඩියෙන් වගා කරන ගොවීන් සඳහා 2002/2003 මහ කන්නයේ දී කිලෝග්‍රෑමයක් සඳහා රු. 13.22ක සාමාන්‍ය මිලක් ලැබී ඇත. මේ අනුව සමස්තයක් ලෙස අක්කර 2-6ක් අතර ප්‍රමාණයක් වගා කරන ගොවීන් සඳහා මධ්‍යස්ථ මිල ගණන් ලබාගත හැකි වී තිබේ.

වගා කරන මුළු බිම් ප්‍රමාණය මත ලැබෙන නිෂ්පාදනයද වෙනස්වන අතර අක්කර දෙකට වඩා අඩුවෙන් වගා කරන ගොවීන් ලබා ගන්නා අස්වැන්න මුදල් අවශ්‍යතා සහ ගබඩා පහසුකම් නොවීම හේතුවෙන් අස්වනු නෙළූ විගසම අලෙවි කරන අතර ඔවුන්ට ලැබෙන මිල පහළ මට්ටමක පැවතීමට එය හේතුවේ. අක්කර හයට වඩා වැඩියෙන් වගා කරන ගොවීන් තම වී නිෂ්පාදනය මිල ඉහළ යනතුරු ගබඩා කර තබාගෙන විකිණීම සිදුකෙරේ. මෙම ගොවීන්ගෙන්

වැඩි පිරිසක් වී ගොවිතැනට අමතරව වෙනත් ආදායම් මාර්ග සහිත වුවන් වන අතර ඔවුන් අස්වනු නෙලූ විගසම වී අලෙවි කිරීමක් සිදු කරන්නේ නම් ඒ ඉතාමත් ස්වල්ප වශයෙනි.

4.17 සංඛ්‍යා සටහන : වී නිෂ්පාදන ප්‍රමාණය අනුව මිල වෙනස්වීම

| වී නිෂ්පාදනය කි.ග්‍රෑ | යල කන්නය | | | මහ කන්නය | | |
|---|---|---|---|---|---|---|
| | ගොවීන් % | සාමාන්‍ය මිල (රු) | ඇස්තමේන්තු මිල (රු) | ගොවීන් % | සාමාන්‍ය මිල | ඇස්තමේන්තු මිල |
| 0<-<1000 | 5.8 | 11.52 | 11.38 | 1.8 | 9.5 | 9.98 |
| 1000=<-<2500 | 9.6 | 11.09 | 11.58 | 9.2 | 10.27 | 10.55 |
| 2500=<-<2500 | 39.2 | 11.88 | 11.78 | 40.0 | 11.23 | 11.13 |
| 5000=<-<2500 | 21.1 | 11.98 | 11.98 | 29.8 | 12.31 | 11.7 |
| 7500=<-<2500 | 12.4 | 12.18 | 12.18 | 11.2 | 12.67 | 12.27 |
| 10000=<-<15000 | 8.2 | 13.2 | 12.39 | 10.8 | 13.21 | 12.85 |
| 15000=<-<20000 | 2.0 | 12.45 | 12.59 | 2.6 | 13.01 | 13.42 |
| 20000=< | 1.6 | 12.38 | 12.79 | 1.2 | 13.39 | 13.99 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

ප්‍රවාහන පිරිවැය අනුව වී මිල ගණන් වෙනස්වී ඇති ආකාරය සංඛ්‍යා සටහන් අංක 4.18න් පෙන්නුම් කෙරේ. එයට අනුව රුපියල් සියයට අඩු ප්‍රවාහන පිරිවැයක් දරන 5.1%ක් වන ගොවීන් පිරිස්ක වී කිලෝ ග්‍රෑමයක් සඳහා 11.52ක මුදලක් ලබා ගනී. ගොවීන්ගෙන් 56.7ක් ප්‍රවාහන පිරිවැය වශයෙන් රුපියල් 500ත් 4,000ත් අතර මුදලක් දරණ අතර ඔවුන් වී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 11.80- 11.89ත් අතර මුදලක් ලබා ගනී.

4.18 සංඛ්‍යා සටහන : ප්‍රවාහන පිරිවැය මත වී මිල වෙනස්වීම

| ප්‍රවාහන පිරිවැය (රු.) | ගොවීන් % | සාමාන්‍ය මිල (කි.ග්‍රෑ 1/රු) | ඇස්තමේන්තු මිල (කි.ග්‍රෑ1/රු.) |
|---|---|---|---|
| 0<-< 100 | 5.1 | 11.52 | 11.72 |
| 100=<-<500 | 26.7 | 11.40 | 11.70 |
| 500=<-<1000 | 24.2 | 11.80 | 11.68 |
| 1000=<-<2000 | 20.7 | 11.89 | 11.66 |
| 2000=<- <4000 | 11.8 | 11.85 | 11.64 |
| 4000=<-<6000 | 6.1 | 12.00 | 11.62 |
| 6000=<-<8000 | 3.5 | 11.86 | 11.60 |
| >=8000 | 1.9 | 10.88 | 11.58 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

ගොවීන් විසින් ණය ලබා ගැනීමේ ප්‍රමාණය මත වී මිල ගණන් වෙනස්වීම සංඛ්‍යා සටහන් අංක 4.19 තුළින් පෙන්නුම් කෙරේ. ගොවීන්ගෙන් 55% දෙනා රු.10000-25000 ක් අතර ණය ප්‍රමාණයක් ලබාගෙන ඇති අතර එහිදී ඔවුන් තම වී තොග අලෙවිකර ඇත්තේ කිලෝ ග්‍රෑමයක් රු.11.86ක් වැනි මිලකටය. මෙහිදී කිලෝ ග්‍රෑමයක් සඳහා රු.10.15ක් තරම් අවම සාමාන්‍ය මිලක් ලැබී ඇත්තේ ගොවීන්ගෙන් 5%කට තරම් ඉතා සුළු පිරිසකට වන අතර ඔවුන් ලබාගෙන ඇත්තේ රු.5000/-ට වඩා අඩු ණය ප්‍රමාණයක් වේ. තවද ගොවීන්ගෙන් 1%ක් තරම් ඉතා සුළු ප්‍රමාණයක් රු.75,000ක වැනි විශාල ණය ප්‍රමාණයක් ලබාගෙන තිබෙන අතර ඔවුන් සතු වී තොග අලෙවි කර ඇත්තේ සාපේක්ෂ ලෙස ඉහළ මිලකටය.

4.19 සංඛ්‍යා සටහන : ගොවීන් ලබාගත් ණය ප්‍රමාණය මත වී මිල වෙනස්වීම

| ණය ප්‍රමාණය (රු.) | යල කන්නය | | | මහ කන්නය | | |
|---|---|---|---|---|---|---|
| | ගොවීන් % | සාමාන්‍ය මිල(කි.ග්‍රෑ.1/රු.) | ඇස්තමේන්තු මිල (කි.ග්‍රෑ 1/රු) | ගොවීන් % | සාමාන්‍ය මිල (කි.ග්‍රෑ 1/රු.) | ඇස්තමේන්තු මිල(කි.ග්‍රෑ.1/රු) |
| 0<-< 5000 | 5.7 | 11.00 | 11.15 | 4.5 | 9.30 | 10.23 |
| 5000=<-<10000 | 16.4 | 11.32 | 11.43 | 20.0 | 11.40 | 10.71 |
| 10000=<-<15000 | 27.4 | 12.23 | 11.71 | 26.6 | 11.65 | 11.19 |
| 15000=<-<25000 | 28 | 11.96 | 11.99 | 28.0 | 11.62 | 11.67 |
| 25000=<-<40000 | 12.5 | 11.80 | 12.24. | 11.8 | 12.07 | 12.15 |
| 40000=<-<60000 | 6.5 | 12.85 | 12.54 | 6.2 | 12.47 | 12.63 |
| 60000=<-<75000 | 2.1 | 12.85 | 12.82 | 1.7 | 13.93 | 13.11 |
| >=75000 | 1.5 | 13.00 | 13.10 | 1.4 | 12.85 | 13.59 |

මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිකරණ අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණය- 2004

## පස්වන පරිච්ඡේදය

# සාරාංශ නිගමන සහ යෝජනා

## 5.1 සාරාංශ

ප්‍රධාන රැකියාව ලෙසින් වී නිෂ්පාදනය, අලෙවිය සහ සැකසීමේ ක්‍රියාවලියට තරුණ සහභාගීත්වය ඉතා අඩු මට්ටමක පවතී. ගොවීන්ගෙන් 37%ක් දිගු කාලයක් එනම්, අවුරුදු 30ක් හෝ එයට වැඩි කාලයක් වී වගාවේ නිරත පුද්ගලයන් ය. එසේ වුවද, වී මිලට ගැනීමේ නිරත අතරමැදියන් ලෙස ව්‍යාපාරය තුළ රැඳී සිටින පිරිස 2.6%ක් වන අතර වී මෝල් හිමියන් ලෙස එවැනි කාලයක් රැඳී සිටි කිසිවෙකුත් නොවිණි. මෙම ව්‍යාපාරය තුළ පවතින අවදානම් සහගත බව එයට හේතු වී ඇත.
නගරයට සමීප සහ නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල වී අලෙවි මාර්ගයන්හි වෙනස්කම් පවතී. එනම්, නගරයට සමීප ප්‍රදේශවල ගොවීන් සෘජුවම හෝ අතරමැදියෙකු මාර්ගයෙන් වීමෝල වෙත වී අලෙවි කරන නමුත් නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල වී අලෙවි ක්‍රියාවලිය මෙයට වඩා සංකීර්ණ ස්වරූපයක් ගනු ලබයි. එනම්,
නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල ගොවියා ———► ගමේ වී එකතුකරන්නා ———► පිටස්තර වී එකතුකරන්නා ———► තැරැව්කරු ———► මෝල්හිමියා වශයෙනි.

ගොවීන්ගෙන් 83%ක් ණය ලබාගන්නා අතර ඉන් 45.5%ක් ණය ලබාගෙන ඇත්තේ නොවිධිමත් අංශය තුළිනි. ණය ලබා ගන්නා ගොවීන්ගෙන් 75.4%ක් එක් කන්නයකදී වගා අවශ්‍යතා සඳහා රු.10,000 - 50,000ත් අතර ණය මුදල් ලබා ගන්නා අතර 2.7%ක් රුපියල් පනස් දහසට වඩා වැඩි මුදලක් එක් කන්නයකදී ණය වශයෙන් ලබා ගනී. මෙලෙස ණය ලබා ගැනීමේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ වගා කටයුතුවල සියළු කාර්යයන් සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට වන නමුත් ගොවීන්ගෙන් 57%කගේ ණය ලබාගැනීමේ මූලික අරමුණ වී ඇත්තේ කෘමිනාශක සහ රසායනික පොහොර ලබා ගැනීමය. ණයලාභීන්ගෙන් 65%ක් ණය පියවා අවසන්ව ඇත. ණය ලබාගත් ගොවීන් 3% ක් පමණ ණය ගෙවීම පැහැර හැර ඇති අතර 12%ක ප්‍රමාණයක් ණය ගෙවමින් පවතී. ඒ සඳහා හේතුවී ඇත්තේ, කෘෂි ආදායම් අඩුවීමයි.

වී මිලදී ගැනීමේ අතරමැදියන්ගෙන් 93% ක් වී මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් අරමුණු කරගෙන රාජ්‍ය බැංකුවලින් මෙන්ම වෙනත් මූලාශ්‍රවලින්ද ණය ලබාගෙන ඇත. නමුත් වී මෝල්හිමියන්ගෙන් වැඩි ප්‍රමාණයක් ණය ලබා නොගන්නා අතර ඔවුන්ට අවශ්‍ය අරමුදල් ප්‍රධාන වශයෙන් සපයාගන්නේ තම ලාභ හා තැන්පතු මුදල් භාවිතයෙනි. ණය ලබා ගැනීමේදී ඔවුන්ගේ ප්‍රධාන ණය මූලාශ්‍රය වන්නේ, රාජ්‍ය බැංකු වන අතර වී මිලදී ගැනීම් සඳහා රු.5,000,00 සිට රු.5,000,000/- වඩා වැඩි ණය ප්‍රමාණයන් ලබාගනී.

වී ඇසුරුම් කිරීමේ ප්‍රධාන මාධ්‍ය පොහොර උර වන අතර, ගෝනිවල මිල ගණන්වලට සාපේක්ෂව ඒවායේ මිල අඩුවීම ඒ සඳහා හේතු වී අත. රු.15-20ත් අතර මිලකට මිලදී ගන්නා මෙම මලු උපරිම ලෙස කන්න දෙකක පාවිච්චියෙන් පසුව විනාශවීම ගොවීන් මුහුණ දෙන ප්‍රබල ගැටළුවක් වේ. වී අලෙවි ක්‍රියාවලිය තුළ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය ලෙස රෝද දෙකේ සහ රෝද හතරේ ට්‍රැක්ටරය ගොවීන් යොදා ගනු ලබන අතර මෙම ප්‍රවාහන මාධ්‍යය කුලියට හෝ තමන් සතු හෝ කුමන ආකාරයකින් ලබා ගත්ත ද ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීම ප්‍රබල ගැටළුවක් වේ. එසේ වුවත් වී එකතු කරන්නන් සහ වී මෝල්හිමියන්ගේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යයවී ඇත්තේ ලොරියයි. නමුත් වී මෝල්හිමියන් විසින් වී මිලදී ගැනීමේදී ප්‍රවාහන මාධ්‍යය භාවිතා නොකරන අවස්ථා ඇති අතර සැපයුම්කරුවන් විසින් වී තොග වී මෝල් වෙත ප්‍රවාහනය කරදීම ඒ සඳහා හේතු සාධක වේ.

ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කරනු ලබන්නේ, ගොවීන්ගෙන් 29%කි. එහිදී ගොවි නිවස වී ගබඩාව ලෙස යොදා ගැනීම ප්‍රධාන ලෙස (88%) සිදුවන අතර වී ගබඩා කිරීම සඳහා නිශ්චිත වී ගබඩාවක් පවතින්නේ ගොවීන්ගෙන් 12%කට පමණි. ගොවීන්ගෙන් 66% ක පමණ ප්‍රතිශතයක් තම අස්වනු නෙලූ විගසම වී අලෙවි කිරීමට කටයුතු කරන අතර 15%ක් අස්වනු නෙළා මාස 2ක් ඇතුළත අලෙවි කිරීමට කටයුතු කරයි. නමුත් ඔවුන්ට සහතික මිලට සාපේක්ෂව ලැබෙන්නේ පහළ මිලක් වන අතර මාස තුනට වඩා වැඩි කාල පරිච්ඡේදයක් වී ගබඩා කර තබා

ඉහළ මිලක් ලබා ගැනීමට කටයුතු කරන්නේ ගොවීන්ගෙන් 2%ක ප්‍රමාණයකි. එනම්, ගොවීන්ගේ 98%ක ප්‍රමාණයක් ණය පියවීම සහ නිවසේ හදිසි මුදල් අවශ්‍යතා මත අස්වනු නෙළන කාල පරිච්ඡේදය තුළම හෝ ඒ ආසන්න කාල සීමාව තුළදී වී අලෙවි කරනු ලබයි.

අතරමැදියන්ගෙන් 85%ක් පමණ අස්වනු නෙළන කාලය තුළදී ඉහළ මිලක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වී ගබඩා කරනු ලබයි. එසේම මහා පරිමාණ වී මෝල්හිමියන් (කිලෝග්රෑම් 65 මළු 25,000 - 100,000ක් අතර ගබඩා ධාරිතා ඇති) විසින් ද අස්වනු නෙළන කාල පරිච්ඡේදය තුළ අඩු මිලට වී මිලදී ගෙන වී ගබඩා කරනු ලබයි. එහිදී ඔවුන්ට සත්ත්ව හානි, වීවල වියළී බර අඩුවීම හා ගබඩා කිරීමට අවශ්‍ය අයුරින් බොල් ඉවත්කර වී වියලා, ගබඩා කිරීම සඳහා අමතර ඉහළ පිරිවැයක් දැරීමට සිදුවේ. මෙහිදී ගබඩා කරනු ලැබූ වී තොග සහල් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනු ලබන්නේ ඉන් ඉහළ ලාභයක් අදාළ කන්නය තුළදී ලබා ගැනීමට හැකියාව ඇති බවට නිගමනය වීමෙන් පසුවය. නැතහොත් ගබඩා කළ වී, සහල් නිෂ්පාදන කටයුතුවලට යොදා නොගනී. නමුත් කුඩා පරිමාණ වී මෝල්හිමියන්ට වී ගබඩා කිරීමේ හැකියාවක් නොමැති අතර ඔවුන් සහල් නිෂ්පාදනය කරන්නේ දෛනික වී මිලදී ගැනීම් තුළිනි. මෙහිදී එදිනෙදා සහල් නිෂ්පාදනය සඳහා වී හිඟවූ විට මොවුන් ප්‍රධාන ලෙස ගමේ හිතවත් ගොවීන්ගෙන් වී තොග සපයා ගැනීම සිදු කරයි.

වී අලෙවි කිරීම සම්බන්ධයෙන් ගොවීන් වැඩි නැඹුරුවක් දක්වන්නේ, පෞද්ගලික අංශය වෙතය. එනම් අලෙවි කර ගැනීමේ පහසුව, නෑදෑ, මිත්‍ර සබඳතා, නාට්ටාම් කුලී ගෙවීමට නොවීම, වීවල ගුණාත්මකභාවය දැඩිව පරීක්ෂා නොකිරීම, කෘෂි යෙදවුම් සැපයීම, ප්‍රවාහන පහසුකම් සැපයීම, අත්පිට මුදල් ගෙවීම, විශ්වාසවන්ත භාවය, වෙළඳ මධ්‍යස්ථාන ආසන්නයේ පිහිටා තිබීම යනාදී සාධක මත පෞද්ගලික අංශයට වී අලෙවි කිරීම සඳහා ගොවීන්ගේ වැඩි නැඹුරුවක් ඇත. එසේ වුව ද ඉහළ මිලක් ලබා ගැනීමේ බලාපොරොත්තු ඇතිව රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමද ගොවීන් විසින් සිදු කරනු ලබයි.

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමට ගොවීන් වැඩි දායකත්වයක් ලබා දුන්න ද, එහිදී ඔවුන්ට මිල ගණන් තීරණය කිරීමේ හැකියාවක් නොමැත. එනම්, වී මිලදී ගැනීම්වලදී වී මිල ගණන් තීරණය කරනු ලබන්නේ වෙළෙඳුන් විසිනි. ඔවුන් වී මිල ගණන් තීරණය කරනු ලබන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ ප්‍රධාන වී මෝල්හිමියන් තීරණය කර ඇති දෛනික වී මිල ගණන් යටතේය. අස්වනු නෙළන කාල පරිච්ඡේදය තුළ පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී මෝල්හිමියන්, සහල් නිෂ්පාදන පිරිවැය සහ වී/සහල් වෙළඳපල මිල හැසිරවීමේ තීරණාත්මක මිල පුරෝකතනය කර මිල තීරණය කරනු ලබයි. ගොවීන්ගේ වී මිලදී ගැනීමේදී ගැණුම්කරුවන් විසින් ප්‍රධාන වශයෙන්ම වී තොග සඳහා සියළුම මුදල් එකවර ගෙවීමට කටයුතු කරනු ලබයි. එසේම අතරමැදියන් විසින් අලෙවිකරනු ලබන වී තොග සඳහා ද සියළු මුදල් එකවර ලැබේ. නමුත් සහල් අලෙවියෙන් පසු වී මෝල් හිමියන්ට මුදල් සියල්ල එකවර ද, කොටස් වශයෙන් ද ගෙවීම් කරනු ලබයි.

වී මිලදී ගැනීමේ අතරමැදියන් ප්‍රධාන වශයෙන්ම වී මිලදී ගනු ලබන්නේ, ඔහු අයත් ගම තුළ සහ ගම අවට ප්‍රදේශයෙනි. ගමින් දුරස්ථ සහ දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලින් වී මිලදී ගන්නේ ඉතා සුළු වශයෙනි. වෙළඳුන් වී මිලදී ගැනීම වසර පුරා සිදු කරනු ලබන අතර, බොහෝවිට බුසල් විස්සට වඩා අඩු මිලදී ගැනීම් කමතේදී ද බුසල් අසූවට වැඩි මිලදී ගැනීම් වෙළඳ මධ්‍යස්ථානයේදී ද බුසල් 20-80 අතර මධ්‍යම පරිමාණ මිලදී ගැනීම් ගොවි නිවසේදී ද සිදුකරනු ලබයි.

ගොවීන් විසින් වී අලෙවි කිරීම සඳහා කමත, ගොවි නිවස, වෙළඳ මධ්‍යස්ථානය සහ වී මෝල යන ස්ථාන තෝරා ගැනීම්දී විවිධ සාධක බලපා ඇත. එනම්, වී අලෙවි කර ගැනීමේ පහසුව සඳහා වෙළඳ මධ්‍යස්ථානය තෝරා ගනු ලබන අතර අනෙකුත් ස්ථානවලට සාපේක්ෂව ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම වී මෝල තෝරා ගැනීමට හේතු වී ඇත. ප්‍රවාහන, ඇසුරුම් ආදී අනෙකුත් වියදම් අඩුවීම නිසා අනෙකුත් අලෙවි ස්ථාන සමඟ සැසඳීමේදී ඉහළ මිලක් ලබා ගැනීමට හැකිවීම වී අලෙවි කිරීමේ ස්ථානය ලෙස කමත තෝරා ගැනීමට හේතු වී ඇත. ගොවීන් විසින් තම නිවසේදී වී අලෙවි කරනුයේ මිලදී ගන්නන් නිවසට පැමිණීම නිසා ප්‍රවාහන වියදම් සහ කාලය ඉතිරි කර ගැනීමට හැකිවීම මතය.

මනම්පිටිය ගොවිජන සේවා බලප්‍රදේශය සහ මැදිරිගිරිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ බේබියාවැව ප්‍රදේශයේ වී අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව අඩු ගුණාත්මක තත්ත්වයක පවතී. මෙම හේතුව මත එම ප්‍රදේශවල වී සඳහා පෞද්ගලික අංශයෙන් ලැබෙනුයේ අඩු මිලකි. පෞද්ගලික අංශය විසින් එවැනි වී කිලෝ ග්‍රෑම් එකක් සඳහා වෙළඳපොලේ පවතින මිලට වඩා ශත 30- රු.3.00 අතර මිලක් අඩුකර වී මිලදී ගැනීම සිදුකරනු ලබයි. එනම්, වෙළඳුන්ගෙන් 30%ක් ශත 60ක් හෝ ඊට වැඩි මුදල් ප්‍රමාණයක් වී කිලෝ ග්‍රෑම් එකක් සඳහා (ගුණාත්මක තත්ත්වය අනුව) අඩු කරනු ලබයි. වෙළඳුන්ගෙන් 26%ක් අඩු ගුණාත්මක තත්ත්වය නිසා වී කිලෝ ග්‍රෑමයකට ශත 50-60 ක් අතර ප්‍රමාණයකින් මිල අඩු කරයි. මෙලෙස අඩු ගුණාත්මකභාවයකින් යුක්ත වී තොග අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ සුළු පරිමාණ ගොවීන් වන අතර මහා පරිමාණ වී නිෂ්පාදකයින් ඉහළ ගුණාත්මකභාවයකින් යුතුව වී තොග අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබයි. මෙයට අමතරව නගරයෙන් වන දුරස්ථභාවය (physical distance) සහ යටිතල පහසුකම්වල තත්ත්වය (මහා මාර්ග) මතද වෙළඳුන් විසින් වී මිල අඩු කරනු ලබයි. එනම්, 2002/2003 මහ හා 2003 යල කන්නයේදී මනම්පිටිය සහ මැදිරිගිරිය ප්‍රදේශවල වී කිලෝ ග්‍රෑම් එකක් රු.10-12ක් අතර මිලකට අලෙවිකර තිබූ අතර, හිඟුරක්ගොඩ සහ සේවාගම ප්‍රදේශවල වී කිලෝ ග්‍රෑම් එකක් රු.12-14 මිලකට අලෙවිකර තිබුණි.

සමස්ත ගොවීන්ගෙන් 9%ක් වී කිලෝග්‍රෑම් 1000 කට අඩු ප්‍රමාණයක් කිලෝ ග්‍රෑමය රු.10.39ක් වැනි සාපේක්ෂව අඩු මිලකටද, ගොවීන්ගෙන් 70% කිලෝග්‍රෑම් 1000-5000ක් අතර ප්‍රමාණයක් කිලෝ ග්‍රෑමය රු.11.72ක් වැනි මධ්‍යස්ථ මිලකට ද ගොවීන්ගෙන් 21%ක් වී කිලෝග්‍රෑම් 5000 – 20000 අතර ප්‍රමාණයක් කිලෝ ග්‍රෑමය රු.12.70ක් වැනි සාපේක්ෂව ඉහළ මිලකට ද අලෙවි කරයි. එනම් සමස්ත ගොවීන්ගෙන් ඉතා සුළු ප්‍රතිශතයක් සුළු වී ප්‍රමාණයක සඳහා ඉහළ හෝ පහළ මිලක් ද ලබා ගන්නා අතර ගොවීන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වැඩි වී ප්‍රමාණයක සඳහා සාපේක්ෂව මධ්‍යස්ථ මිලක් ලබා ගනී. වී කිලෝග්‍රෑම් 10000-15000 අතර ප්‍රමාණයක නිෂ්පාදනය කරන ගොවීන්ගේ ප්‍රතිශතය 10%ක් වන අතර ඔවුන් වී කිලෝ ග්‍රෑමයක් සඳහා සාපේක්ෂ ඉහළ මිලක් ලබා ගනී. නමුත් වී කිලෝ ග්‍රෑම් 2500-7500ක අතර නිෂ්පාදනය කරන 60% ක ගොවීන් ප්‍රමාණය සඳහා ලැබෙන්නේ සාපේක්ෂව අඩු මිලකි.

වගා කරන වගා බිම් ප්‍රමාණය අනුව සලකා බැලීමේදීද අක්කර 2-6ත් අතර වගා කරන ගොවීන් ප්‍රමාණය 90%ක් වන අතර, ඔවුන්ට වී කිලෝවක් විකුණා ලබා ගතහැකි වන්නේ, සාපේක්ෂව පහළ මිලක් වන අතර අක්කර දහයට වැඩියෙන් වගා කරන ගොවීන් සාපේක්ෂව වී කිලෝවක් සඳහා ඉහල මිලක් ලබාගනී.

ගොවීන් වගා කිරීම සඳහා වී වර්ග තෝරා ගනු ලබන්නේ, පෙර කන්නයේ පැවති වී මිල ගණන් සැලකිල්ලට ගැනීමෙන් හෝ සහල් වෙළඳපළ මිල ගණන් කෙරෙහි සැලකිල්ලක් දැක්වීමෙන් හෝ නොවේ. එසේ වුවද වර්ෂයක් තුළ වී මිල ගණන්වල කාලීන මිල වෙනස්වීම් පිළිබඳ ගොවීන්ට අවබෝධයක් පවතී.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල ප්‍රවණතාවන් සලකා බැලීමේදී නාමික වී මිල ගණන්වල ඉහළ උපනතියක් පෙන්නුම් කරයි. නමුත් මූර්ත මිල ගණන්වල ඇත්තේ පහළ යාමකි. එබැවින් එය ගොවීන්ගේ මූර්ත ආදායම් පහළ යාමට හේතු වේ. වී මිල ගණන්වල කාලීන මිල වෙනස්වීම් සලකා බැලීමේදී මහ කන්නයේ නිෂ්පාදන වෙළඳපළට නිකුත් වන මාර්තු සිට අගෝස්තු දක්වා වූ කාල පරිච්ඡේදය තුළ වී මිල ගණන් පහළ මට්ටමක පවතී. මෙහිදී වී මිල ගණන් පහළ යාම කෙරෙහි වැඩි බලපෑමක් කරන්නේ මහ කන්නයේ වී නිෂ්පාදනයයි. එනම් මහ කන්නය තුළදී යල කන්නයට සාපේක්ෂව ඉහළ වී නිෂ්පාදනයක් වෙළඳපළට නිකුත් වේ. එබැවින් මහ කන්නයේ වී නිෂ්පාදන වෙළඳපළ වෙත ඉදිරිපත් වී අවසන් වන කාල පරිච්ඡේදය එනම්, යල කන්නයේ වගා කටයුතු ආරම්භ කරන කාල පරිච්ඡේදය වන නොවැම්බර් – ජනවාරි යන මාස ඉහළම වී මිල ගණන් වාර්තා වන කාල පරිච්ඡේදය වේ.

සමස්ත අලෙවි ක්‍රියාවලිය තුළ (ගොවීන්ගේ, අතරමැදියන්ගේ, වී මෝල්හිමියන්) වී මිල ගණන් සඳහා බලපාන ප්‍රධාන සාධක කිහිපයකි. ඒ අතර ගොවීන්ගේ වී මිල ගණන් වෙනස්වීම සඳහා ඇසුරුම් සම්බන්ධයෙන් ඇති ගැටළු (ඇසුරුම්වල මිල වැඩිවීම සහ ඇසුරුම් ඉක්මණින් විනාශවීම), ප්‍රවාහනය සම්බන්ධයෙන් ඇති ගැටළු (ඉහල ප්‍රවාහන පිරිවැය හා මාර්ග පහසුකම් හිඟවීම), වී ගබඩා නොකිරීම (මුදල් අවශ්‍යතා මත ඉක්මණින් අලෙවි කිරීමට සිදුවීම, කම්කරු වැටුප් ගෙවීමට තිබීම සහ ගබඩා පහසුකම් නොවීම ආදී හේතු මත) වී අලෙවි කරන ස්ථානවල ස්වරූපය

(කමත, ගොවි නිවස, වෙළඳ මධ්‍යස්ථානය හා වී මෝල), වීවල ගුණාත්මක තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපෑම් කරනු ලබයි. මෙම ගැටළුවල බලපෑම වැඩිවීමේ ප්‍රමාණය මත වී මිල ගණන් පහළ යාම සිදු වේ.

වී මිලදී ගැනීමේ නිරත එකතුකරන්නන්ගේ වී මිල ගණන් සඳහා බලපාන සාධක කිහිපයකි. වී මිලදී ගන්නා විසින් මිල තීරණය කිරීම, වීවල ගුණාත්මකභාවය, මිලදී ගනු ලබන කාලය හා ස්ථානය, වී අලෙවි කරනු ලබන ස්ථානයේ ස්වරූපය, වී මිලදී ගනු ලබන සහ අලෙවිය සිදුවන ප්‍රදේශ අනුව මිල ගණන් වෙනස් වීම සිදුවේ. එමෙන්ම මිලදී ගන්නා විසින් ගොවීන්ට ණය සපයා තිබීම වී මිල පහළ යාමට හේතුවන අතර ඇසුරුම් මාධ්‍යය, ඇසුරුම් කිරීම, වේලීම, ගබඩා කිරීම යන සියළු කාර්යයන්ගේ බලපෑම මත වී මිල ගණන් උච්චාවචනය වේ. වී මිලදී ගන්නා ස්ථානය, වී මිලදී ගනු ලබන කාල පරිච්ඡේදය, වී මිලදී ගන්නා ප්‍රදේශ (ගම අවට, ගමින් දුරස්ථ) වී මෝල් හිමියන්ගේ වී මිල ගණන් උච්චාවචනය වීම සඳහා බලපාන සාධක වේ.

සමස්තයක් වශයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහල් සැකසීමේ කටයුතු තවමත් වඩා හොඳින් සංවර්ධනය වී නොමැත. ඉහළ තාක්ෂණය උපයෝගී කරගනිමින් සහල් නිෂ්පාදන කටයුතු සිදුකරන්නේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ වී මෝල්හිමියන්ගෙන් 1% ක් පමණි. අනෙකුත් වී මෝල් සතුව ඉහළ තාක්ෂණය නොමැති අතර ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය වත්කමක් නොවීම ගැටළුවක් ලෙස පවතී. ඉහළ තාක්ෂණය යොදා ගනු ලබන වී මෝල් සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් මහා පරිමාණ ණය ලබා ගැනීමට කටයුතු කර ඇත.

කැකුළු සහල් කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව තැම්බූ සහල් කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පවතින අතර, තැම්බූ සහල් වෙළඳපළ සඳහා ඉදිරිපත් කිරීමේ සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයක් සඳහා රු. 25.00 කි. මහා පරිමාන වී මෝල්හිමියන් විසින් සහල් තොග ප්‍රධාන වශයෙන් බෙදා හරිනු ලබන්නේ දිස්ත්‍රික්කයෙන් බැහැර ප්‍රදේශවලට වන අතර සුළු පරිමාණ වී මෝල්හිමියන් සහල් තොග ප්‍රධාන වශයෙන් බෙදාහරින්නේ තම ගම තුළ හෝ අවට ප්‍රදේශයට ය.

2002/2003 මහ සහ 2003 යල කන්නයන්ට අදාළව සහල් නිෂ්පාදනය කර වෙළෙඳපොළ දක්වා ඉදිරිපත් කිරීමේ මුළු පිරිවැය සහල් කිලෝ ග්‍රෑමයක් සඳහා රු.25.24ක් වූ අතර පිටකොටුව සහල් තොග වෙළෙඳපොළේ සහල් කිලෝවක උපරිම තොග මිල රුපියල් 35.00ක් විය. ඒ අනුව සහල් කිලෝ ග්‍රෑමයකින් රු.10.00ට ආසන්න ලාභ ප්‍රමාණයක් තොග වෙළෙන්දා සහ වී මෝල් හිමියා අතර පවතී. මෙහිදී සහල් වෙළෙඳපොළ තුළ තොග වෙළෙන්දන් යනු කොමිස් වෙළෙන්දන් වන බැවින් ඔවුන් සහල් අලෙවියෙන් ලබා ගන්නේ 4%ක කොමිස් මුදලකි. ඒ අනුව කිලෝ ග්‍රෑම් 65 සහල් මල්ලක තොග මිල රු.2275ක් වන විට එහි නිෂ්පාදන වියදම රු. 1640.60කි. එහි ලාභ ප්‍රමාණය රු. 634.40කි. රු.2275 මිල යටතේ 4% කොමිස් මුදල ලෙස තොග වෙළෙන්දාට ලැබෙන්නේ රු.91.00ක මුදලක් වන බැවින් ඉතිරි රු.543.40ක මුදල වී මෝලේ සිට වෙළෙඳපොළ දක්වා වී රැගෙන ඒමේ ක්‍රියාවලිය තුළ රැඳී පවතී. එනම් එක් සහල් කිලෝවකින් රු.8.36ක මුදලක් ලාභය වශයෙන් මෙම ක්‍රියාවලිය තුළ රැඳී පවතී.

## 5.2 නිර්දේශ

වර්තමානයේ දී අලෙවිකරණ ක්‍රියාවලිය වඩා තරගකාරී වන බැවින්, තරගකාරීත්වයේ සාර්ථකත්වය මත වී අලෙවියේ අනාගතය රැඳී පවතී. ගොවීන් නිෂ්පාදනාභිමුඛ (Product oriented) වන අතර වෙළෙඳුන් විකුණුම් මූලික (Sales oriented) වේ. ඒ සඳහා මෙම ක්‍රියාවලිය තුළ නූතන ව්‍යාපාරික තාක්ෂණය (Modern business techniques) යොදා ගැනීම් සිදු විය යුතුය. එනම්, පාරිභෝගික අවශ්‍යතා සහ උවමනා, ලාභය තුළින් තෘප්ත කරගැනීමට කටයුතු කිරීම, භාණ්ඩ විවිධාංගීකරණය ආදිය පිළිබඳව සැලකිලිමත් වීම් ආදිය සිදුවිය යුතුය. එම නිසා,

01. නවීන වෙළඳ උපාය මාර්ග යොදා ගැනීම සඳහා ගොවිපළ මට්ටමින් ගොවීන් සංවිධානය කිරීම, ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය හා භාණ්ඩ වැඩි දියුණු කිරීමේ කාර්යයන් (Product promotion activities) කළ හැකි වේ. වී සමජාතිය නිෂ්පාදනයක් ලෙස නම් කෙරුණත් නවීන වෙළඳ උපාය මාර්ග තුළ එයද විවිධාංගීකරණය සහ වැඩි දියුණු කිරීම් ඔස්සේ සැපයිය හැකි අතර ඒ තුළින් අලෙවි ක්‍රියාවලිය තුළ පවතින

තරඟකාරිත්වයට මුහුණ දිය හැකිය. එනම්. වර්තමානයේ සම්බා. නාඩු (සුදු). නාඩු (රතු). ලෙස වී ප්‍රභේදයන්ගෙන් යුක්තව වෙළඳපළට ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර මෙම තත්ත්වය තවදුරටත් වැඩි දියුණු කර වෙළඳපළට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම කළ යුතු වේ. නිෂ්පාදන ද්‍රව්‍ය විවිධාංගිකරණය නැමති කාර්යය සඳහා පාරිභෝගික හා වෙළඳ උවමනාවන්ට ගැළපෙන අයුරින් සුවඳැල්. කළු හීනටි. රත්හැල්. සුදු හීනටි ආදී පැරණි වී වර්ග භාවිතය වැඩි දියුණු කිරීමෙන් ඉහළ මිලක් ලබා ගැනීමට හැකි වේ.

02. වර්තමානයේ වී ගොවිතැන සලකා බැලීමේ දී ගොවීන් වෙළඳපළ තුළ කටයුතු කරන්නේ තනි පුද්ගලයන් වශයෙනි. එබැවින් ඔවුන්ට වී අලෙවිකරණ ක්‍රියාදාමය තුළ තම ආරක්ෂණය තහවුරු වන අයුරින් කටයුතු කිරීමේ හැකියාවක් නැත. එම නිසා භාණ්ඩ විවිධාංගිකරණය සහ වැඩි දියුණු කිරීම් ඇතුළත් නවීන වෙළඳ උපාය මාර්ග සඳහා ගොවීන් ගොවිපළ මට්ටමින් සංවිධානය කිරීම කළ යුතුය. ගොවීන් විසින් වී අලෙවි කිරීමේ තත්ත්වයෙන් ඔබ්බට ගොස් ගොවි සංවිධාන මට්ටමින් හෝ ගොවිපල මට්ටමින් සංවිධානය කර වී සහල් බවට පත්කර බෙදා හැරීමේ ක්‍රියාවලියක් තුළින් ගොවියාට සාධාරණ මිලක් ලබා ගැනීමටත්. පාරිභෝගිකයාට සාධාරණ මිලකට සහල් ලබා ගැනීමටත් හැකියාව ලබාදිය හැක. මෙහිදී කුඩා පරිමාණ වී මෝල් හෝ රාජ්‍ය අංශයේ දැනට ක්‍රියාත්මක නොකෙරෙන වී මෝල් ප්‍රයෝජනයට ගත හැක. මෙවැනි ක්‍රියාමාර්ගයක් තුළින් ප්‍රවාහන පිරිවැය අවම කර ගැනීමේ හැකියාවක් ද ලැබෙනු ඇත.

03. ගබඩා කිරීම් සහ සැකසීම් යන අලෙවිකරණ කාර්යයන් සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම අවශ්‍ය වේ. එනම් ගොවීන්ගේ වී මිල ගණන් පහළ යාම සඳහා ප්‍රධාන ලෙස දායක වන හේතු සාධකයක් ලෙස භෞතික භාණ්ඩ බෙදා හැරීමේ කාර්යය හඳුන්වාදිය හැකි අතර, ඒ සඳහා රජය මැදිහත් විය යුතුය. එනම් ගොවීන්ගෙන් 29%ක් වී ගබඩා කරනු ලබන අතර වී ගබඩා කිරීම් සම්බන්ධයෙන් වී ගබඩා ඇත්තේ 12%ක ප්‍රමාණයකටය. ඒ අනුව ගොවීන් 71%ක් ප්‍රමාණයක් වී ගබඩා නොකරන බැවින් වී ගබඩා කිරීම වර්ධනය කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම යටතේ වී ගබඩා ස්ථාපනය කළ යුතුය. එසේ නොමැතිනම් අඩු මූල්‍ය පිරිවැයක් යටතේ වී ගබඩා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ මූල්‍ය සම්පත් ගොවීන්ට ලබා දීමට රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනවල සහාය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

එසේම රජය මගින් ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් (විශේෂයෙන්ම නගරයෙන් දුරස්ථව පිහිටි ස්ථානවල) වී අස්වනු නෙළන සමය ආරම්භයේදීම වී මිලදී ගැනීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. මෙම මධ්‍යස්ථාන ගොවි ජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් සංවිධානය වූ සක්‍රීය ජාලයක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම තුළින් නගරයෙන් දුරස්ථව අඩු පහසුකම් යටතේ පවතින ප්‍රදේශවල ගොවීන්ට පවා වී සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමේ හැකියාව උදාවේ.

04. වී මිල ගණන් පහළ යාම සඳහා ගොවීන් ණය ලබා ගෙන තිබීම යන කාරණය ද ප්‍රබල ලෙස බලපා ඇත. ගොවීන්ගෙන් 83%ක් ණය ලබා ගන්නා අතර ඉන් 45%ක් පමණ නොවිධිමත් අංශය තුළින් ණය ලබා ගැනීමට කටයුතු කර ඇත. දැනට ගොවි ජන බැංකු මගින් ගොවීන් සඳහා ණය ලබා දුන්න ද විශාල ඉඩම් ප්‍රමාණයක් වගා කරන ගොවීන්ට එම මුදල් ප්‍රමාණවත් නොවේ. එමෙන්ම ගොවි ජන බැංකු මගින් ලබා දෙන ණය මුදල්මය ණය වශයෙන් නොව කෘෂි යෙදවුම් වශයෙන් ලබා දෙන අතර එම ද්‍රව්‍ය නිසි වේලාවට නොලැබීම මේ සම්බන්ධව ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. එබැවින් රාජ්‍ය අංශය තුළින් ගොවීන්ට ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හා සලකා බලනු ලබන කොන්දේසි ලිහිල් කිරීම. එමෙන්ම වගා කටයුතු ආරම්භ කිරීමත් සමගම රාජ්‍ය අංශයේ බැංකු තුළින් ණය ලබාදීම සිදු කළ යුතුය. ණය ලබා ගන්නා ගොවීන්ගෙන් 57%කගේ ණය ලබා ගැනීමේ මූලික අරමුණ වන්නේ කෘෂි රසායනික /පොහොර මිලදී ගැනීම වන හෙයින් ගොවිජන බැංකු හරහා ණය ලබා දීමේදී කෘෂි යෙදවුම් ප්‍රමාදයක් හෝ හිඟතාවකින් තොරව සැපයීමට කටයුතු කළ යුතුය.

05. වී මිල ගණන් පහළ යාම සඳහා අඩු ගුණාත්මක තත්ත්වය ප්‍රබල හේතුවක් වන බැවින්. එවැනි වී නිෂ්පාදනය කරන ප්‍රදේශවල ගොවීන් දැනුවත් කිරීම රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් සිදු කළ යුතුය. එමෙන්ම

අස්වනු සකස් කිරීම සඳහා අවශ්‍ය පඬංගු ගොවි සංවිධාන මට්ටමෙන් හෝ ලබාදීමේ කටයුතු සිදු කළ යුතුය. මෙයට අමතරව එගොඩපත්තුව වැනි වීවල කළු පුල්ලි රෝගය වැළදෙන ප්‍රදේශවලට යෝග්‍ය වී වර්ග හඳුන්වාදීමත්, ඒවා ගොවීන් අතර ප්‍රචලිත කිරීමත් සිදු කළ යුතුය.

06. වී ඇසුරුම් සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීමත්, උපරිම වශයෙන් කන්න දෙකකට වඩා ඇසුරුම් මලු පාවිච්චි කිරීමට නොහැකිවීමත් ගොවීන් මුහුණ දෙන ප්‍රබල ගැටළුවක් වන හෙයින් පරිසර හිතකාමී විකල්ප ඇසුරුම් මලු නිෂ්පාදනය සහ වෙළඳපොළට නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2002), සංඛ්‍යාන නිබන්ධන - 2002, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ.

02. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2003), සංඛ්‍යාන නිබන්ධන - 2003, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ.

03. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2004), සංඛ්‍යාන නිබන්ධන - 2004, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ.

04. **Bogahawatta, C (1985), Impact of Government Marketing Policies on the changes in paddy Marketing System, University of Peradeniya.**

05. **Department of Agrarian Services (2000), Data Book for Village Irrigation Schemes of Sri Lanka – Polonnaruwa District, Water Management Division, Department of Agrarian Services, Colombo 07.**

06. **Somarathne, W.G. (1987), Some Aspect of Paddy / Rice Marketing in Sri Lanka, M.Sc. thesis.**

07. **Weherahewa, J and et al (2002), "Future of Paddy Farming in Sri Lanka; Comparative advantage, Scale and Rural economy" Sri Lanka Economic Journal, Vol. 3, No 2.**

08. **Yoshimura, H, Perera, M. P & Gunawardena, P.J. (1975), Some Aspect of Paddy & Rice Marketing in Sri Lanka; based on a study in four selected districts, HARTI, Colombo.**

ඇමුණුම් අංක 01

## ප්‍රධාන වී මෝල් / වී මෝල්හිමියන්

| | | |
|---|---|---|
| 01 | නිපුන සහල් මෝල | මින්නේරිය |
| 02 | ඩොනල්ඩ් මහතා | නිරංගා හාල්මෝල, මැදිරිගිරිය, පොළොන්නරුව |
| 03 | නවනි සහල් මෝල | පොළොන්නරුව |
| 04 | සෝමපාල සහල් මෝල | කුසුම් පොකුණ |
| 05 | ජයබිම සහල් මෝල | දියසෙන්පුර |
| 06 | දංකොටුව සහල් මෝල | පිංපාර |
| 07 | ගුණේ මහතා | ගල් අමුණ |
| 08 | යසපාල සහල් මෝල | පිංපාර |
| 09 | නිලං සහල් මෝල | බටුකොටුව |
| 10 | සකුරා සහල් මෝල | යුදගනාව |
| 11 | නිර්මලී සහල් මෝල | කවුඩුල්ල |
| 12 | සෙනෙවිරත්න සහල් මෝල | කවුඩුල්ල |
| 13 | ආරියදාස සහල් මෝල | පිංපාර |
| 14 | අබේකෝන් සහල් මෝල | කුසුම් පොකුණ |
| 15 | අරලිය සහල් මෝල | මින්නේරිය |
| 16 | මියුරු සහල් මෝල | අරලගංවිල |
| 17 | රත්න සහල් මෝල | පුලස්තිගම. |
| 18 | අයෝමි සහල් මෝල | අරලගංවිල |
| 19 | හාලික් සහල් මෝල | ජයන්තිපුර |
| 20 | අශෝකා සහල් මෝල | ගල්අමුණ |
| 21 | දංගොල්ල සහල් මෝල | ගල්අමුණ |
| 22 | පරාක්‍රම සහල් මෝල | මින්නේරිය |
| 23 | මහවැලි සහල් මෝල | මින්නේරිය |
| 24 | කෙන්නෙවි සහල් මෝල | බැදිවැව |
| 25 | නැඟනල් සහල් මෝල | බැදිවැව |
| 26 | උපාලි සහල් මෝල | බැදිවැව |
| 27 | ගුණරත්න සහල් මෝල | B.O.P 317 |
| 28 | සොහොයුරෝ සහල් මෝල | වීරපුර , තඹාල. |
| 29 | සූර්‍යා සහල් මෝල | කදුරුවෙල |
| 30 | සඳමාලි සහල් මෝල | පොළොන්නරුව |
| 31 | R.N.R සහල් මෝල | කදුරුවෙල |
| 32 | ජෙමී සම්බා සහල්මෝල | කදුරුවෙල |
| 33 | පාලිත සහල් මෝල | වීරපුර |
| 34 | රේන්කෝ සහල් මෝල | ගල්අමුණ |
| 35 | මුතුමිණි සහල් මෝල | ජයන්තිපුර |
| 36 | දොඩම්පහ සහල් මෝල | ජයන්තිපුර |

ඇමුණුම් අංක 02

## අධ්‍යයනයට ලක්කළ වී මෝල්/වී මෝල්හිමියන්ගේ ලිපින

| | | | |
|---|---|---|---|
| 01. | මියුරු හාල්මෝල | ප්‍රියනන්ද මයා, 5 කණුව, අරලගංවිල | 0722-537644 |
| 02. | චන්දිම හාල්මෝල | නවනගරය, මැදිරිගිරිය | 027-2248019 |
| 03. | සමීර හාල්මෝල | එස්.ඒ. කුලවර්ධන මයා, 22, ජයන්තිපුර | |
| 04 | සමන් හාල්මෝල | ස්මයිල් මයා, අංක 21,මුස්ලිම් කොළණිය, කදුරුවෙල | |
| 05. | ජනක හාල්මෝල | ඩී.එම්. හීන්බණ්ඩා මයා, ජයන්තිපුර | 077-2222170 |
| 06. | ශාන්ත හාල්මෝල | එස්. ගාමිණී සමරවික්‍රම මයා, වැවේතැන්න, සේවාගම | |
| 07. | වීරරත්න හාල්මෝල | මොහොමඩ් රිස්‍යා මයා, මින්නේරිය | |
| 08. | ඉන්දික හාල්මෝල | කේ.පී. මුදියන්සේ මයා, යාය 05, අරලගංවිල | 0788-751543 |
| 09. | සිරිසර හාල්මෝල | කේ.ඩී. චන්දන ගුණරත්න මයා, B.O.P 316, ලංකාපුර | 0788-750871 |
| 10. | නවීන් හාල්මෝල | යසපාල මයා, පිංපාර, හිඟුරක්ගොඩ | 027-2277276 |
| 11. | එස්.ආර්.එම්. හාල්මෝල | එම්.ඩබ්. අබේරත්න මයා,අංක 06, පිංපාර, යටියල්පතාන, හිඟුරක්ගොඩ | 027-2246171 |
| 12. | සචිනි හාල්මෝල | එම්.ඩබ්. සැම් රාජපක්ෂ මයා, 48/1, පිංපාර, කවුඩුල්ල | |
| 13. | මදීනා හාල්මෝල | ඒ.එල්.එම්. සම්සුදීන් මයා, පන්සලපාර, කදුරුවෙල | 027-2222540<br>2223350 |
| 14. | රහුමාන්‍යා හාල්මෝල | කේ.එම්. අන්වර්/කේ.එම්.රාලියා, රහුමාන්‍යා පාර, මුස්ලිම් කොළණිය, කදුරුවෙල | 027-2222092 |
| 15. | සුලෙයිමාන් හාල්මෝල | සුලෙයිමාන් මයා, අංක 24, මුස්ලිම් කොළණිය, කදුරුවෙල | 027-2222655 |
| 16. | නිව් මුස්ලිම් හාල්මෝල | නූරි මොහොමඩ් මයා, කෙලින්වීදිය, කදුරුවෙල | 027-2222323 |
| 17. | මසූම් හාල්මෝල | ආර්.එම්. රෂීක් මයා, 19, මුස්ලිම් කොළණිය, කදුරුවෙල | |
| 18. | අශෝකා හාල්මෝල | එච්.පී. කරුණාසේන මයා, අංක 65, පන්සල් ගොඩැල්ල,සන්සුන්ගම | 027-2242329 |
| 19. | තමන්කඩුව රයිස්මිල් | එම්.ටී.එස්. මොහොමඩ් මයා, 28 කණුව,පොළොන්නරුව | |
| 20. | උදය හාල්මෝල | පස්මි මයා, පොළොන්නරුව | |
| 21. | ජයසේකර හාල්මෝල | වයි.බී. ජයසේකර. සී 51, සන්සුන්ගම, වවුඩුල්ල | 027-2246421 |
| 22. | දංගොල්ල හාල්මෝල | ප්‍රියන්ත බණ්ඩාර මයා, කිරිමැටිය, ගල්අමුණ | |
| 23. | චන්ද්‍රසිරි හාල්මෝල | පී.ආර්. චන්ද්‍රසිරි මයා, ජයන්තිපුර | 027-2246081 |
| 24. | රන්දික හාල්මෝල | ඩී.යූ.එස්. කුමාරසිංහ මයා, 842, ට්‍රැක් 08, දිවුලන්කඩවල, මැදිරිගිරිය | 0722-536512 |
| 25 | රේණුකා හාල්මෝල | එල්.බී. වසන්ත මයා, සන්සුන්ගම, ගල්අමුණ | |
| 26 | ධම්මික හාල්මෝල | ධම්මික මයා, 266, කුසුම් පොකුණ, දිවුලන්කඩවල, මැදිරිගිරිය | 027-2248435 |
| 27. | බෙලිඅත්ත හාල්මෝල | සුනිල් ඩී. සිල්වා මයා, මින්නේරිය | |
| 28 | නුගසෙවණ හාල්මෝල | පී.කේ.සී. සරත්කුමාර මයා, 114, පුලස්තිගම | |
| 29 | ජයසුන්දර හාල්මෝල | ජේ.එම්. පාලිත ජයසුන්දර මයා, 46, වීරපුර, තඹාල | 027-2242153 |
| 30. | තිලින හාල්මෝල | ජේ.ඒ. තිලකරත්න මයා, 585, වඩිච්චලය, කදුරුවෙල | 027-2222107 |
| 31. | ෆාරිස් හාල්මෝල | එම්.එම්. අසීස් මයා, මුස්ලිම් කොළණිය. කදුරුවෙල | 027-2222107 |
| 32. | ලක්මිණි හාල්මෝල | ඩී.එම්. මහින්දරත්න මයා, අරලගංවිල | 027-2223207 |
| 33. | සොහොයුරෝ හාල්මෝල | එච්.පී. නන්දසේන මයා, 1/156, වීරපුර, තඹාල | |
| 34. | ජෙම් හාල්මෝල | එම්.ඒ.එම්. මරුෂු මයා, එම්.සී. වීදිය, කදුරුවෙල | 027-2223591 |
| 35. | විනස් හාල්මෝල | මොහොමඩ් පිලිප් මයා, 25 කණුව, පොළොන්නරුව | |
| 36. | ලීලා හාල්මෝල | එච්.එම්. ෆයිසාල් මයා. අංක 07, මුස්ලිම් කොළණිය, කදුරුවෙල. | 027-2223590 |
| 37. | සිහාරා හාල්මෝල | එච්.එම්. අසීස් මයා. අංක 05, කදුරුවෙල | 027-2222049<br>027-2222349 |
| 38. | පරාක්‍රම හාල්මෝල | වහාබ් මයා, මින්නේරිය. | 027-2246035 |